# සන්නිවේදන

## සමයුරු ප්‍රතිනිරීක්ෂණ ශාස්ත්‍රීය සංග්‍රහය

පළමු වෙළුම | පළමු ප්‍රකාශනය | 2024 ජුලි

ජනසන්නිවේදන අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# සන්නිවේදන

## සමයුරු ප්‍රතිනිරීක්ෂණ ශාස්ත්‍රීය සංග්‍රහය

පළමු වෙළුම | පළමු ප්‍රකාශනය | 2024 ජූලි

ජනසන්නිවේදන අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# "සන්නිවේදන" සමයුරු ප්‍රතිනිරීක්ෂණ ශාස්ත්‍රීය සංග්‍රහය

**ප්‍රකාශනය** : ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**මුද්‍රණය** : පළමු වෙළුම, පළමු කාණ්ඩය - 2024 ජූලි

ISSN 3084-8253 (විද්‍යුත්)

ISSN 3084-8245 (මුද්‍රිත)

**මුද්‍රණය :** විද්‍යාලංකාර මුද්‍රණාලය, කැලණිය

**කවර නිර්මාණය හා පිටු සැකසුම :**

සහකාර කථිකාචාර්ය දිමුතු ජිනසේන

සන්නිවේදන ශාස්ත්‍රීය සංග්‍රහය තුළ පළ කෙරෙන සියලුම ශාස්ත්‍රීය ලිපිවල පූර්ණ වගකීම අදාළ කර්තෘවරු සතුවන අතර ශාස්ත්‍රීය සංග්‍රහයෙහි සංස්කාරකවරුන් එම ලිපි තුළ අන්තර්ගත කරුණු සහ දෝෂ පිළිබඳ කිසිදු වගකීමක් නොදරයි.

**ප්‍රකාශන අයිතිය සහ ඡායා පිටපත්කරණය**

© සියලුම හිමිකම් ඇවිරිණි.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ ඇතුළත් කිසිදු කොටසක් ප්‍රකාශකයාගේ ලිඛිත අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීම, ගබඩා කිරීම හෝ ඡායා පිටපත්කරණය නොකළ යුතුය.

**සබැඳිය -**
*https://ss.kln.ac.lk/depts/maco/index.php/students/blog/journal/sannivedana*

## සංස්කාරක සටහන

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ''**සන්නිවේදන**'' සමයුරු ප්‍රතිනිරීක්ෂණ ශාස්ත්‍රීය සංග්‍රහය ජනසන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ලිපි ඇතුළත් ශාස්ත්‍රීය සංග්‍රහයකි. සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට අදාළව සිදුකෙරෙන ශාස්ත්‍රීය පර්යේෂණවල නව දැනුම පිළිගත් ක්‍රමවේදයක් ඔස්සේ සමාජගත කිරීම අරමුණු කර ගනිමින් ද්වි-වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන ශාස්ත්‍රීය සංග්‍රහයකි. සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන විෂය ක්ෂේත්‍රය තුළ පර්යේෂණ කාර්යයන්හි නිරතව සිටින සියලුම දෙනා වෙනුවෙන් මෙම ශාස්ත්‍රීය සංග්‍රහය විවෘතව පවතින බව සතුටින් දැනුම් දෙමු.

''**සන්නිවේදන**'' ශාස්ත්‍රීය සංග්‍රහයේ පළමු කලාපය සඳහා ශාස්ත්‍රීය ලිපි සැපයූ සියලු පර්යේෂකයන්ට මෙන්ම එම ලිපි ද්විත්ව සමයුරු ප්‍රතිනිරීක්ෂණයට ලක් කළ විද්වත් මණ්ඩලයට හා ප්‍රකාශනය එළිදැක්වීමේ දී සහයෝගය දුන් සියලු දෙනාටම හද පිරි ස්තුතිය පුදකර සිටිමු.

සංස්කාරක මණ්ඩලය

2024 ජුලි

## "සන්නිවේදන"

### ප්‍රධාන සංස්කාරක

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්මික බණ්ඩාර හේරත්
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

### සහය සංස්කාරකවරු

කථිකාචාර්ය දිලිනි ගමගේ
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

කථිකාචාර්ය අයේශ් විජයසිංහ
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

### සංස්කරණ සහාය

සහකාර කථිකාචාර්ය නිසංසලා අබේගුණසේකර
සහකාර කථිකාචාර්ය හංසනී ජයවික්‍රම
සහකාර කථිකාචාර්ය මහේෂා පියුමාලි

## සන්නිවේදන ශාස්ත්‍රීය සංග්‍රහයේ සමයුරු විමර්ශකවරු

සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සම්මානිත මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සම්මානිත මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

සම්මානිත මහාචාර්ය ආරියරත්න ඇතුගල
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය මාපා තිලකරත්න
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය අජන්තා හපුආරච්චි
ජනමාධ්‍ය ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජයානන්ද රූපසිංහ
අංශ ප්‍රධාන, ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය අරුණ ලොකුලියන
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මනෝජ් ජිනදාස
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

ආචාර්ය නාමලි සුරවීර
වික්ටෝරියා විශ්වවිද්‍යාලය, වෙලින්ටන්, නවසීලන්තය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සෙනේෂ් දිසානායක බණ්ඩාර
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයන අංශය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අතුල සමරකෝන්
ලලිත කලා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක
දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන්තිකා ප්‍රියදර්ශනී
ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**පර්යේෂක වගතුග**

ආචාර්ය අමිලා දමයන්ති

BA, MA (Kelaniya), PhD. (DHPS, India)

කථිකාචාර්ය, ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයන අංශය,

නර්තන හා නාට්‍ය කලා පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

ආචාර්ය කුමේෂ් ප්‍රභාෂිණී ගමගේ

BA (Colombo), MSSc. (Kelaniya), PhD. (Wuhan, China)

කථිකාචාර්ය, ජනමාධ්‍ය අධ්‍යයන අංශය, ශ්‍රී පාලි මණ්ඩපය,

කොළඹ විශ්වවිද්‍යාලය

එච්. එම්. ඩී. මලින්ද

BA, MA (Colombo), MSSc. (Kelaniya)

ප්‍රකාශන නිලධාරි, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා

මණ්ඩලය

ආචාර්ය විමල්සිරි මුණසිංහ

BA, MA (Kelaniya), M.Phil., PhD. (UVPA)

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, නර්තන හා නාට්‍ය කලා පීඨය,

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

BA (Ceylon), M.Phil., PhD. (London)

ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## පටුන

**1. හින්දු ධාර්මික ඉගැන්වීම් සන්නිවේදනයෙහි ලා රාම්ලීලා ජන නාටකයේ ශක්‍යතාව _______________ 1 - 26**

ආචාර්ය අමිලා දමයන්ති

**2. ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ඩිජිටල් කියවීමේ හැසිරීම : ජ්‍යෙෂ්ඨ ද්විතීය පාසල් සිසුන්ට විශේෂිතව _______________ 27 - 45**

ආචාර්ය කුමේෂ් ප්‍රභාෂිණී ගමගේ

**3. ශ්‍රී ලාංකේය පුවත්පත් කර්මාන්තය තුළ "දත්ත ජනමාධ්‍යවේදය" භාවිතයේ ගැටලු _______________ 46 - 65**

එච්. එම්. ඩී. මලින්ද

**4. ජනශ්‍රැතියෙන් ප්‍රභාවත් වූ නිර්මාණාත්මක සන්නිවේදන ශික්ෂානන්දය _______________ 66 - 88**

(උලලේනා කේන්ද්‍රීය නිමිති, ජනකවි හා ඒ ආශ්‍රිත ගීත නිර්මාණ ඇසුරෙන්)

ආචාර්ය විමල්සිරි මුණසිංහ

**5. ග්‍රන්ථ විමර්ශනය**

**මාධ්‍ය අවබෝධය පිළිබඳ පුරෝගාමී කෘතිය**

**"Understanding Media" _______________ 89 - 94**

සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

# හින්දු ධාර්මික ඉගැන්වීම් සන්නිවේදනයෙහි ලා රාම්ලීලා ජන නාටකයේ ශක්‍යතාව

**ආචාර්ය අමිලා දමයන්ති**

## සංක්ෂේපය

හින්දු ධාර්මික ඉගැන්වීම්වලට අනුව කර්ම, ඥාන, භක්ති යන සියලු ම මාර්ගයන්ගෙන් නිෂ්ටාව හෙවත් මෝක්ෂයට පමුණුවාලිය හැකි උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථයක් 16 වන සියවසෙ හි උතුරු ඉන්දියාවේ අයෝධ්‍යාවේ ජීවත් වූ ගෝස්වාමී තුල්සිදාස් නමැති රාම් භක්තික අවධභාෂික කවියා විසින් ''රාම්චරිත්මානස්'' යන නාමයෙන් රචනා කළ අතර ඔහුගේ ම මැදිහත්වීමෙන් එහි නාට්‍යානුසාරී ඉදිරිපත් කිරීම රාම්ලීලා ජන නාටකය ලෙස සමාජ ගත විය. දශැහැරා හා දීපවාලී උත්සවයන්ට සමගාමීව ඉදිරිපත් වන මෙම ජන නාටකය උතුරු ඉන්දීය ලක්ෂ සංඛ්‍යාත ජනකායක් නරඹන ගෞරවාන්විත සංස්කෘතික අංගයක් බවට පත්ව තිබේ. 16 වන සියවසේ අග භාගයේ සිට වර්තමානය දක්වා රඟ දැක්වෙන රාම්ලීලා ජන නාටකය හින්දු ආගමෙ හි අන්තර්ගත ඇදහිලි පක්ෂයත් තන්ත්‍ර - භාවනා සහ පූජා විධීන් මෙන්ම දාර්ශනික පසුබිම නැවත ඉන්දීය වැසියන් තුළ කයෝරත්වයෙන් තොරව ළගන්නා සුළු බවකින් යුතු ව අනුස්මරණීය කර වන්නකි. එසේම එම නාටකය ඔවුනට ලෞකික ජීවිත පරිඥානය හින්දු ධාර්මික ඉගැන්වීම්වලට අනුකූලව ලබා දීමට ප්‍රයත්න දරයි. මෙම තත්ත්වය එම නාටකය ව්‍යාප්තව තිබෙන සෑම ප්‍රදේශයක ම පාහේ එක සේ දැකගත හැකි වූ අතර එය ප්‍රායෝගික ව අත් විඳීමේ අවකාශය ද හිමිවිය. ඒ අනුව මෙම පර්යේෂණයේ ගැටලුව වූයේ රාම්ලීලා නමැති ජන නාටකය හින්දු ලබ්ධිකයන්ගේ ලෝකෝත්තර ජීවිතයට මෝක්ෂය ළඟා කරවන හින්දු ධර්මයේ ඉගැන්වෙන ප්‍රවේශ මාර්ගවල ගමන් ගන්නා ආකාරය සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් බවට පත්ව ඇත් ද යන්නයි. එසේම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වූයේ හින්දු දාර්ශනික විවිධාකාර ගැඹුරු ඉගැන්වීම් පවා මැනවින් සන්නිවේදනය කරවීමෙහි ලා රාම්ලීලා එක්තරා ජන නාටකයක් වුවත් එහි පවත්නා ශක්‍යතා පර්යේෂණාත්මක ව ඉදිරිපත් කිරීම යි. මේ සදහා භාවිත වූයේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යි. දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස භාවිත වූයේ 2017 සිට 2019 දක්වා ත් 2022 සිට 2023 දක්වා ත් වර්ෂවල සැප්තැම්බර් මාසය පුරා ම උත්තර ප්‍රදේශ් ප්‍රාන්තයේ, රාම් නගර් හි රාම්ලීලා ඇතුළු ව ඊට අයත් නොයෙක් ප්‍රදේශවල රඟ දැක් වූ විවිධ ආකෘතියේ රාම්ලීලා භූමිවලට ගොස් සහභාගීත්වයෙන් නිරීක්ෂණය කිරීම, සම්මුඛ සාකච්ඡා හා හින්දි, සංස්කෘත, ඉංග්‍රීසි යන භාෂාවලින් ලියැවුණු ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර පරිශීලනයත්, සඟරා, පුවත්පත් පරිශීලනය හා කෝෂ ග්‍රන්ථ පරිශීලනයන් ය. පර්යේෂණයේ නියැදිය වූයේ හින්දු ආගම යැයි නාමකරණය වූ ලබ්ධිය ඇතුළත මෝක්ෂය ඉලක්ක කොටගත් දස ආකාර

වූ මූලික ඉගැන්වීම් කිහිපයකි. කොරෝනා වසංගතය නිසා දීර්ඝ ව ඇදීගිය පර්යේෂණය වසර හතක පමණ කාල පරාසයක ක්‍රියාත්මක වූ අතර දත්ත විශ්ලේෂණයෙන් පසු අවසාන නිගමනය වූයේ රාම්ලීලා ජන නාටකයක් වුවත් එය වෛදික ඇදහීම් මඟින් සුපෝෂිත හින්දු දාර්ශනික හා සංකල්පමය ඉගැන්වීම් ඉතා විචිත්‍රවත් ව හා තාර්කික ව ප්‍රේක්ෂක ජනයා වෙත සම්ප්‍රේෂණය කරන ඉතා උසස් සන්නිවේදන ශක්‍යතාවලින් පරිපූර්ණ වූවක් බවයි.

**මුඛ්‍ය පද:** ජන නාටක, රාම්ලීලා, ශක්‍යතා, සන්නිවේදනය, හින්දු ධාර්මික ඉගැන්වීම්

## හැඳින්වීම

සමස්ත ඉන්දීය සංස්කෘතිය හින්දු ආගමික සංකල්පයන්ගෙන් ස්ථාපිත ව පවතී. මෙහි මූලික අභිප්‍රාය වී ඇත්තේ පුද්ගල ආත්මය මායාමය අනන්‍යතාවයෙන් මිදී පරාමාත්මයට හෙවත් මෝක්ෂක් ප්‍රාප්තියට පත්කරලීම යි. මෙකී විමුක්තියේ ප්‍රවේශ මාර්ග තුනකි. එනම් කර්ම, ඥාන හා භක්ති මාර්ග යන්න යි (Dasguptha,1927). වේදය ඉගැන්වීම් අනුගමනය කරමින් යහපත් කටයුතුවල නිරත වෙමින් ධාර්මික ජීවිතයක් ගත කිරීම කර්ම මාර්ගය වන අතර ඥාන මාර්ගය ලෙස හුවා දක්වන්නේ ලෝකයේ වෙනස් වන සුළු බව සහ තමන් සතු ආත්ම සහ පරමාත්මය අතර ඇති බැඳීම නුවණින් වටහාගෙන ආත්මය සහ පරමාත්මය සමෝදානය කිරීම යි. දෙවියන් කෙරෙහි විශ්වාසය තබා ශ්‍රද්ධාව වඩවා භක්තිවන්තයෙකු වීම භක්ති මාර්ගය යි. මේ සඳහා ක්‍රියාත්මක වන සියලුම ක්‍රියා පිළිවෙත් විවිධාකාර ලෙස සමාජගතව තිබෙනු දැකිය හැකි අතර උතුරු ඉන්දීය සංස්කෘතිය ලෙස හඳුනාගත හැකිව ඇත්තේ ද එයයි (Ibid, n.d.). මෙහි ප්‍රායෝගික ක්‍රියාවලිය රාම්ලීලා ජන නාටකයෙහි ක්‍රියාත්මක වනු නිරීක්ෂණය විය. කර්ම, ඥාන, භක්ති යන සියලු මාර්ගයන්ගෙන් නිෂ්ටාව හෙවත් මෝක්ෂයට පමුණුවාලිය හැකි උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථයක් 16 වන සියවසෙහි ගෝස්වාමී තුල්සිදාස් නමැති රාම් භක්තික කවියා විසින් "රාම්චරිත්මානස් " යන නාමයෙන් කාව්‍ය ග්‍රන්ථයක් රචනා කළ අතර ඔහුගේම මැදිහත්වීමෙන් එහි නාට්‍යානුසාරී ඉදිරිපත් කිරීම රාම්ලීලා ජන නාටකය ලෙසින් සමාජගත විය. දශැහැරා හා දීපාවලී උත්සවයන්ට සමගාමීව ඉදිරිපත් වන මෙම ජන නාටකය උතුරු ඉන්දීය ලක්ෂ සංඛ්‍යාත ජනකායක් නරඹන ගෞරවාන්විත සංස්කෘතික අංගයක් බවට පත්ව තිබේ. 16 වන සියවසේ අග භාගයේ සිට වර්තමානය දක්වා රඟ දැක්වෙන **රාම්ලීලා ජන නාටකය** හින්දු ආගමෙහි

අන්තර්ගත ඇදහිලි පක්ෂයත් තන්ත්‍ර - සාධනා සහ පූජා විධීන් මෙන්ම දාර්ශනික පසුබිම නැවත අනුස්මරණීය කරමින් ලෞකික ජීවිත පරිඥානය හින්දු ධර්මයෙන් ලබමින් පුද්ගල ලෝකෝත්තර ජීවිතය සුවපත් කර ගැනීම නොහොත් මෝක්ෂයේ ප්‍රවේශ මාර්ගය සන්නිවේදනය කිරීමේ මාධ්‍යයක් බවට පත්ව ඇත් ද? පර්යේෂණ ගැටලුව කරගනිමින් නිගමනවලට එළඹීම මෙම පත්‍රිකාවේ අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි. දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස සහභාගිත්ව නිරීක්ෂණය සමග සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදී. 2018 වර්ෂයෙහි කාශි නොහොත් බරණැස ගංගා නම් ගංගාවේ බටහිර ඉවුරෙහි පිහිටි උප නගරයක් වන රාම් නගර්වල පවත්නා මැදානී (තැනිතලා බිමක පැවැත්වෙන රාම්ලීලා) ජන නාටකය පුරා දින 21 ක් නැරඹීමත් ඊට අමතරව චිත්‍රකූටය, ඉලහාබාදය හා අයෝධ්‍යාවේ රඟ දැක්වූ මාදැනි රාම්ලීලා 2016, 2017, 2018, 2019 වර්ෂවල විටින් විට නැරඹීමත්, රාම්ලීලා නාට්‍ය සංවිධායකවරු, කෝවිලේ දායක සභාවේ නියෝජිතවරු, පූජ්‍ය පිරිස්, නළු නිළියන්, වේදිකා පාලකවරු, ප්‍රේක්ෂකයින් යනාදීන් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා (In deep interview) මගින් දත්ත රැස් කිරීමත් කරන ලද අතර උත්තර ප්‍රදේශ් ප්‍රාන්තයේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධ පර්යේෂණ මධ්‍යස්ථානවල ප්‍රධානීන්ගේ සම්මුඛ සාකච්ඡාවන්ගෙන් අවශ්‍ය දත්ත රැස් කරගැනීමත් කරන ලදී. එමෙන්ම මේ සඳහා මූලික කොට හින්දි භාෂාවෙන් රචිත ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර ග්‍රන්ථයන් සහ ඉංග්‍රීසි හා සංස්කෘත ග්‍රන්ථ පරිශීලනය කිරීම ද සිදු කරන ලදී. මෙසේ රැස් කරගන්නා ලද දත්ත හින්දු ධාර්මික ඉගැන්වීම් සහ දර්ශනයට අදාළ න්‍යායන් හා ප්‍රවේශයන් සමග විශ්ලේෂණය කර ඒවා රාම්ලීලා ජන නාටකය මාධ්‍ය කොට ගනිමින් ප්‍රේක්ෂක ජනයා වෙත සන්නිවේදනය වන්නේ දැයි පර්යේෂණාත්මක ව සොයා බලන ලදී.

## සාහිත්‍ය විමර්ශනය

ඉන්දීය ශිෂ්ටාචාරය ආර්ය සමාජයෙන් ආරම්භ වූ බවට ඉතිහාසය සකස් ව තිබුවත් එය එසේ නොවන්නට සාක්ෂි සාධක ඉතිහාසයෙන් ම මුණගැසේ. ලෝකයේ වෙනත් දේශයක නිරූපණය නොවන අනන්‍ය වූ සංස්කෘතියක් ඉන්දීය මහාද්වීපය සතුවීමට හේතු වූ කාරණා එම සාක්ෂි සාධක විසින් ම සපයනු ලබයි (Macfic,1992).

ආර්ය ජනයා වයඹ දෙසින් ඉන්දියාවට සංක්‍රමණය වන්නේ ක්‍රි.පූ. 1000 - 2000 අතර කාලයේදී ය. ඔවුන් එසේ පැමිණීමට මත්තෙන් දියුණු ශිෂ්ටාචාරයක් ඉන්දු නිම්නයෙ හි පැවති බවට මොහෙන්ජෝදාරෝ හරප්පා නටබුන්වලින් හෙළිවන අතර එය ආර්ය නොවූ ශිෂ්ටාචාරයකි (Lal, 1972). මොහෙන්ජෝදාරෝ හරප්පා ජනතාව වුව ද ඉන්දියාවේ මුල් පදිංචිකරුවන් නොව අන් දේශයකින් සංක්‍රමණය වී ඇති ජන කොටසක් බවට ඓතිහාසික තොරතුරු අනාවරණය කරයි (Ibid, n.d.). එනමුත් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් යැයි සැලකෙන මොහෙන්ජෝදාරෝ හරප්පා ශිෂ්ටාචාරය අභිභවා ආර්ය ශිෂ්ටාචාරය වර්ධනය වූ බවක් ඉතිහාසයේ සඳහන් වේ (Vachandev, 1995).

කෙසේ වෙතත් ආර්යයන් ඉන්දියාවට පැමිණෙන විට ජීවත් වූ අනාර්යයන්ගේ ඇදහිලි විශ්වාස ආර්යයන්ගේ වෛදික ඇදහිලි හා සම්මිශ්‍රණය විය. මෙසේ සකස් වූ ඉන්දු ආර්ය ශිෂ්ටාචාරය පිළිබඳ මැනවින් අධ්‍යයනය කර ගැනීමට හැකියාව ලැබෙනුයේ ක්‍රි.පූ. 500 - 1500ත් දක්වා අතරතුර රචනා කරන ලද වේද ග්‍රන්ථ ආශ්‍රයෙනි (බැෂම්, 1965). ආර්ය සමාජයේ මුල් අවස්ථාව පෙන්නුම් කෙරෙන ඍග් වේදයෙහි ආර්යයන්ගේ සංග්‍රාම බලය හා වෛදික දෙවිවරුන්ගේ අසීමිත තේජස හා ජයග්‍රහණය වර්ණනා කෙරෙන ගීතිකා රැසක් අඩංගු විය. සූර්යයා, ගින්න, වායු, ජලය ආදී වශයෙන් වූ ස්වභාවධර්මයේ බලවේගයන් මෙම වෛදික සමාජය විසින් දේවත්වයෙන් පිදුම් ලැබූ බව පෙනේ (Yadav, 2017). මේ බැව් ඍග් වේදය සේම ඊට පසු ලියවුණා යැයි සැලකෙන යජුර්, අථර්ව සහ සාම යන නම්වලින් හඳුන්වන වේද ග්‍රන්ථයන්ගෙන් මැනවින් සපථ වේ. වර්තමානයේ ඉන්දීය සංස්කෘතියේ මූලික අඩිතාලම ලෙස සැලකෙන හින්දු ධර්මය සකස්ව ඇත්තේ ඉහත සඳහන් කරන ලද වෛදික ඇදහීම් විශ්වාස මුල් වූ ඉගැන්වීම් සමස්තය වූ වේදයත් එකී රචනාවලට පසුව විසංවාදයට භාජනයේ වූ බ්‍රාහ්මණ, ආරණ්‍යයක, උපනිෂද් වැනි ග්‍රන්ථගත කරුණු සේම ක්‍රි.පූ. 200 සිට ක්‍රි.ව. 300 අතර යුගයට අයත් ආගමික ස්වරූපයක් නොගත්ත ද ආප්තෝපදේශයන් හා ආදර්ශයන් අන්තර්ගත ඉතා උසස් යැයි සැලකෙන ආගමික වටිනාකමක් අන්තර්ගත වූ වීර කාව්‍යයන්ටය (Ibid, n.d.). මෙකී හින්දු ආගම තවදුරටත් වර්ධනය වීමට හේතු වන්නේ ක්‍රි.ව. 300 - ක්‍රි.ව. 750 යුගයෙහි රචනා වන පුරාණ ග්‍රන්ථ හා ධර්ම සූත්‍ර ආශ්‍රයෙනි. එසේම මීට මාතෘ දේවී වන්දනය සහ ශක්ති වන්දනය එනම් දෙවිඳුවක හෝ දෙවිඳුන්, විශේෂයෙන් ම ශිව දෙවියන් හෝ ඔහුගේ

බිරිඳගේ ස්වරූප වශයෙන් සැලකෙන්නවුන් පිදීම (Dasguptha, 1927) වැනි ඇදහිලි පූජා කර්මත් එක්ව ඇත. ඇත්තෙන් ම පුරාණ ග්‍රන්ථ යනු ආගමික උපදේශ අඩංගු කොට තැනුණු පුරාවෘත්තාන්තයෝ ය. ඒවා විවිධාකාර වන අතර ප්‍රධාන කොට පුරාණ ග්‍රන්ථ අටලොසක් හමුවේ. හින්දු ධර්ම නීතිය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අනාවරණය කරනුයේ ධර්ම සූත්‍ර ග්‍රන්ථ මාර්ගයෙනි (Winternitz, 1927). ඒවා ඍෂිවරුන් රචනා කර ඇති අතර ඒවා අතුරින් බෞද්ධයායන, වශිෂ්ඨ, ආපස්ථම්භ යන ඍෂිවරුන්ගේ ග්‍රන්ථගත ධර්ම සූත්‍ර වැදගත් ඒවා ලෙස සලකනු ලබයි. මෙසේ ලඝු කොට සඳහන් කළ හින්දු ධර්මයේ දාර්ශනික පැතිකඩ ආරම්භ වන්නේ ක්‍රි.ව.700 - 1000 අතර කාල වකවානුව තුළදී ය. මේ වන විට ඉන්දීය සමාජය තුළ විභින්න ඇදහිලි විශ්වාස, යාතු කර්ම, හෝම කර්ම, යන්ත්‍ර සූත්‍ර කර්ම, ව්‍රත සමාදන්වීම යනාදිය නොයෙක් දෙවි දේවතාවන් හෝ ස්වභාවික වස්තූන් අරමුණු කරමින් තම ලෞකික ජීවිතයේ ශාන්තිය දියුණුව තකා සිදු කර ගනිමින් තිබූ යුගයකි.

මෙසේ ඇදහිලි පක්ෂයත් තන්ත්‍ර-සාධනා සහ පූජා විධි ප්‍රචලිත වීම අතර බුද්ධිමත් ජනයා ධර්මයේ දාර්ශනිකත්වය කෙරෙහි නැඹුරු විය. න්‍යාය, වෛශේෂික, සාංඛ්‍ය, යෝග, මීමංසා, වේදාන්ත යන සාධර්මික ෂඩ්වාද බිහිවීමේ ප්‍රතිඵලය ලෙස හින්දු ධර්මයට දාර්ශනික ආලෝකයක් හිමි විය. හින්දු ධර්මය අග්‍රගණ්‍ය දාර්ශනිකයන් දෙදෙනෙකු වූ කුමාරි, බට්ට සහ ශංකර යන බ්‍රාහ්මණයින් විසින් ස්වකීය තර්ක කෞශල්‍යයෙන් සහ සංවිධාන ශූරත්වයෙන් අද්වෛත්වාදය භාරතය පුරා ප්‍රචාරය කර හින්දු ආගමේ ශෛව ලබ්ධිය පෙරමුණට රැගෙන ආවේය (Sharma, 1983).

ලෝකයේ ඇති සියලු දේ පරමාත්මයෙන් පැමිණියා සේම අවසානයේ යළි එය කරාම පෙරළා යයි. මෙම පරමාර්ථය නිර්ගුණ ආදී පදවලින් හැඳින්විණ (Ibid, n.d.). මෙකී තත්ත්වයට පත්වීම පුද්ගලයාගේ පරම අපේක්ෂාව විය යුතු බව හින්දු බැතිමතුන් පිළිගනී. හික්ෂූන් ඔවුන්ගේ ධර්මිෂ්ඨභාවය සහ සුචරිතය ළඟා කරවන **ධර්ම අනුගමනය**, ලෞකික සමෘද්ධිය උදාකරවන **අර්ථ අනුගමනය**, ආදරය ප්‍රේමය විවාහය සංගීතය නාට්‍ය ආදී ආස්වාදනයන් ඇතුළත් කාම අනුගමනය මෙන් ම අවසාන වශයෙන් ජීවිතයේ නිෂ්ඨාව වූ මෝක්ෂය වෙත ළඟා වීම ආදියට අනුගත වූ, සමාජය විසින් ම නිර්මාණය කර ලැබ සිටින සංස්කෘතියක ජීවත් වෙති. මෙම

සංස්කෘතික නිර්මාණය සඳහා වේද රචනාවට බොහෝ කලකට පසු ලේඛනගත වූ **ස්මෘති ග්‍රන්ථ** බෙහෙවින් ඉවහල් වූ බව ඉන්දීය සමාජ විද්‍යාඥයන්ගේ මතය යි. ඉතා වැදගත් ස්මෘති ග්‍රන්ථ වනුයේ මනුනීති, රාමායනය, මහා භාරතය, භගවත් ගීතාව, පුරාණ නැමැති ග්‍රන්ථයි. මේවා විවිධ කාලවල රචනා වූ ග්‍රන්ථයන් ය. මෙම ග්‍රන්ථ ගද්‍යමය සූත්‍ර ආකාරයෙන් රචනා වූ අතර පසුකාලීනව ඒවා පද්‍යයට ද නගන ලදී. ඒවා සමස්තයක් ලෙස ධර්ම ශාස්ත්‍ර නමින් හැඳින්වේ (Sharma, 1983). මෙම විමර්ශනයෙන් අවබෝධ කොට ගත හැක්කේ හින්දු ධර්මයේ අතිශය වැදගත් ධර්ම ශාස්ත්‍ර ලෙස මනුනීති, රාමායනය, මහා භාරතය, භගවත් ගීතාව, පුරාණ ග්‍රන්ථාදිය සැලකෙන බවයි.

මෙම පර්යේෂණයේ මුඛ්‍ය පදය වන රාම්ලීලා නම් ජන නාටකය වර්තමානය වන විට හින්දු ධර්මය ප්‍රායෝගික ව සමාජගත කිරීමේ සක්‍රීය සන්නිවේදන මාධ්‍යයක් බවට පත්ව තිබෙන බව නිරීක්ෂණය විය. මේ පිළිබඳ ව සරල අදහසක් ගතහොත් රාම්ලීලා ජන නාටකයෙන් සිද්ධ වන්නේ රාම් චරිතය හා සම්බන්ධ කතාන්දර නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීමයි. රාම්ලීලා ජන නාටකයක් ලෙස ලඝු කොට සලකා ප්‍රාථමික මුහුණුවරින් බැහැර කිරීමට කිසිසේත් ම හැකියාවක් නොමැති කලාංගයක් බව මෙහිලා සඳහන් කළ යුතුව ඇත. මෙම ජන නාටකයේ විශදවන ප්‍රස්තුතයට වැදගත් කථිකාවන් වනුයේ රාම්ලීලා හින්දු ආගමේ අවතාර සංකල්පය සමඟ ඍජුව බැඳී පවතින රාම චරිතයත්, මෙය ඉන්දීය සාමාන්‍ය ජනයා විසින් වැළඳ ගනු ලැබූ ජන නාට්‍යයක් වීමත්ය. ඉන්දීය සමාජයේ බොහෝ ජන නාටක දක්නට ලැබේ. එනමුත් මහා සැණකෙළියක ස්වරූපය ගත් ඉන්දීය රාජ්‍ය අනුග්‍රහය ඍජුවම හා අඛණ්ඩව ලැබෙන විවිධ ආකෘතීන්ගෙන් ඉදිරිපත් වන දින 25ක් 30ක් අතර දීර්ඝ කාලවකවානුවක දිගහැරෙන ශක්තිමත් සංවිධිත ස්වරූපයකින් යුතු වෙනත් ජන නාටකයක් ඉන්දියාවේ දැක ගත නොහැක්කේය (Awasthi,1979). විශාල භූගෝලීය විස්තාරණයක් එනම් මෙය උත්තර ප්‍රදේශ ප්‍රාන්තය සහ තවත් දකුණු ඉන්දීය ප්‍රදේශ ගණනාවක ම ප්‍රචලිත ජනයා එක සේ අමන්දානන්දයකට පත් කරවන ජන නාටකයකි.

වර්තමාන උතුරු ඉන්දියාවේ උත්තර ප්‍රදේශ ප්‍රාන්තයේ ජනතාවගෙන් බහුතරයක් හින්දූන් වන වෛෂ්ණව භක්තිවන්තයෝ වෙති. බොහෝ පිරිසක් විෂ්ණු දෙවියන්ගේ අවතාර යැයි සැලකෙන රාම සහ ක්‍රිෂ්ණ

හෝ දෙදෙනා ම ප්‍රමුඛත්වයෙහි ලා වන්දනාමාන කිරීමට පෙළඹී සිටිති. 15 වන ශතවර්ෂයේ මුල් භාගයේ සිට මෝගල් අධිරාජවාදීන් විසින් ඉන්දීය රාජ්‍යයට දරුණු ලෙස යුධමය පහරදීම් සිද්ධ කිරීමත් එය අල්ලා ගැනීමෙනුත් පසු මෙතෙක් ක්‍රියාත්මක වූ වෛදික දේව සංකල්පයන් ප්‍රමුඛව ගොඩනැගී තිබුණු හින්දු ධර්මයට හා සංස්කෘතියට අනිසි දේශපාලනික බලපෑම්වලට පාත්‍ර වන්නට සිදුවිය. අක්බර් අධිරාජයාගේ බලය උත්තර ඉන්දියාවේ සම්පූර්ණ වශයෙන් ද දක්ෂිණ ඉන්දියාවේ වඩා විශාල භූමි භාගයක ද පැතිර ගියහ. මෙම කාලය තුළ යුද්ධයෙන් පීඩාවට පත්ව සිටි හින්දූන් අන්ත අසරණ තත්ත්වයකට පත් විය (Sharma, 1983). අක්බර් අධිරාජයාගේ මානුෂීය ක්‍රියා කලාපය තරමක සැනසිල්ලක් වූ නමුත් ඔහුගෙන් පසු රාජ්‍යත්වයට පත් වූ මුස්ලිම් රජවරු හින්දු ධර්මය හා සංස්කෘතිය වැනසී ය. මෙකල හිංසනයට ලක් වූ සමස්ත හින්දු ප්‍රජාව ධාර්මික වශයෙන් සුවපත් කිරීමේ අරමුණින් ගෝස්වාමී තුල්සිදාස් නමැති රාම් භක්තික අවධ භාෂික කවියා විසින් 16 වන ශත වර්ෂයේදී රාම්ලීලා ජන නාටකය ජනතාව අතර ආරම්භ කරන ලදි (Bhanushankar, 2012). මේ වන විට මෝගල් යුද්ධයෙන් හෙම්බත් වූ හින්දු ජනයා ලෞකික ජීවිතය පිළිබඳ තරමක කලකිරීම් සහගත ස්වභාවයක ජීවත් වූ අතර ඔවුන් ස්වකීය අලෞකික ජීවිතය තම ආගමික ප්‍රතිපදාවන් ඔස්සේ හැඩගස්වා ගැනීමේ පරමාර්ථ සහගත උනන්දුවකින් පසු විය.

හින්දි සාහිත්‍යයේ මධ්‍යකාලීන සාහිත්‍යයට අයත් භක්තිකාලීන රචනා ලියැවීම ආරම්භ වන්නේ ඉහතින් දැක් වූ කාලීන අවශ්‍යතාවය ද සමඟ ය. ආත්මය පරමාත්මය වෙත ළඟා කෙරෙන ධර්ම ශාස්ත්‍රගත කරුණු හා දාර්ශනික ඉගැන්වීම් ආශ්‍රය කොට ගනිමින් ක්‍රියාත්මක වූ නොයෙක් සාධනාවන් අනුගමනය කිරීමට ඇතැම් හින්දූන් ප්‍රයත්න දැරූ අතර ඥාන මාර්ගය පැහැදිලි කොට සකස් කර ගැනීමත් එකී ඉගැන්වීම් අභ්‍යාස කිරීමත්ටත් පෙළඹිණි (Tiwari, 1955). එමෙන් ම ඉහතින් ප්‍රකාශ කළ වේදයේ ඉගැන්වීම් පරිදි දෙවියන් සතුටු කරනු සඳහා වෛදික ආගමේ පැවති යාග හෝමත් විවිධ හින්දු ඇදහිලි හා විවිධ පූජා විධින්ගෙන් යුතු "කර්ම" මාර්ගීය එළැඹුම් සඳහා ජනයා විශාල වශයෙන් ප්‍රවේශ විය (Dasagupta, 1927). මේ සඳහා මෝගල් රාජසමයේ දී එල්ල වූයේ දැඩි දේශපාලන විරෝධයකි. මෙකල හින්දු ආගමික වත්පිළිවෙත් තහනමට ලක් කිරීමටත් දේවාල පවා කඩා බිඳ දැමීමටත් හින්දු ලබ්ධිකයන් ඝාතනය කිරීම වැනි සාපරාධී නීති ක්‍රියාත්මක විය. එසේ වුවත් විවිධ හින්දු නිකායන් හා ආශ්‍රමවලින් දෙවියන් කෙරෙහි ශ්‍රද්ධාව වර්ධනය කොට අභ්‍යාස කිරීමෙන්

පුද්ගලයා පරමාත්මය වෙත ළඟා වීමට අවශ්‍ය කෞශල්‍යය ඇතිකර ගැනීමට අවකාශය පුද්ගලයන්ට උදාකරලීමට උත්සහ දරන ලදී (Kansyakar, 2001). සාහිත්‍යමය වශයෙන් ක්‍රිෂ්ණ භක්ති ශාඛාවත්, රාම් භක්ති ශාඛාවත් ස්ථාපිත වීම හා වර්ධනය වීම මෙම සමය තුළ සිදු වූ අතර කවීහු ස්වකීය ඇදහුමට පාත්‍ර වූ දෙවියන්ගේ ශුද්ධ උපාසකයන් බවට පත්ව ගමින් ගමට යමින් තම භක්තිවන්ත දෙවියන් මුල්කොටගෙන ලෞකික ජීවිතය සකස් කර ගැනීම පිළිබඳ ධර්ම දේශනා, කාව්‍ය, මාධ්‍ය කොටගෙන පැවැත්වූහ (Ibid, 2001).

මෙය මධ්‍යකාලීන භාරතයේ "භක්ති ආන්දෝලන්" ලෙස ඉතිහාසයට එකතු වී ඇත (Mishra, 2015). සමස්ත භාරතයේ ප්‍රගමනයට අවශ්‍ය ආස්ථානය හින්දු ධර්මයෙන් ප්‍රදානය වන බවට වූ විශ්වාසය හින්දූන් අතර එදත් අදත් හෙටත් පොදු වූ ධර්මතාවයක් බවට පත්ව හමාරය. මෙහි මුල් බිජුවට වැපුර වූයේ මධ්‍යකාලීන භක්ති සාහිත්‍ය පෙරමුණු කරගත් භක්ති ආන්දෝලනය යි (Ibid, n.d.). මෙය ධාර්මික හා සමාජීය ආන්දෝලනයක් ව ක්‍රියාත්මක විය. මෙකල රචනා වූ භක්ති කාව්‍යයන් නිර්ගුණ සහ සගුණ යනුවෙන් ධාරාවන් ද්විත්වයක් ඔස්සේ ප්‍රවාහිත විය (Mehetha, 2015) රාම්ලීලා ජන නාටකය ද සගුණ භක්තිකයන් සලකන්නේ දෙවියන් කෙරෙන් ශ්‍රද්ධාව වඩා වර්ධනය කරනු ලබන මෙවලමක් ආකාරයෙනි (Ibid, n.d.). රාම් භක්ති ශාඛාවේ අති ප්‍රබල කවියෙකු වූ ගොස්වාමී තුල්සිදාස් විසින් (ක්‍රි.ව. 1680) ජනතාව තුළ රාම් කෙරෙහි භක්තිය ප්‍රවර්ධනය කරලීමේ අධිෂ්ඨානයෙන් හා පරමාර්ථයෙන් කාව්‍ය ග්‍රන්ථයන් කීපයක් මේ වන විට රචනා කරනු ලබයි. තුලසිදාස් කවියා විශිෂ්ටාද්වෛත්වාදය, අද්වෛත්වාදය, වේදාන්තය, ශංකරගේ අද්වෛත්වාදය ආදී හින්දු දාර්ශනික සංකල්පයන්ගේ දැනුමෙන් ආඪ්‍ය වූ මහත්මා ගුණැති ප්‍රාඥයෙකි (Pande, 2003). අවතාර සංකල්පය අදහන හෙතෙම විසින් රාම් චරිතය පරම බ්‍රහ්මත්වයේ තබා සලකනු ලබයි. එසේම රාම යනු විෂ්ණු දෙවියන්ගේ අවතාරය ලෙස ද පිළිගනී. ඔහුගේ කාව්‍යන්ගේ සඳහන් පරිදි ජලය, වාෂ්ප හා අයිස් තත්ත්වයන්ගෙන් දක්නට ලැබෙන්නේ යම් සේ ද බ්‍රහ්ම ද විවිධ ස්වරූපයෙන් පෘථිවියට පැමිණේ.

නැතහොත් හෙතෙම ස්වකීය නියෝජිතයකු හෝ එවනු ලබයි, යනුවෙනි (Ramcharithmanas, 2018). බ්‍රහ්මගේ නියෝජිතයා වෙත පැවතිය යුතු ශ්‍රද්ධාව ජනතාවගේ සන්තානයන් හි ඇතිකර ඔවුන්

පෙළඹවීම හා බ්‍රහ්ම කෙරෙහි ජනයා ඇලීමකට ලක් කිරීම මෙන් ම ඔවුන්ගේ චින්තනය බ්‍රහ්ම වෙතට යොමු කර ඒකායනය කිරීම මාගේ පරමාර්ථය යනුවෙනි (Ramcharithmanas, 2018).

මෙම පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා ගෝස්වාමී තුල්සිදාස් නම් කවියා රාම්චරිත්මානස් ග්‍රන්ථය කොටස් වශයෙන් සාමාන්‍ය ජනයාට උගන්වා රාම්ලීලා නමින් වීදියක රඟ දැක්වීමට පෙළඹේ (Yadav, 2015). මේ සම්බන්ධයෙන් සවිස්තරාත්මක ව කරුණු දක්වන මෝහන්රාය යාදව් මෙසේ ප්‍රකාශ කරයි. "මෙතරම් දාර්ශනික ගැඹුරු අදහස් සම්පිණ්ඩනය වූ රාම්චරිත්මානස් වැනි කෘති කිසිසේත් ම සාක්ෂරතාවයක් නොමැති ජනයා නොකියවන බව තුල්සිදාසිගේ අදහස වන්නට විය හැකිය. එසේම ධර්ම දේශනා ආශ්‍රයෙන් එය පැහැදිලි කර දුන්න ද එය පිළිගෙන ප්‍රායෝගික ව අනුගමනය කරන්නේ ද අතලොස්සක් පමණි. මීට ඉතා මනරම් වෛකල්පිතයක් ලෙස ඔහුට අවශ්‍ය වූයේ ජන නාට්‍යයක මාධ්‍යයෙන් එකී ධාර්මික කරුණු හා තත්ත්වයන් ජනතාවට සන්නිවේදනය කිරීමට ය. රම්චරිත්මානස් හි හරය වන්නේ බ්‍රහ්ම, මායා, ජගත් සහ ජීව යන තත්ත්වයන් හි යථාර්ථය පහදා දී ජීවිත යහපත උදෙසා අභ්‍යාස කරවීම ය (Yadav, 2015). එසේම නාට්‍යය සහ ලීලා යන්නෙහි අන්තරය පැහැදිලි කරන හෙතෙම රාම්ලීලා යනු සාමාන්‍ය ජනයාගේ විනෝදයට පාත්‍රවන හුදෙක් නාට්‍යයක් ම නොවන බව ද අවධාරණය කරයි (Ibid, n.d.).

"ලීලා" යන්නෙහි වචනාර්ථය වන්නේ සෙල්ලම ක්‍රීඩාව, විනෝදය, ආනන්දය, මනෝරංජනය, විලාසය, අභිනය, රහස්‍ය බව (Secret Performance), පූර්ණ කාර්යය, අත්භූත කාර්යය යන්නයි (Hindikosh, 2003). බොහෝ ඉන්දීය විද්වතුන්ගේ මේ සම්බන්ධ මතය වන්නේ ලීලා යනු අවතාරයන්ගේ ක්‍රියා කලාපයන් අභිනය කර පෙන්වීම යනුවෙනි (William, 2005). මෙම මතයට සාක්ෂි වශයෙන් ඔවුන් ශ්‍රීමත් භගවත් ගීතාව ගෙනහැර දක්වයි. භගවත් ගීතාවට අනුව ලීලා පෑම සඳහා පෘථිවිය නිර්මාණය වී ඇති බවත් විශ්වයේ උත්පත්තිය, පැවැත්ම සහ සංහාරයෙන් ම ලීලාවන් වන බවත් ය. විෂ්ණු තෙමේ ලීලා පෑම සඳහා කිසියම් අවතාරයක ස්වරූපය ගන්නා බවත් එකී සෑම ලීලාවක් ම ප්‍රාණීන්ගේ චිත්ත උට්ඨානය පිණිස ක්‍රියාත්මක කරන බවත් ය (Srimad Bhagvad Gita, 1998).

මේ සදහා විශ්ණු නොහොත් භාග්‍යවතුන් විසින් යෝග මායාවන් යොදවන්නා සේ ම ඒ සියල්ල ඊශ්වර නොහොත් බ්‍රහ්ම විසින් සම්පාදනය කරන බවත් ය. මෙහි ප්‍රතිඵලය වන්නේ විෂ්ණු මනුෂ්‍යයෙකු ලෙස උපත ලබා පෘථිවියේ පාලනය ස්වභාවධර්ම නීතියට අනුකූලව හැඩගස්වා ධර්මය ස්ථාපනය කොට අධර්මය විනාශකර සත් ජනයාගේ සුබ, යසස, කීර්තිය ඇති කරනු ලබන බවයි (Awasthi, 1979). මේ සියල්ල ලීලා ලෙස නම් කරනු ලබයි. මෙහිදී විෂ්ණුගේ ප්‍රත්‍යක්ෂ දර්ශනය සාමාන්‍ය ලෝවැසියන්ට දැක බලා ගැනීමට අවස්ථාව සැලසේ. එසේ පෘථිවිය මත දැක් වූ ලීලාවන් මෙනෙහි කිරීම, දැක බලා ගැනීම භාග්‍යවතුන් විසින් අනු දක්නා ලද ආප්තෝපදේශ ස්වකීය ජීවිතයේදී ක්‍රියාත්මක කර අභ්‍යාස කිරීම පරමාත්මය වෙත ළඟා වීමට ලැබෙන මාර්ගයක් බව හින්දු ධර්මය පිළිගැනීමයි (Ravi, 2010). භාග්‍යවතුන් වෙත ශ්‍රද්ධාව ඇති කිරීම මෙහි මූලික හරය වේ. මෙම ධර්ම සූත්‍රගත පිළිවෙත රාම්ලීලා ජන නාටකය තුළින් සාක්ෂාත් කර ගැනීමට හැකියාව ඇති බවට පරම විශ්වාසයක් ඉන්දියානු හින්දි බැතිමතුන් තුළ පවත්නාහ. එහි ප්‍රතිඵලයක් ලෙස හින්දු සංස්කෘතිය රාම්ලීලා ජන නාටකය හුදෙක් ජන නාටකය ස්වරූපය අබිබවා ගිය ධාර්මික වස්තුන් ලෙස සැලකීමට පෙළඹී තිබේ (අයෝධ්‍යා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ වයි.පී.සිංහ් මහතා සමඟ තුල්සි ස්මාරක භවන් අයෝධ්‍යාවේදී 2017.03.12 පැවති සාකච්ඡාව) රාම්ලීලා ජන නාටකය මේ නිසාම ඉන්දීය සංස්කෘතිය සමාජය හා දේශපාලනය පාලනය කිරීමට තරම් බලවත් ව තිබේ. මෙම ස්වභාවය තවදුරටත් තේරුම් ගත හැක්කේ රාම්ලීලා ජන නාටකය ප්‍රායෝගික ව ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ රැස් කරගත් දත්තයන් පිරික්සීමෙනි.

උතුරු ඉන්දියාවේ බොහෝ කලාංගවල රාම් චරිතය විද්‍යමාන වේ. මේ පිළිබඳව රාම් සම්බන්ධ කලාකෘති පිළිබඳ පර්යේෂණ ආයතනයක් වන අයෝධ්‍යා ශෝද් සංස්ථාන් හි අධ්‍යක්ෂ වයි.පී.සිංහ් පැවසූයේ උතුරු ඉන්දියාවේ සෑම හින්දු නිවසකින් ම තිරිඟු ඇටයක් සොයා ගැනීම අපහසු වුවත් රාම් පිළිබඳව කිසියම් වූ කලාංගයකට සම්බන්ධ නොවූ අයෙක් සොයා ගැනීම දුෂ්කර කාර්යයක් නොවන බවයි. (වයි.පී.සිංහ් මහතා විසින් තේජ්පූර් විශ්වවිද්‍යාලයේ පැවති Ram in Asian Life, Literature and Art 2017.11.20 නම් පර්යේෂණ පරිසංවාදයේදී පැවැත්වූ දේශනය 2017.08.03) දීපාවලී

උත්සවය ඉන්දීය වැසියන් සමරනුයේ කාරණා කීපයක් අරමුණු කරගෙන ය. එහි ප්‍රධානත ම අරමුණ වන්නේ රාම රාවණ පරදා රාවණ විසින් පැහැරගත් ස්වකීය බිරිඳ සීතාව ද කැටුව රාම කුමරු ආයෝධ්‍යාවට පෙරලා පැමිණීම උත්කර්ෂවත් අන්දමින් සැමරීම සඳහා ය.

මෙම දීපාවලී උත්සවය ඇරඹුම සිදුවන දිනයේ පටන් දින කීපයක් ම නගර ගම් දනව් පහන් දල්වා ඒකාලෝක කිරීමත් ඊට පසුව පැවැත්වෙන දශහැරා උත්සවය සමරමින් රාවණගේ විශාල ආකෘති, කඩදාසි බටපතුරු ආදියෙන් තනා එය ගිනි බත් කර ප්‍රීතිමත්වන අතරවාරයේ රාම්ලීලා ජන නාටකය ද සැණකෙලි බිමෙහි සුලබ දසුනක් වේ. රාම්ලීලා ඉදිරිපත් වන ආකාරය අනුව යම් යම් වෙනස්කම් පැවතිය ද එහි කතා සාරය වාල්මීකී රාමායන කතා ප්‍රවෘත්තිය ම වේ. සෑම රාම්ලීලා ජන නාටකයක ම අනිවාර්යයෙන් පැවැත්වෙන දර්ශනයන් සමූහයක් වේ. එනම් රාම උත්පත්තිය, විශ්වාමිත්‍රගේ උපදෙස් පරිදි රාම විසින් තාඩකා රාක්ෂිය මරමුවට පත් කිරීම, ධනුෂ්යඥය හා රාම් සීතා සරණ මංගල්‍යය හා ඔවුන් වන වාසයට පිටත්ව යාම, ශූර්පණ්ණිකාගේ නාස ඡේදනය, සීතාහරණය, රාම් ක්‍රිෂ්කින්දාවට පැමිණීම, සුග්‍රීව බාලි යුද්ධය, හනුමන්තාගේ ලංකාගමනය හා හනුමාට සීතාව මුණගැසීම, මේඝනාථ ලක්ෂ්මන ද්වන්ද සටන, ලක්ෂ්මණගේ තුවාලය සුවකිරීමට හනුමන්තා විසින් හිමාලයෙන් සංජීවනී පැළෑටිය ගෙන ඒම, රාම රාවණ යුද්ධය, රාවණ මරණයට පත් කර ලංකාව ජය ගැනීම නම් අග්නි පරීක්ෂාව, පෙරළා අයෝධ්‍යාවට පැමිණීම යනාදියයි. මෙම පර්යේෂණයේදී මා විසින් සම්පූර්ණ වශයෙන් දින 28ක් පුරා නොකඩවා නැරඹූ රාම් නගර්හි පැවති රාම්ලීලා හි පෙළගැස්ම තුළ ඉහත දැක් වූ දර්ශනයන්ට අමතරව තවත් දර්ශන දොළහක් පමණ අන්තර්ගතව තිබෙනු දැකගත හැකිවිය. මේ සෑම දර්ශනයක් ම යාග හෝම කර්ම, යඥය කර්ම විවිධ සංස්කාර විවිධ විශ්වාස ඇතුළත් චාරිත්‍ර වාරිත්‍ර නිරූපණය විය. මේ සෑම දර්ශනයක ම සංවාද තුල්සිදාස් විසින් රචිත රාම්චරිත්මානස් ග්‍රන්ථයෙහි "දෝහා" නමින් හැඳින්වෙන දෙපද කාව්‍ය මගින් ඉදිරිපත් වූ අතර ඒ අතරට සාමාන්‍ය ව්‍යවහාර බසින් තනාගත් සංවාද සුළු වශයෙන් යොදා ගැනීමක් ද වේ.

## නියැදියේ ස්වභාවය

සාහිත්‍ය විමර්ශනයේදී පැහැදිලි වූයේ ආර්යයන් ඉන්දියාවට පැමිණි යුගයේ පටන් ම ඉතා සාරගර්භීව ඔද වැඩි සංවර්ධනය වූ හින්දු ආගම

යැයි නාමකරණය වූ ලබ්ධියක් ඇතුලත මෝක්ෂය ඉලක්ක කොටගත් ඉගැන්වීම් රාශියක් ඇති බවය. මෙහි ස්ථාපිතව පවත්නා මූලික සංකල්ප ලෙස හඳුනාගත හැකි වූයේ සංසාරය, කර්මය සහ නිර්වාණයයි. කෙනෙකු මිය ගිය විට ඔහුගේ උපාදානස්කන්ධය එම භෞතික ශරීරය හැර දමා නැවත අලුත් භෞතික ශරීරයක් ලබා ගැනීම නැවත නැවත සිදුවේ. එය **සංසාරය** ලෙස හින්දු ආගමේ ඉගැන්වේ. මානසික සහ කායික චර්යාවන් හෙවත් කර්මයන් පුද්ගලයා යළි උපත ලැබීමට මුල් වන්නා සේ ම එකී කර්මයේ ස්වභාවය උපතෙහි යහපත අයහපතට මූලික වන බව හින්දු ධර්මයෙහි **කර්ම** යන්නෙහි ඉගැන්වීමයි. එසේම නිර්වාණය නොහොත් මෝක්ෂයේ ස්වභාවය හින්දු ආගමෙහි උගන්වනුයේ මිනිසා හසුව ඇති මරණය සහ යළි ඉපදීම පිළිබඳ චක්‍රය (The Cycle Birth & Death) යථාර්ථවාදීව විශ්ලේෂණය කිරීමත් හින්දු ආගමික ඉගැන්වීමේ ධර්මතා අනුව වාසය කිරීමේ ප්‍රතිඵලය මත ඉතා යහපත් උත්තරීතර ජීවිතයක් ගත කිරීමට හැකි බවත්, එසේ ආගමානුකූල සුචරිතව හිඳ මිය යන පුද්ගලයාගේ ආත්මය අතුරුදහන් වීමකට ලක්වන බවත් ය. එය ඔවුහු **මෝක්ෂය, නිර්වාණ** ලෙස නම් කරති. හින්දු ආගම අනුව මනුෂ්‍යයා මෝක්ෂය ලබන්නේ හෙතෙමගේ ආත්මය විශ්වීය පරමාත්මය (Cosmic Sprit) සමග එක්වීමෙනි (Dasgupta, 1927).

ඉහතින් විස්තර කළ පරිදි හින්දු ආගමික ධර්ම ශාස්ත්‍රවලට අනුකූලව පුද්ගලයා (ආත්මය) විසින් මෝක්ෂය ලබනු පිණිස අනුගමනය කළ යුතු හා නිගමනය කරනු ලැබූ බොහෝ දෑ පවතින බව නිරීක්ෂණය විය. ඒවායින් බොහෝ ප්‍රමාණයක් රාම්ලීලා ජන නාටකය මාධ්‍ය කොට ගනිමින් ඉදිරිපත් වනු, අවබෝධ කරදෙනු, අභ්‍යාස කරදෙනු, දක්නට ලැබේ. මෙය රාම්ලීලා ජන නාටකයේ හින්දු ආගම සන්නිවේදනය වන ක්‍රියාවලිය යි. හින්දු ධර්ම ග්‍රන්ථවල ඉගැන්වෙන පහත සඳහන් දෑ එසේ නාට්‍ය මාධ්‍ය කොට සන්නිවේදනය වන බව මූලික වශයෙන් නිරීක්ෂණය කරගත හැකි වූ අතර ඒ සියල්ල මෙම පර්යේෂණයෙන් නියැදිකරණයට ලක් කරන ලදී.

1. ශ්‍රද්ධාව වර්ධනය හෙවත් අභ්‍යාස කිරීම.
2. යෝග - ජප් - තප් අභ්‍යාසය නොහොත් යෝග ආසන කර්ම අවබෝධය හා එය අභ්‍යාස කිරීම, ජප කිරීම් හා එය අභ්‍යාස කිරීම, තපස සහ තපසාභ්‍යාසය.
3. ධර්ම සූත්‍රගත සංකල්පයක් ලෙස අවතාර සංකල්පය අනුදැකීම හා අවතාර පිදීම හා අවතාර ආදර්ශීව ක්‍රියා කිරීම.

4. ඒකාග්‍ර චිත්ත අභ්‍යාසය.
5. කාන්තාවන්ගේ ආශ්‍රය කළමනාකරණය කිරීම හා ඇය විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපදාවන් හා නියමයන් ඉදිරිපත් කිරීම
6. උපවාස ව්‍රත සමාදන් වීම අග්නි වන්දනාව, යාග කිරීම, බිලි පූජාව වෙතට පුද්ගලයා නැඹුරු කරවීම.
7. අපීති සත්කාරය, දාම්පත්‍ය ප්‍රේමය, දාරක ප්‍රේමය, සොහොයුරු ප්‍රේමය, සේවක සේව්‍ය බැඳියාව, ආදර්ශවාදී බව, ඍජු පැවැත්ම, පරාරෝපය, ජාති පන්ති භේදය සම සිතින් ඉවසීම, ඍජු බව, මෝහය පිටුදැකීම, ඉවසීම, ප්‍රතිව්‍රතාව.
8. චිත්තවේග කළමනාකරණය.
9. තමාගේ සහ සමාජයේ ධර්ම ස්ථාපනය සඳහා සතුරා විද්වංශනය කිරීම.
10. ආත්මය ධර්මානුකූල ව තෘප්තිමත් කිරීම නොහොත් තර්පණය කිරීම තුළ කාම සේවනය.

**දත්ත විශ්ලේෂණය**

ගොස්වාමී තුල්සිදාස් වැනි කවීන්ගේ දැක්ම වූයේ බ්‍රහ්ම නාමය හෝ බ්‍රහ්මාවතාරය ස්මරණය කිරීම, අර්චනා නොහොත් පුද සත්කාර කිරීම, බ්‍රහ්ම වන්දනය සහ බ්‍රහ්මාශ්‍රිතව සිටීම (සේවනය) ආදිය ක්‍රියාත්මක කිරීමෙන් පුද්ගල අධ්‍යාත්මික සංවර්ධනය කඩිනමින් ඇති කරගත හැකි බවයි (Ramcharithmanas, 2018). මේ සියල්ලක් ම එක සේ ඉටු කර දෙනු ලබන වස්තුවක් ලෙස ගෝස්වාමී කවියා විසින් රාම්ලීලා ජන නාටකයේ ඉදිරිපත් කරන්නට ඇති බව රාම්ලීලා නැරඹීමෙන් පසක් වේ. පුද්ගල මනස තුළ ශ්‍රද්ධාව වැපිරීමේ ඉමහත් බලය රාම්ලීලා ජන නාටකය සතු බව හෙතෙම පිළිගනී (Mohanaraya, 2015). එය ලෞකික ජීවිතය අලෞකික ජීවිතයක් වෙතට කැඳවාගෙන යනු ලබන සන්නිවේදන මෙවලමක් ලෙස සැලකිය හැක්කේ එබැවිනි. හින්දු ධර්ම සූත්‍රවලට අනුකූලව සාකාර රූපී බ්‍රහ්ම මුණගැසෙන්නේ අවතාර ස්වරූපයෙනි. එම අවතාරය හඳුනා ගැනීම හෙතෙම සමඟ කටයුතු කිරීම හෙතෙම අනුගාමීව විශ්වාස කිරීම, බ්‍රහ්මාවතාරයට සමාවේෂ වීම, හෙතෙම සමග සන්නිවේදනයේ යෙදීම, බ්‍රහ්මාවතාරය ආදර්ශ කොට ජීවිතය සකසා ගැනීම ආදිය සසර සැරිසරන පුද්ගලයා විසින් ගරු කටයුතු ව පරමාත්මය හෙවත් මෝක්ෂය වෙත ළඟා වීමට තරම් උත්තරීතර

හේතුවකි (Ramcharithmanas, 2018). එයින් පුද්ගලයාගේ චිත්ත සන්තානයෙ හි පවත්නා වූ ක්ලේෂයන් ප්‍රහීණ කර ගැනීමට හැකිවේ. එබැවින් මෝක්ෂයට මාර්ගය සැලසේ.

රාම අවතාරය රාම්ලීලා නාටකයේ ප්‍රධාන වන අතර ඔහුගේ උත්පත්තියේ සිට බාල, කුමාර හා තරුණ අවධියේ අනේක ප්‍රකාර සිද්ධි කදම්බයන් රැසක් ප්‍රේක්ෂක අභිමුවට පැමිණේ. රාම, ලක්ෂ්මණ හා සීතාට සමාවේෂ වන නළු නිළියන් බොහෝ දුරට දරුවන් ය. ඔවුන් කහවතින් සෝදා සුවඳ පැනින් නහවා ඉතා පවිත්‍ර ව සූදානම් කරයි. ඔවුන් නාටකය ඉදිරිපත් කිරීමට වේදිකාවට හෝ වීදියකට සම්ප්‍රාප්ත වන විට මල් මාලා ගෙලවට දැමීමට ප්‍රේක්ෂකයෝ පොරකා හෙම්බත් වනු දැකගත හැකි වේ. පොලිස් ආරක්ෂාව බොහෝ විට මෙම විශේෂිත චරිත මවන නළු නිළියන්ට ලබාදීම දක්නට ලැබෙන තරම් ම ඔවුන් පිළිගැනීමට ද ප්‍රේක්ෂකයෝ පොදි කති. බාල මහලු භේදයකින් තොරව නළු නිළියන්ගේ දෙපා සිඹ ස්පර්ශ කිරීමට වෙහෙසෙන ජනයා විටෙක උම්මන්තකයන් මෙන් තම අවස්ථාව ලැබෙන තුරු ඒ මේ අත දුවති. (රාම් නගර් රාම්ලීලා 2016.09.02 දින දර්ශන) ප්‍රාදේශීය ඉඩම් හිමියන්, බලවතුන්, ධනවතුන් හා කුලවතුන් ද එතනට පැමිණ නළු නිළියන් නැමද ආශිර්වාද ලබා ගැනීමට වේදිකාවට සම්ප්‍රාප්ත වනු රාම්ලීලා ජන නාටකය ආරම්භ වන අවස්ථාවල දැක ගත හැකි ය. රාම, ලක්ෂ්මණ, සීතා චරිත සඳහා ඉදිරිපත් වන නළු නිළියන්ට ද සමාජයෙන් ලැබෙනුයේ ඉමහත් ගෞරවයකි. මේ නිසා මෙම චරිත සඳහා තෝරා ගැනීමට නළු නිළිවරණයක් ද පවත්වනු දැක ගත හැකිය. (2019.03.02 දින මනමෝහාන්ලාල් (පාසල් ගුරු) සමග රාම් නගර් හි පැවැත් වූ සාකච්ඡාව) නළු නිළියන්ට රාම්චරිත්මානස් ග්‍රන්ථයේ සියලුම "දෝහා" (දෙපද කාව්‍ය) කටපාඩම් ය. ප්‍රේක්ෂකයන්ගෙන් බහුතරයක් ද එය දැන සිටීම ආශ්චර්යයකි. නළු නිළි හා ප්‍රේක්ෂක දෙකොට්ඨාසයම ඒ දර්ශන තලයන් හි ඉදිරිපත් වන කාව්‍යයන් චතුර ලෙස ගායනා කරති (රාම් නගර් - රාම්ලීලා- 2016.09.21 දින දර්ශන). හින්දු ධර්ම සූත්‍රවලට අනුව යෝග අභ්‍යාස, ජප කිරීම සහ තපස (තප්) මෝක්ෂයට සත්ත්වයා පැමිණවීමේ බලවේගයක් ලෙස ක්‍රියා කරන්නකි (Mohanraya, 2015).

එසේම රාම්ලීලා ජන නාටකයේ එන ඍෂිවරුන්ගෙන් දශරථ කුමරුවරුන්ට ලැබෙන උපදෙස් සරල ව නාටකය තුළ සන්නිවේදනය වන අයුරු නිරීක්ෂණය කළ හැක. එමඟින් යෝග හා

තපස පිළිබඳව සහ එහි නිරතවීමේ කැමැත්තක්, උනන්දුවක් ජනයාගේ චිත්ත සන්තානගත වේ. බ්‍රහ්ම හා ස්වභාවධර්මී තත්ත්ව නොහොත් ආපෝ, තේජෝ, වායෝ, පඨවී, ආකාශ යන පංච භූත තත්ත්වයන්ගේ ක්‍රියාකාරීත්වය අසමතුලිත හා සමතුලිතභාවය සම්බන්ධ වේද සූත්‍ර ඉගැන්වීම් හා එහි පවතින ශක්තිය තම ශරීරය සමඟ ආබද්ධ කරගැනීමේ දී ජප කිරීමේ වැදගත්කම සන්නිවේදනය කරමින් රාම ගුණ සහිත රාම්චරිත්මානස් කෘතියේ රචිත දෝහා දිගින් දිගටම සජ්ඣායනය වේ. (අයෝධ්‍යා රාම්ලීලා-තුල්සි ස්මාරක භවන්,2019.09.04) එමගින් ලැබෙන තේජස, ශක්තිය හා බලාත්මය රාම්ලීලා ජන නාටකයේ විවිධ දර්ශන තල මාධ්‍යයෙන් ප්‍රේක්ෂකයා අභිමුවට පමුණුවයි. දීර්ඝ වශයෙන් එසේ ජප කිරීම හා ඒවා සිදුවීමෙන් පුද්ගලයා පවිත්‍රත්වයට පත්වන බව සන්නිවේදනය කෙරේ. රාම්ලීලා ජන නාටකයේ දර්ශන දෙස ප්‍රේක්ෂකයා නෙත යොමා සිටින්නේ ස්වකීය භක්තිවන්ත රාම දෙවිඳුන් මනුලොවට වැඩම කර සිටින ලෙසිනි. ඇත්තෙන් ම මෙය නැරඹීමට පැමිණෙන ප්‍රේක්ෂක ජනයා හින්දු ලබ්ධික උපාසකවරු පිරිසක් ලෙස නම් කිරීම නිවැරදි ය. මෙය හුදෙක් නාට්‍යයක් ම පමණක් ලෙස ඔවුන් නොසලකයි. ප්‍රේක්ෂකයන් කෙතරම් ශ්‍රද්ධා සම්පන්න වන්නේ ද යත් රාම මෙන් කහවතින් ඔවුන් ද සැරසේ. රුද්‍රාක්ෂ බීජවලින් සෑදූ ජප මාලාව ඇඟිලි තුඩුවලින් ගණන් කරනුයේ රාමගේ දර්ශනය වේදිකාවේ මතුවන තුරු ය.

රාමගේ වීරත්වය විදහාලන ජවනිකා වන ධනුෂ්යග්ගය, තාඩකා මරණය, බාලි මරණය, මේඝනාථ මරණය, රාම රාවණ යුද්ධ ආදී දර්ශන තලවලින් ප්‍රේක්ෂකයන් ඒ දෙස බලා ඔල්වරසන් දෙමින් ස්වකීය දෙවියන්ගේ ශූරත්වය උදම් අනති. (රාම්ලීලා, චිත්‍රකූටය 2019.09.11 දර්ශන තලය) මෙයින් පෙනී යන්නේ රාම්ලීලා ජන නාටකය මගින් ශ්‍රද්ධාව අභ්‍යාස කිරීමට පුරුදු පුහුණු වන බවකි. ජනයා අත් ඔසවමින් ඔල්වරසන් දෙමින් කෑ ගසති. සාධුකාර දෙති. හින්දු ධර්මයෙහි එන අවතාරවාදය මෙන් ම හින්දු සංස්කෘතියෙහි රාම දෙවිඳු සලකනු ලබන්නේ සුචරිතවත් මෙන් ම වෛදික දැක්ම මගින් පෝෂණය වූ නීති රීති සම්ප්‍රදායන්, විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර, ආකල්ප ආදී මෙකී නොකී සමස්ත හින්දු සංස්කෘතික මූල පද්ධතිය මැනවින් අනුදක්නා ලද ධර්මතාවන්ට අනුකූලව ක්‍රියා කළ ප්‍රතාපවත් චරිතයක් ලෙසිනි. මෙම තත්ත්වය ඔවුන් සඳහන් කරන්නේ "මර්යාදා පුරුෂෝත්තම" යනුවෙනි. මේ නිසා රාම්ලීලා දර්ශන වාර අතරතුර

"මර්යාදා පුරුෂෝත්තම රාම්" යනුවෙන් ජනයා ඔල්වරසන් දෙනු දැකගත හැකි ය (රාම්ලීලා, චිත්‍රකූටය 2017.09.11 දර්ශන තලය).

ලෞකික ක්ලේශයන්ගෙන් පිරී යන සිතුවිලි මගහැරීම මෝක්ෂය නැමැති ඒකාන්ත ඉලක්කයක් හඹා යන ආත්මය විසින් අනිවාර්යයෙන් අභ්‍යාස කළ යුත්තකි. මෙය හින්දු ධර්ම සූත්‍රවල සඳහන් වන්නේ ඒකාග්‍ර චිත්ත අභ්‍යාසය ලෙසයි. මෙය ජීවිතයේ හමුවන සෑම ගැටුමකදී ම උත්සහයෙන් වැඩිය යුත්තකි. මෙම පැහැදිලි කිරීම ආදර්ශ රූපීව රාම්ලීලා ජන නාටකය තුළ රාම්ගේ චරිතය යොදාගනිමින් අපූරුවට සන්නිවේදනය කෙරේ. රාම් තමාට හිමි රජ සැප තම මයිලණුවන් වන භරත කුමරුට පවරා හිමයට යයි. ඔහු මහා ඝන වනාන්තරයේ වනචාරී මිනිසුන් සමඟ අනන්ත දුක් පීඩා විඳිමින් ජීවත් වේ. තම බිරිය සීතා පැහැරගෙන ගොස් ඇති බව තේරුම් ගත් ඔහු කිෂ්කින්දා වනය වෙත යයි. එහි වූ වානර වර්ගයා සමග රාවණ පැරදවීමට ඉලක්කගත ආක්‍රමණකාරී යුද්ධය සැලසුම් කරයි.

මෙම සිද්ධි දෙක රාම්ලීලා ජන නාටකයෙහි ඉදිරිපත් වන්නේ ඒකාග්‍ර චිත්ත අභ්‍යාසය ලෙසයි (රාම් නගර් රාම් ලීලා 2018.09.28 දර්ශන තලය). මෙහිදී සීතා, ලක්ෂ්මණ, සූර්පණඛිකා, මන්දෝදරී, රාවණ සහ කෛකේසි යන සියලුම චරිත මගින් මිනිසාගේ පොදු මනෝභාවයන් ඉදිරිපත් කර එම පුද්ගල ස්වභාවයන්ගේ දුර්වල හා බලසම්පන්න බව මත ඔවුන් වර්ග කර තම ආත්මය ලෞකික ව සුචරිත ව පවත්වාගෙන යාමේ වැදගත්කම නාට්‍යානුසාරී ව සන්නිවේදනය කරයි. වේදයේ උගන්වනු ලබන ලෞකික ව අකැප යැයි නම් කරනු ලබන කරුණු යමෙකු විසින් සිදු කරයි ද එහි ආදීනව හෝ අලාභදායි බව නැවත නාට්‍යානුසාරී ව දැකබලා අවබෝධ කරගැනීමේ අවකාශයක් රාම්ලීලා ජන නාටකයෙන් ඉන්දීය ජනයාට උරුම වී ඇත. ප්‍රේක්ෂකයන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් අනාවරණය වූයේ ඔවුන්ගේ මනස පවිත්‍ර කර ගැනීමට ලැබෙන අවස්ථාවක් ලෙස රාම්ලීලා ජන නාටකය අගයන බවයි. (2019.03.02 දින මනමෝහන්ලාල් (පාසල් ගුරු) සමඟ රාම් නගර්හි පැවැත්වුණු සාකච්ඡාව) මෙම ප්‍රේක්ෂක ජනයා අතර තරුණ පිරිස ද උද්යෝගයෙන් ඊට සහභාගී වන අතර මෙය නැරඹීමෙන් ලබන ප්‍රීතිය හුදෙක් බොළඳ විනෝදාස්වාදයක ඉලක්කයක් නොවන බවත් එය තමා අදහන දෙවියන් දර්ශනය වී තමා අභිමුවට පැමිණ සිදු කරනු ලබන ආදර්ශවාදී දේශනාවක් ලෙස ඔවුන් භුක්ති විඳින බවත් ය.

(2019.09.18 සංජය විජයමාල් (ප්‍රේක්ෂක) (වයස 29) සමග අයෝධ්‍යා රාම්ලීලා නරඹන අවස්ථාවේ සිදුකළ සාකච්ජාව) මේ ආකාරයෙන් හින්දු ධර්මය ඉගැන්වෙන ආත්මය යහපත් කර්මයට නැඹුරු කිරීමේ ප්‍රයත්නය රාම්ලීලා ජන නාටකයෙන් සන්නිවේදනය වන බව විශ්ලේෂණය කළ හැකි ය.

මෝහය, වංකත්වය, ක්ලේශයන්හි ඇලීම, ළාමක බව, චංචල බව සහ දීනභාවය යන ලෞකික ජීවිතයේ ඉස්මතු කරන තත්ත්ව පුද්ගලයා විසින් ජයගත යුතු බව හින්දු ධර්ම ශාස්ත්‍ර නීතිය, මනු නීතිය, භගවත්ගීතාව ආදියෙන් අවධාරණය කරනු ලබන අතර එම දුශ්ශීලගති පැවතුම් ජීවිතයෙන් ක්‍රමානුකූලව ඈත් කිරීම අභ්‍යාස කළ යුතු බවටත් උපදෙස් දෙනු ලබයි. මේවා හුදෙක් උපදේශයක් ම නොවී ධර්මශාස්ත්‍ර නීතිය යනුවෙන් බාහිරට පැමිණ ප්‍රායෝගික ව සිද්ධි ගැටුම් උපයෝගී කර ගනිමින් සන්නිවේදනය කිරීම රාම්ලීලා ජන නාටකයෙන් ඉතා සැලසුම් සහගත ව සිදුකරයි. අසුර සහ සුර වශයෙන් පාත්‍ර වර්ගයා වර්ග වන අතර එහි නිරූපිත කළු චරිත සියල්ල මෙම දුශ්ශීල ස්වභාවයට සමාවේශය වනු දැක ගත හැකි ය. ක්ලේශයන්හි ඇලී ගිය රාවණගේ නැගණිය සූර්පණඛිකා රාම කුමරු තමාගේ ස්වාමියා කර ගැනීමට වෙහෙසෙයි. තමා විවාහක බව රාම කුමරුන් විසින් කොතෙක් පහදා දුන්න ද චංචල සිත් ඇති ඇය රාගයෙන් මුලා වීම නිරූපණය වේ (රාම් නගර් රාම්ලීලා 2019.09.12). අවසානයේ ලක්ෂ්මන් විසින් ඇගේ නාසයත් තන පුඩුත් කපා දමයි. ඇය තම දුක රාවණට ප්‍රකාශ කරනුයේ තමා අතින් කිසිදු වරදක් නොමැති පරිදි ය. මෙහිදී කෝපාවිෂ්ට වන රාවණ ළාමක ව හැසිරේ. මුලාවන රාවණ තමාට කිසිදු වරදක් නොකළ සීතාව ලංකාවට පැහැරගෙන එයි. මෙම සිද්ධියෙන් සහ ගැටුම්වලින් නිරූපණය වන්නේ හින්දු ධර්ම ශාස්ත්‍ර සූත්‍ර පිටු දකිනා ලද දුශ්ශීලවත් මානව හැසිරීම් සිද්ධ කළ විනාශය යි. මෙම සිද්ධීන් ගැටුම් සමග ඊට යෝග්‍ය ලෙස රම්චරිත්මානස් හි "දෝහා" (දෙපද කාව්‍ය) ගැයීම මගින් නිරූපණය කෙරේ. ප්‍රේක්ෂකයන් ද ඊට දායකත්වය ලබා දෙමින් ඔවුන් ද ගයයි.

මෝක්ෂය සොයා යන මාර්ගය තුළ කාන්තාවගේ අනුග්‍රහය මෙන් ම ඇය නොපිළිගැනීමේ අවස්ථා ද උදා වේ. මෙය මනු නීතියේ ඉතා මැනවින් විග්‍රහ වේ (Mishra, 2015). කාන්තාවගේ සිතුවිලි ඉතා ක්ෂණයෙන් චංචල වී ඇය ක්ලේෂයන්ගේ සහ රාගික ඇලීමට පත් වේ. ඇගේ ළාමක ගතිය ස්වභාවික ය. ඇය පිනවීම බොහෝ

වෙහෙසකාරී ය. ඇගේ අනවබෝධය පුද්ගලයා ව්‍යසනයට පමුණුවනු ලබයි. කාන්තාවගේ මෙම ගති ස්වභාවය නිසා හින්දු ධර්ම ශාස්ත්‍රවල ස්ත්‍රී සේවනය නුවණින් කළමනාකරණය කළ යුතු බව දක්වයි (Ibid, n.d.).

මෙම විග්‍රහය රාම්ලීලා ජන නාටකය තුළ ප්‍රේක්ෂකයාට මැනවින් සන්නිවේදනය කරනු නිරීක්ෂණය වේ. රාම්ලීලා ජන නාටකයේ ස්ත්‍රී චරිත රාශියකි. එහි සුජාත සාධු චරිතය මවන්නී සීතා ය. ඊට අමතරව රාමගේ මව කෞෂල්‍යා බිසව හා රාමගේ සුළු මවුන් අතර නිබඳ ව ස්වාර්ථයට පැමිණෙන කෛකේසී බිසව, සූර්පණිකා, රාවණ බිරිඳ, මන්දෝදරී, සුග්‍රීව සහ වානරයාගේ බිරිඳ රුක්මණී ආදී චරිතවලින් ඉහතින් ප්‍රකාශ කළ සෑම දුර්ගුණයක් ම ඉදිරිපත් වේ. එක් දිනක සීතා රන් මුවෙකු දකී. ඒ අනෙකෙකු නොව රාවණාගේ මන්ත්‍රීවරයෙකු වූ මරීච විසින් ඉන්ද්‍රජාලිකව මවන ලද මුවා ය. මේ දියත තුළ රත්තරන් මුවන් නැති බව දැන දැනත් කොතරම් බුද්ධිමත් අයෙකු වුවත් රාම කුමරු සීතාගේ දැඩි ඉල්ලීම මත මුවා සෙවීමට වන ලැහැබට වදියි. ඔවුන් පිටත්ව ගිය විට මහලු වේශයක් දරාගෙන සීතාගේ පැල්පතට එනු ලබන රාවණ හට කෑමට යමක් ලබාදීමට සීතාට සිතේ. ඇය රාවණ වෙත යයි. රාවණ ඇය පැහැරගෙන ලංකාවට ගෙන එයි. එම සිද්ධිය රාම්ලීලා ජන නාටකයේ හුදෙක් නාට්‍යෝචිත අවස්ථාවක් ම නොවේ. ඉන් කාන්තාවන්ටත්, කාන්තාවන් ආශ්‍රය කරන පුරුෂයන්ටත් මනු නීතියේ ඉගැන්වීම් මතකයට නංවමින් ප්‍රේක්ෂකයා තුළ කාන්තාවන් ආශ්‍රය කිරීමේ පිළිවෙත සන්නිවේදනය කරවන්නක් වේ (රාම් නගර් රාම්ලීලා 2016.09.15 දර්ශන තලය). රාම කුමරු තම බිරිඳ සීතාගේ පතිවත පිරික්සීමට අග්නි පරීක්ෂාව සිදු කරයි. මෙය රාම්ලීලා ජන නාටකයේ ඉතා උද්වේගකර දර්ශනයකි. සීතාගේ ජීවිතය ගින්නට බිලි නොවන්නේ ඇය අපවිත්‍ර නොවූ නිසා යන කථිකාවත සන්නිවේදනය වන අතර පසුව රාම් කුමරු හා අයෝධ්‍යාව බලා යන සීතාට සිදුවන්නේ රාජ මාලිගාවෙන් පිටත් ව කැලෑ වැදීමට ය. රාම්ලිලා ජන නාටකයේ ඉතා ශෝකී දර්ශනයක් වන මෙය ගැඹුරු යථාර්ථවාදී මනු නීතිය ප්‍රේක්ෂකයා වෙත සන්නිවේදනය කරවන අවස්ථාවක් ය. රාම කුමරු නිසාවෙන් ගැබ් ගත් සීතා රැජිනියක ලෙස ස්වකීය ප්‍රජාව පිළි නොගන්නා බව රාම රජු සීතාට කියයි. අග්නි පරීක්ෂාවෙන් ජයගත් සීතාට ගැහැණියක ලෙස සමාජය ඉදිරියේ පවිත්‍ර වීමට අවකාශය නොලැබෙන ආකාරය රාම්ලීලා ජන නාටකයෙන් සන්නිවේදනය වේ (රාම් නගර් රාම්ලීලා 2016.09.15 දර්ශන තලය). හින්දු ධර්ම නීතියේදීත් කාන්තාවට ආඥා

පනවමින් ඇය රාමුවක සිර කරනු ලබන්නේ මේ නිසා බව රාම්චරිත්මානස් දෙපද කාව්‍ය මගින් ඉදිරිපත් කෙරේ. එය නීතියක් නොවුනත් සමාජයේ ශක්තිමත් වූ රීතියක් බව රාම්ලීලා ජන නාටකය මාධ්‍ය කොටගනිමින් එහි සිද්ධි නිරූපණයෙන් සමාජය වෙත සන්නිවේදනය කරවයි.

හින්දු ධර්ම ශාස්ත්‍රවලට අනුකූලව ආත්මයේ පවිත්‍රත්වයට පත් කර ගැනීමට උපවාස ව්‍රත සමාදන්වීම හා එය අභ්‍යාස කිරීම සිදු කරනු ලැබේ. උපවාස ව්‍රතය හින්දු සමාජයේ ප්‍රබල වන අතර ඊට අමතර ව පවත්වාගෙන යනු ලබන සෙසු ව්‍රත ද වේ. මෙම ව්‍රත සමාදන් වීම රාම්ලීලා ජන නාටකය පුරා විවිධ අවස්ථාවල නිරූපණය වීම දැකගත හැකිය. එහි සුවිශේෂත්වය වනුයේ එය ඇති සැටියෙන් ම සිදුකර පෙන්වීම මගින් ව්‍රතාරක්ෂාව පිළිබඳ පැහැදිලි සන්නිවේදනයක් ඉදිරිපත් වීමයි. මෙහිදී දශරථ රජු හා කුමාරවරුන් සේ ම බිසෝවරු ස්වකීය ප්‍රජාව හා දේශයෙහි සෞභාග්‍ය උදෙසා ආහාරයෙන් වැළකී කිරි පමණක් බොමින් උපවාස කිරීම විවිධ දර්ශනයන්හි නිරූපණය කෙරේ (රාම් නගර් රාම්ලීලා 2016.09.16, 2016.09.17, 2016.09.18, 2016.09.19 දර්ශන තල). මෙම නාටකයේ ගායනාවල රාම් විසින් ව්‍රත රක්ෂා කිරීම වඩාත් වර්ණනය කරයි. එසේම ව්‍රත ආරක්ෂාවේ ආදීනව සන්නිවේදනය කරයි. ඉන් ලැබෙන යසස, කීර්තිය, අතුරු කතාන්දරවල ජවනිකා ද වේදිකාවට ගෙන එමින් නිදසුන් සහිත ව තහවුරු කරයි. හින්දු ආගමට අයත් තෛත්තිරිය සංහිතාවේ හින්දු ආගමික උපවාසයන් තුනක් ඉගැන්වෙයි. ඒ සියල්ල ම රාම විසින් පූර්ණත්වයට පත් කළ ආකාරය එක් එක් ජවනිකාවලදී ප්‍රේක්ෂකයාට සන්නිවේදනය කරවයි.

රාම්නගර් රාම්ලීලා ජන නාටකයේ උපවාස ව්‍රතයට විස්තරාත්මක අර්ථකථනයන් ලබා දෙනු නිරීක්ෂණය විය. මෙම දේශනා ඉදිරිපත් කරනුයේ ගෘහීය සූත්‍රවලට අනුකූලව ය (රාම් ජනත් සමග 2016. 09.04 දින රාම් නගරෙහි පැවති සාකච්ජාව) මෙහිදී යාග හෝම සඳහා සුදුසු ධාන්‍ය වර්ගයකින් පිසින ලද කිසියම් වූ ආහාරයක් දිනකට වරක් පමණක් අනුභව කිරීමේ උපවාසයෙන් ආත්මය හට පරමාත්මය වෙත යාමට මාර්ගයක් උදාවන බව රාම්ලීලා ජන නාටකයේ තාඩකා මරණය, ධනුෂ්යග්ගය, ජටායු සංවාදය, ශබරී ආශ්‍රමය වෙත පැමිණීම, නාරද රාම දෙදෙනාගේ සංවාදය යන දර්ශන ඉදිරිපත් කිරීම්වලදී සංවාදමය ස්වරූපයෙන් සන්නිවේදනය කරයි. (රාම් නගර් - රාම් ලීලා 2016.09.04,10,15 වැනි දින) රාම්ලීලා නරඹමින් සිටි පාසල්

ආචාර්යවරයෙකු වූ ශංකර රාජ මහතා ප්‍රකාශ කළේ උපවාසය ආත්මය පරමාත්මය වෙත යාමට මාර්ගයක් වන බැවින් ඒ වෙත පුද්ගලයා නැඹුරු කිරීම රාම්ලීලා ජන නාටකයෙන් සිදුවන බවයි.

රාම්ලීලා ජන නාටකයේ බොහෝ දර්ශනවල අග්නි කර්මය නොහොත් අග්නි හෝත්‍ර යග්ගය වේදිකාව මත සිද්ධ කිරීම දක්නට ලැබේ. මේ පිළිබඳ අදහස වන්නේ මෙය ධර්ම සූත්‍ර, ගෘහය සූත්‍ර, කල්ප සූත්‍රය යනාදියෙ හි පූර්ණ ලෙස විස්තර වන ගෘහස්ථයෙකු විසින් අනිවාර්යෙන් පිළිපැදිය යුතු යාගයක් නිසා මෙයින් චක්‍රාකාරයෙන් සූර්ය වන්දනාව සිදුවන බවත් මෙය ප්‍රේක්ෂකයාට ස්මරණය කරවීමට මෙසේ රාම්ලීලා දර්ශන තලයන් හි අග්නි කර්මය නිරූපණය කිරීමට වෙහෙසෙන බවයි. (පාසල් ගුරු ශංකර රාජ සමඟ රාම් නගර රාම්ලීලා නරඹන අවස්ථාවේ 2016.03.19 කරන ලද සාකච්ඡාව) හින්දු ගෘහ මූලිකයා සහ ගෘහණිය විසින් අනිවාර්යෙන් තම නිවසේ අග්නි කර්මය කළ යුතු වීම හින්දු සමාජයේ සුලභ වූවකි. දශරථ රජු තම රජ මැඳුරෙහි අග්නි කර්මය සිදු කරන්නේ තම බිරින්දෑවරු තිදෙනාම කැටුවය. මේ ආශ්‍රයෙන් අග්නි හෝත්‍රය සිදුකිරීමේ නිවැරදි ක්‍රමය සහ පියවර මෙන් ම භාවිතා කරන අමුද්‍රව්‍ය පිළිබඳව මනා වැටහීමක් සන්නිවේදනය වේ. එසේම මේ ආකාරයෙන් චක්‍රාකාරව ආත්මය විශ්වීය පරමාත්මයට ළඟා කරවීම සඳහා අග්නි හෝත්‍ර කර්මයෙහි දායකත්වය රාම්ලීලා ජන නාටකය මගින් ඉදිරිපත් වීමෙන් ප්‍රේක්ෂක ජනයා ඒ පිළිබඳව වඩා වැඩි උනන්දුවකින් ක්‍රියාත්මක වේ.

අග්නි හෝත්‍රය සේම යාග හා බිලි පූජාව ද ආත්මයේ විශ්වීය පරමාර්ථ කරා කැටුව යන මාවතක් ලෙස රාම්ලීලා ජන නාටකයේ විවිධ සිද්ධීන් හි හඳුන්වනු ලබයි. රාම්ලීලා ජන නාටකයෙහි ප්‍රධාන වශයෙන් යුද්ධ සංග්‍රාම දෙකක් අන්තර්ගත ය. එකක් ක්‍රිෂ්කින්දාවේ ඇතිවන බාලී සුග්‍රීව යුද්ධය සහ ලංකාවේ ඇතිවන රාම රාවණ යුද්ධය යි. මෙම යුද්ධ ජයග්‍රහණය සඳහා විවිධාකාර යාග පූජා කර්ම කිරීමට උපදෙස් දීම ඍෂිවරුන් විසින් සිදු කිරීම දැකීම දර්ශන කීපයකම දක්නට ලැබේ. මේවා වේද මන්ත්‍ර සජ්ඣායනයන් සිදු කරනු දැක ගත හැකිය. මෙවැනි ජවනිකා නිරායාසයෙන් ම විනෝදකාමී බවින් දුරස්ව ගොස් තරමක වගකීම් සහගත බවකින් යුක්ත වේ. ප්‍රේක්ෂකයාද තමන් නාට්‍යයක් බැලීමට ගියා සේ නොව කෝවිලකට ගියා සේ දෙඅත් බැඳ දෙනෙත් පියාගනිමින් වේදිකාවේ නිරූපණය වන ගායන හෝ බිලි පූජා සමඟ තදාත්මීය වේ. (රාම්

නගර් රාම්ලීලා 2016.09.15 දර්ශන තලය) බොහෝ දේ පූජා කරමින් පැවැත්වෙන සර්ව මේධ යාගය රජවරු අභිෂේක කරවන විට සිදු කරන රාජසූන් යාගය, දර්ශ, පූර්ණ මාසා යාගය, චතුර් මාසා යාගය, අග්නි වයන යාගය ආදියත් නොයෙක් රාම්ලීලා නාටකවල නිරූපණය වේ (Mehetha, 2015).

රාම්ලීලා ජන නාටකයේ රඟ දැක්වෙන දින 25 හෝ 28 අතර කාලයේ සෑම දිනයකදී ම කිසියම් වූ ගැටුමක් සහිත අවස්ථාවක් නිරූපණය කිරීමට තරම් නාට්‍යෝචිතභාවයකින් යුක්ත විය. මේ සෑම දර්ශන වාරයක් ම ආත්මීය වශයෙන් සංවර්ධනය කරගත යුතු කිසියම් වූ යහපත් ගුණයන් ප්‍රේක්ෂකයා වෙත සන්නිවේදනය වීම අනිවාර්ය වේ. ඇත්තෙන් ම රාම්ලීලා යනු "රාම්චරිත්මානස් "යන ග්‍රන්ථය මත පදනම් වූ සත් ජනයා ප්‍රතිසංශෝධනය කරනු ලබන මෙවලමකි.

යහපත් ගුණාංග ප්‍රේක්ෂකයා ලවා ඉටු කර ගැනීම සඳහා ජන නාටකකරුවා ධර්ම දේශකයෙකු ලෙස ක්‍රියා කරයි. හින්දු බැතිමතා අනිවාර්යෙන් ප්‍රගුණ කළ යුතු ගුණාංග ලෙස නම් කරන අථිති සත්කාරය හෙවත් ආගන්තුක සත්කාරය, දාම්පත්‍ය ප්‍රේමය, සහෝදර බැඳියාව, දෙමව්පියන්ට කෘතඥ වීම, දාරක ප්‍රේමය, ඍජු පැවැත්ම, සේවක සේව්‍ය බැඳීම, පරාර්ථ චර්යාව, ජාති භේදභාවය සම සිතින් ඉවසීම, පතිවත රැකීම යනාදී උත්තරීතර ගුණාංග රාම්ලීලා ජන නාටකයෙන් සන්නිවේදනය වනු දැකගත හැකිය. ලංකාවේ අශෝක වාටිකාව නොහොත් අශෝක වනයේ සිරගත වී සිටින සීතා ප්‍රචණ්ඩව නොහැසිරෙයි. සම සිතින් දුක දරා සිටී. ඉවසීමේ ගුණය මෙහිදී වර්ණනා වේ. (රාම් නගර් රාම්ලීලා 2018.09.16 දර්ශන තලය) රාම කුමරු තම රජකම භරත කුමරුට භාර කොට රාජ්‍යත්වයේ නොසිට ප්‍රිය බිරිඳ සමග වනගතවීමෙන් පරාර්ථ චර්යාව නිරූපණය කෙරේ. වනයට බට කුමරුට විවිධ කුලවල පිරිස් හමුවේ. ඔහුට හමු වූ පහත් හෝ නීච කුලය ගැන මැදිහත් සිතින් ඉවසන ලෙසට රාම කුමරු ඔවුන්ට උපදෙස් දෙයි. රාම කුමරුට හිතවන්ත සේවකයා වන හනුමන්තාගේ චරිතය තුළින් සේවක සේව්‍ය බැඳියාව මැනවින් විශද කරවයි. රාම්ලීලා ජන නාටකය ආදර්ශවාදීභාවයේ ප්‍රතිමූර්තිය බවට පත්වන රාම් කුමරු සෑම විටෙක ආදර්ශවාදී රාජ කුමාරයෙකු, රජෙකු, සැමියෙකු, රණශූරයකු, ආඥාධරයෙකු, පීතෘවරයකු ලෙස උචිත සිද්ධි හා ගැටුම් මගින් සන්නිවේදනය කෙරේ. (රාම් නගර් රාම්ලීලා ජනනාට්‍යයකින් නැරඹීම 2016, 2018, 2019)

තමාගේත් සමාජයේත් ධර්මය ස්ථාපිත කරවීමට සතුරා විනාශ කිරීම කුසලතාවයක් බව රාම්ලීලා ජන නාටකයෙ හි සන්නිවේදනය වේ. ධර්මිෂ්ඨ අයවලුන් ලෙසට මෙම නාටකයෙ හි නම් දරන්නේ අසුරයන් නොහොත් තාඩකා, සූර්පණ්ණිකා, රාවණ, මේඝනාථ ආදී චරිතයන් ය. ඔවුන්ගේ සාත්වික අභිනය යක්ෂයන්, භූතයන් ආදීන්ගේ අමනුෂ්‍ය විලාසය සිහිගන්වයි. ඔවුන්ගේ අශෝභන, අශිෂ්ට, අධම, අශීලත්වය සතර අභිනයෙන් ම ඉදිරිපත් වේ. හින්දු ධර්ම සූත්‍රවලට අනුව ධර්ම ස්ථාපනය සඳහා සතුරා විද්වංශනය කිරීම, ක්ලේශ ප්‍රහීර්ණ කරනු ලැබීම අභ්‍යාස කරනු ලබන ආත්මය විසින් කළ යුතු අනිවාර්ය කටයුත්තක් ලෙස සලකයි. මෙහිදී සතුරා ලෙස නම් කරන්නේ රාගාදී සිත සහ ක්ලේශයයි. රාවණ ප්‍රමුඛ අසුර වර්ගයා ද රාම්ලීලා ජන නාටකයේ නම් කරනුයේ එසේය. (රාම් නගර් රාම්ලීලා තාඩකා මැරීම දර්ශනය 2019.09.10 ) ආත්මය විශ්වීය පරමාත්මය හා මුණගැසීමට නම් සතුරා නොහොත් ක්ලේශය පරාජයට පත් කළ යුතු ම බව මින් අදහස් කරයි.

හින්දු ධර්ම ශාස්ත්‍රවල කිසිදු විටෙක කාමභෝගය අකැප ප්‍රතික්ෂේප කටයුත්තක් ලෙසට කිසිවිටකත් නොදැක්වේ. කාමභෝග සැපත ජීවිතය සමබර කිරීමටත්, ප්‍රීතිමත් කිරීමටත්, මනා වූ ශරීර සෞඛ්‍ය සඳහාත් උපකාරී වන බව රාම්ලිලා ජන නාටකයෙන් සන්නිවේදනය කෙරේ. සූර්පණ්ණිකා රාම කෙරෙහි පෙමින් බැඳී කාමයෙන් මෝහයට පැමිණේ. රාම කොතෙකුත් සූර්පණ්ණිකා ප්‍රතික්ෂේප කරනු රාම්ලීලා ජන නාටකයෙන් ඉදිරිපත් වනු දැකිය හැක. සූර්පණ්ණිකාගේ නාසා ඡේදනය යන දර්ශනය මගින් එය මනාව නිරූපණය කරයි. කාමය නිසා තම අභිමානය, සැපත, විවේකය, බලය, ශ්‍රමය ආදිය සුන්කරගන්නා අයුරුත් අවසානයේ කාන්තාවකට රිසි නොවූ දඬුවමකට මුහුණ දීමට සිදුවන ආකාරයත් සන්නිවේදනය වේ. චිත්‍රකූට ආදි ප්‍රදේශවල පවත්නා රාම්ලීලා ජන නාටකයේ සූර්පණ්ණිකාගේ නාසය පමණක් ම නොව තන පුඩු දෙකත් කපා දමන දර්ශනයන් ඉදිරිපත් වනු දැක ගත හැකිව තිබේ (Awasthi, 1978). ඇතැම් රාම්ලීලා ජන නාටකවල විශ්වාමිත්‍ර මගින් දශරථ කුමරුන්ට දෙනු ලබන ඔවදන් මාධ්‍ය කොට ගනිමින් ද කාමයෙහි භයානක බව උපදේශාත්මක ස්වරූපයෙන් ප්‍රේක්ෂකයාට පහදා දෙනු ලැබේ. මෙම ඉදිරිපත් කිරීම් ස්මෘති ග්‍රන්ථගත ආප්තෝපදේශයන් මෙනෙහි කිරීමට සමත් වන බැව් පෙනේ. ආත්මය මැදුම් පිළිවෙතින් යුක්තව පිනවිය යුතු බව වේදයේ ද අවධාරණය කරන බැව් සිහිපත් කෙරෙන ශ්ලෝක පාඨයන් නිදසුන් කොට ඉදිරිපත් කරයි.

මේ අයුරින් සමාජයේ සාමාන්‍ය ජනයාගේ ජීවිතය ධර්මානුකූලව හා ප්‍රීතියෙන් යුක්තව හසුරවා ගත යුතු ආකාරයත් මෝක්ෂයට මාර්ගය සපයන ශ්‍රද්ධාව නැමැති කෞශල්‍ය වර්ධනය මතින් ඥාන සහ කර්ම මාර්ගය උදාකර ගැනීමට උපකාරවන ජන නාටකයක් ලෙසත් හින්දු දාර්ශනික දෘෂ්ටීන් ස්ථාපිත කරවන්නට හේතුවන ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙසත් හඳුනාගත හැකි විය.

**සමාලෝචනය**

උත්තර් ප්‍රදේශ් ප්‍රාන්තීය සියලු ජනමාධ්‍ය ජාලයක් විසින් ම රාම්ලීලා පැවැත්වෙන සැප්තැම්බර් මාසය පුරා ම මෙම නාටකය පිළිබඳ තොරතුරු වාර්තාකරණයක යෙදේ. කොතරම් දියුණු තාක්ෂණික ලෝකයක ජීවත් වුවත් උත්තර් ප්‍රදේශ් ප්‍රාන්තයේ වැසියෝ රාම්ලීලා දර්ශන කීපයක් හෝ නැරඹීමට තම දෛනික වැඩ කොටස් කළමනාකරණය කර ගනිති. එම අවස්ථාව ප්‍රතික්ෂේප නොකරනුයේ එය හුදෙක් හින්දු ආගම විසින් තම කරපිට පටවනු ලැබූ ආඥා සහගත කර්තව්‍යක් නිසා නොව එය ප්‍රතික්ෂේප කිරීමට තරම් අවශ්‍යතාවයක් ඔවුන් සතුව නොමැති බැවිනි. සංස්කෘතික මූල පද්ධතිය මගින් සැකසුණා වූ දෘෂ්ටිය අනුව යමින් තම ලෞකික මෙන්ම අලෞකික ජීවිතය සාර්ථක කර ගැනීමට දරන උත්සාහයක් ලෙස රාම්ලීලා ජන නාටකය නැරඹීමට හඳුනාගත හැකි ව ඇත. එසේම ඉන් සන්නිවේදනය වන වෛදික හා හින්දු ලබ්ධික ඉගැන්වීම් හා දර්ශනය සරල ව අවබෝධ කරගැනීමට ද මෙම ජන නාටකය ඉවහල් කරගත හැකි විය.

මෙයින් නිගමනය වන ප්‍රධාන කරුණු දෙකක් පවතී. රාම්ලීලා ජන නාටකය ඉන්දීය සංස්කෘතිය පරම්පරාවෙන් පරම්පරාවට පවරා දෙමින් ඉදිරියට ගෙනයනු ලබන්නක් බවත්, එතුළ සිට ඉතා සියුම් ලෙස විවිධ දාර්ශනික න්‍යායාත්මක කරුණු සාමාන්‍ය ජනයා වෙත සම්ප්‍රේෂණය කිරීමට බලවත් උත්සාහයක යෙදෙන්නක් බවත් ය. එක් පසකින් රාම්ලීලා කතා සාරයේ මුළු මහත් ජාතියේ ස්වෛරීය අඛණ්ඩතාව ස්ථාවර කරනු ලැබූ අවස්ථාවක් ස්මරණය කිරීමක් වෙයි. මේ නිසා සෑම ප්‍රේක්ෂකයෙකු තුළ ම ඉන්දියානුවෙකු යන අභිමානය ඇතිවීමට රාම්ලීලා ජන නාටකය හේතුවක් ව ඇත. එසේම තමා කුඩා කල සිට උගත් හින්දු ධර්මයට අනුව ප්‍රායෝගික ව ක්‍රියාවේ යෙදවෙන දෛනික ධාර්මික ප්‍රතිපදාවන් තමා අදහන දේවතාවා විසින් ම වේදිකාවක් හෝ වීදියකට පැමිණ කර පෙන්වයි. ඒ නිසා ම

රාම්ලීලා නාටකයේ ඉන්දියානුවන් විසින් සලකනු ලබන්නේ හුදෙක් නාට්‍යයක් ලෙස නොව ලීලාවක් ලෙසිනි. "ලීලාව" යන්න මා විසින් සාහිත්‍යය විමර්ශනයේදී පෙන්වා දුන් පරිදි ම ප්‍රේක්ෂකයන් ද එකී අර්ථයෙන් ම පිළිගනී. තමා අදහන දේවතාවා සමග ප්‍රේක්ෂකයෝ තදාත්මීය වෙති. එය අඛණ්ඩව රාම්ලීලා පැවැත්වෙන දින 25 හෝ 28 පුරාවට ම පවත්වාගෙන යාමට තරම් ජන නාටකය ශක්‍යතාවක් උසුලයි.

"රාම්ලීලා" ජන නාටකය විනෝදාස්වාදය ලබාදීම මත පමණක් ම ලඝු නොවී මුළු මහත් ඉන්දීය සංස්කෘතිය ම අගයන සාරධර්ම මැනවින් සංවිධිත කර ප්‍රේක්ෂකයා අභිමුවට පමුණුවන ජන නාටකයක් බවට පත්ව ඇත්තේ එබැවිනි.

මෙම පර්යේෂණයේදී ඉහත දැක් වූ කාරණාවන් ඉක්මවා ගිය කාර්යභාරයක් රාම්ලීලා ජන නාටකය විසින් සමාජය අරභයා ඉෂ්ඨ සිද්ධ කරනු ලබන බව නිගමනය විය. එනම් වෛදික ඇදහීම් මගින් පෝෂණය වූ චතුර් වේදයත්, ස්මෘති ග්‍රන්ථගත ආප්තෝපදේශයනුත්, විභින්න ඉන්දියානු දාර්ශනික න්‍යායාත්මක කරුණුත් ඒකරාශී වී ඉදිරිපත් ව ඇති හින්දු ආගමික සංකල්පයක් මෙන් ම යථාර්ථවාදී හින්දු ආගමික ඉගැන්වීම වූ විමුක්ති ප්‍රවේශ මාර්ගයන් රාම්ලීලා ජන නාටකය නැරඹීමෙන් අවබෝධ කරගත හැකිවීමට තරම් එය උසස් සන්නිවේදන ශක්‍යතාවයකින් යුතු ජන නාටකයක් බවට පත්ව ඇති බවට නිගමනය වීමයි.

## ආශ්‍රේය මූලාශ්‍ර

### ප්‍රාථමික මූලාශ්‍ර

Geethawalee. (2012). Geethapress, Uttar Kanda-01. Gorakhpur.

Ramacharithmanas. (2018). Geethapress, Uttar Kanda-01. Gorakhpur.

Harivash Puran. (1968). Barelee Uttar Pradesh Sanskritik Sansthan.

Rigvedth Sanhita. (1957). Swadhmaya Mandal Pradi.

Ramayan. (2016). Rupesh Takur Prasad Prakashan Kenchodiglee, Varanasi.
Valmiki Ramayan. (1962). Godage Publisher. Colombo.

Shrimad Bhagavad Gita Hindi. (1998). Sant Sri Asha Ram Ji Ashram, Motera, Ahmedabad.

**ද්විතීක මූලාශ්‍ර**

බැෂම්,ඒ.ඇල්.(1965).අසිරිමත් ඉන්දියාව,රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

Agrawal, R. (1973). Kambaramayan aur Ramcharitmanas. Kalpana Prakashan.

Awasthi, I. (1979). Ramleela: Parampara aur shiliyaan. Vani Praakashan.

Bashan, A. C. (1954). The wonder that was India. United Kingdom.

Dasgupta, S. N. (1927). Hindu mysticism. Bunglow Road.

Eliot, S. (1921). Hinduism and Buddhism (Vol. II). Broadway House, 68–74 Carter Lane, London E.C. 4.

Kansyakar, C. (2001). Ramleela ke boo varsh: Ayodhya aur Kashi ke sandharba me sakshi (Ank 66). Ayodhya School Sansthan.

Kumar, R. (2010). Hindu prathibha ke darshan. Suraj Prakashan.

Macdonell, A. A. (2005). A history of Sanskrit literature. Cosimo, Old Chelsea Station.

Macfic, Y. M. (1992). Myths and legends of India. An International.

Meheta, B. (2012). Kashi ki Ramleela: Ek elbam. New Delhi.

Meheta, B. (2015). Sri Ramnagar Ramleela. Ayodhya Research Institution.

Mishra, S. (1957). Bhakti andolan aur bhaktikaal. Lok Bharathi Prakashan.

Pande, M. (2003). Bhakti andolan aur suradhas ka kavya. Delhi.

Prakash, O. (1986). Prachin Bharat ka samajik evam arthik itihas. New Delhi.

Sharma, R. (1983). Hindi sahitya ka itihas. Dharaganj.

Tiwari, R. (1955). Sufimat sadhana aur sahithya. Varanasi.

Tlera, L. (1972). Cultural and heritage of India (Vol. 1). University of Prayag.

Vachandev, K. (1995). Sanskrit sahitya ya itihas. National Publication House.

Winternitz, M. (1927). History of Indian literature (Vol. 1). Bunglow Road, Jawahar Nagar.

Winternitz, M. (1927). History of Indian literature (Vol. 1). University of Calcutta.

Yadev, M. (2015). Ramleela ki utpatti tatha vikaas. Ayodhya Research Institution.

**කෝශ ග්‍රන්ථ**

Kumar, R. (Ed.). (2018). *Wruhat Hindi Kosh*. Kendriya Hindi Nideshalaya, Uttara Shiksha Vibhag, Manav Sansandhan Vikash Mantralaya.

William, M. (2005). *Sanskrit-English dictionary*. Asian Educational Services.

# ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ඩිජිටල් කියවීමේ හැසිරීම: ජ්‍යෙෂ්ඨ ද්විතීය පාසල් සිසුන්ට විශේෂිත ව

**ආචාර්ය කුමේෂ් ප්‍රභාෂිණී ගමගේ**

**සංක්ෂේපය**

ඩිජිටල් කියවීම යනු ඩිජිටල් පරිසරය මත පදනම් වූ කියවීමේ හැසිරීමකි. එසේ ම පරිගණක, විද්‍යුත් පොත් කියවනයන්, ටැබ්ලට් හෝ ස්මාර්ට්ෆෝන් වැනි වෙනත් ඉලෙක්ට්‍රොනික කියවීම් පර්යන්ත භාවිත කරමින්, ඩිජිටල් තාක්ෂණය හරහා තොරතුරු සහ දැනුම ලබා ගැනීමට සහ සම්පූර්ණ කියවීම සඳහා තිර මාධ්‍යය භාවිත කිරීම යි. Z පරම්පරාව ලෝක ජනගහනය අනුව විශාලත ම පරම්පරාව යි. කන්තාර්ගේ ජාතික ජන විකාශන සහ ජීවන රටා සමීක්ෂණයට අනුව, ශ්‍රී ලංකා ජනගහනයෙන් 25% ක් Z පරම්පරාව වේ. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වූයේ ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් සිසුන්ගේ ඩිජිටල් කියවීමේ හැසිරීම කෙබඳු ද? යන්න විමර්ශනය කිරීම යි. මූලික අභිමතාර්ථ වූයේ ඩිජිටල් කියවීමේ මාධ්‍ය, ඩිජිටල් කියවීම සඳහා ඇති මනාපය, ඩිජිටල් කියවීම සඳහා ගත කරන කාලය සහ ඩිජිටල් කියවීම හා කඩදාසි කියවීම සඳහා ඇති මනාපය පරීක්ෂා කිරීම යි. මෙම අධ්‍යයනය සමීක්ෂණ ක්‍රමවේදය භාවිත කර ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් සිසුන් 270ක් අතර ජාල සාම්පල සමීක්ෂණයක් සිදු කරන ලදී. ඒ සඳහා ක්‍රමානුකූල නියැදි ක්‍රමය භාවිතා කරන ලදී. SPSS මෘදුකාංගය භාවිතයෙන් එකතු කරන ලද දත්ත විශ්ලේෂණය කරන ලදී. මෙම සමීක්ෂණයෙන් හෙළි වූයේ ද්විතීයික පාසල් සිසුන්ගෙන් අතිබහුතරයක් ඩිජිටල් කියවීමට නිරාවරණය වී ඇති බව යි. ඩිජිටල් කියවීමේ නිරාවරණ අනුපාතය වැඩි වීමට ප්‍රධාන හේතු වනුයේ: (1) ඩිජිටල් මාධ්‍ය යුගයේ අලුත උපන් දරුවන් ලෙස ද්විතීයික පාසල් සිසුන් ඩිජිටල් මාධ්‍යයට ස්වභාවික පිළිගැනීමක් සහ අනුවර්තනයක් පෙන්නුම් කරයි. මන්ද ඔවුන්ගේ ජීවන පරිසරය දැනටමත් විවිධ ඩිජිටල් මාධ්‍යවලින් පිරී ඇත. (2) ඩිජිටල් මාධ්‍ය බොහෝ රූප, වීඩියෝ, ශ්‍රව්‍ය යනාදී විවිධ ආකාරවලින් සරල පාඨ සංකේත සපයනවා පමණක් නොව ද්විතීයික පාසල් සිසුන්ට වඩාත් අවබෝධාත්මක සහ පොහොසත් කියවීමේ අත්දැකීමක් ලබා දෙයි. (3) ඩිජිටල් සම්පත් වෙත ප්‍රවේශ වීමේ පහසුව සිසුන්ට කාලය, අවකාශය සහ ඉදිරිපත් කිරීමේ ක්‍රම මගින් සීමා නොවී විවිධ උපාංග සහ ඉගෙනුම් වේදිකා හරහා උසස් තත්ත්වයේ ඩිජිටල් තොරතුරු ලබා ගැනීමට ඉඩ සලසයි.

**මුඛ්‍ය පද:** Z පරම්පරාව, ඩිජිටල් කියවීමේ හැසිරීම, ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන්, කියවීමේ ආධාරක

## හැඳින්වීම

පරම්පරාව (Generation) යනුවෙන් අදහස් කරන්නේ ජීවන අත්දැකීම් බෙදාගන්නා වූ සමාන වයස්වල පුද්ගලයන් ය. කාලයත් සමග ඔවුන්ට විවිධ ප්‍රධාන සමාජ සහ ඓතිහාසික සිදුවීම් වන ආර්ථික සංවර්ධනය සහ තාක්ෂණික ප්‍රගතිය බලපානු ඇත. විවිධ පර්යේෂණ ආයතන අතර Z පරම්පරාවේ ආරම්භය පිළිබඳ විවිධ මත පවතී. එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව (The United Nations Department of Economic and Social Affairs) ට අනුව 1995 සහ 2010 අතර උපත ලද පරම්පරාව Z ලෙස අර්ථ දක්වයි. එක්සත් ජනපදයේ Pew පර්යේෂණ මධ්‍යස්ථානය එය 1997 සහ 2012 අතර උපත ලද පරම්පරාවක් ලෙස නිර්වචනය කරයි (Dimock, 2019). එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව, වර්තමාන පරම්පරාවන් බූමර් (Boomers), X පරම්පරාව, Y පරම්පරාව සහ Z පරම්පරාව ලෙස බෙදා ඇත. සහශ්‍ර පරම්පරාව (Gen Y) අන්තර්ජාලයේ නැගීම සහ ජංගම දුරකථන පුළුල් ලෙස භාවිත කිරීම වැනි සැලකිය යුතු තාක්ෂණික දියුණුවක් දුටු, බොහෝ විට ශුභවාදී, විවෘත මනසක් සහ ඉහළ අනුවර්තනයක් සහිත පරම්පරාවක් ලෙස සංලක්ෂිත විය. ඔවුන් ඩිජිටල් වේදිකා, සමාජ මාධ්‍ය සහ මාර්ගගත සන්නිවේදනය වැළඳ ගෙන ඇති අතර, තොරතුරු පරිභෝජනය කරන ආකාරය සහ බෙදාගැනීම සහ සමාජ අන්තර්ක්‍රියා සිදු කරන ආකාරයෙ හි සැලකිය යුතු වෙනසක් ඇති කරයි. එහෙත්, Gen Z පරම්පරාව මුළුමනින් ම වර්ධනය වී ඇත්තේ ඩිජිටල් යුගයේ ස්මාර්ට් ජංගම දුරකථන, සමාජ මාධ්‍ය සහ අන්තර්ජාලය කුඩා කල සිට ම ඔවුන්ගේ ජීවිතයේ අනිවාර්ය කොටස් බවට පත් කරගනිමිනි. Gen Z ඩිජිටල් ස්වදේශිකයන් ලෙස හඳුනා ගෙන ඇති අතර, ආයාසයකින් තොරව තාක්ෂණයෙ හි සැරිසැරීමට සහ එය ස්වයං ප්‍රකාශන සහ සමාජ සම්බන්ධතා මාධ්‍යයක් ලෙස සක්‍රීය ව භාවිත කරයි (Wandhe, 2024). අන්තර්ජාලය භාවිත කිරීමට දක්ෂ සහස්‍ර පරම්පරාවට (Gen Y) සාපේක්ෂව Gen Z අන්තර්ජාලය භාවිත කිරීමට පුරුදු වී ඇත. එනම් සහස්‍ර පරම්පරාවේ අන්තර්ජාල භාවිතය පුරුද්ද මත පෝෂණය වන අතර Z පරම්පරාවට අන්තර්ජාලය භාවිත කිරීමේ පුරුද්ද සහජයෙන් ම උරුම වී ඇත.

අන්තර්ජාල තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමග ම, නිශ්චිත ජීවන චක්‍රයක් සහිත තරුණ කණ්ඩායමක් ලෙස Z පරම්පරාව සමාජයේ

විවිධ අංශ විසින් පුළුල් ලෙස අවධානයට පත්ව ඇත. 2020 දී එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව, Z පරම්පරාව 2019 දී ගෝලීය වශයෙන් බිලියන 2.4ක ජනතාවක් කරා ළඟා වූ අතර එය ලෝකයේ මුළු ජනගහනයෙන් 32%ක් වන අතර විශාලතම පරම්පරාව බවට පත්විය. කන්තාර්ගේ ජාතික ජනවිකාස සහ ජීවන රටා සමීක්ෂණය (National Demographic and Lifestyle Survey -NDLS) ට අනුව ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ජනගහනය ආසන්න වශයෙන් 25% කි. මෙම පිරිස අපගේ කුටුම්භවලින් 58%ක වාසය කරන අතර ඔවුන් මහා පරිමාණ සංස්කෘතික පරිවර්තනයක කොටසක් ද වන බව දක්වයි. මෙම පිරිස තාක්ෂණය සමඟ ජීවත් වන අතර ශක්තිමත් සබැඳි පැවැත්මක් ඇත. ඔවුන්ගෙන් 94%ක් දිනපතා අන්තර්ජාලය පරිහරණය කරන අතර එය ඔවුන්ගේ ප්‍රියතම තොරතුරු මූලාශ්‍රය වේ. එය ඔවුන්ගේ සිතීමේ හැසිරීම, ඔවුන් ක්‍රියා කරන ආකාරය සහ ලෝකය අත්විඳින ආකාරය හැඩගස්වයි. ඒ අතර ම, 49%ක් දිනපතා දේශීය අන්තර්ගතය රූපවාහිනියෙන් නරඹන අතර 44%ක් සමාජ මාධ්‍ය හරහා පරිභෝජනය කරයි (Island Alchemists: Gen Z Reboots Sri Lanka’s Narrative, 2024).

ඒ අනුව ඩිජිටල් ක්ෂේත්‍රයේ ප්‍රධාන පරිශීලකයන් ලෙස Z පරම්පරාව ක්‍රමයෙන් ඩිජිටල් කියවීමේ ප්‍රධාන බලවේගය බවට ශ්‍රී ලංකාවේ ද පත්ව ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ඩිජිටල් කියවීමේ හැසිරීම කෙබඳු ද? යන පර්යේෂණ ගැටලුව මූලික කරගනිමින් Z පරම්පරාව නියෝජනය කරන්නා වූ ජ්‍යෙෂ්ඨ ද්විතීය පාසල් සිසුන් ආශ්‍රිත ව මෙම අධ්‍යයනය සිදු කරන ලදී. තව ද ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ඩිජිටල් කියවීමේ ස්වරූප, ඒවායේ ඇති ප්‍රායෝගික ගැටලු සහ අභියෝගයන් හඳුනා ගැනීම ද මෙම අධ්‍යයනය ඔස්සේ සිදු කරනු ලැබේ.

## සාහිත්‍ය විමර්ශනය

### ඩිජිටල් කියවීම පිළිබඳ අර්ථ විග්‍රහය

කියවීමේ හැසිරීම (Reading Behavior) යනු කිසියම් අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීමේ දී පාඨකයකු මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යවල ඇති ඕනෑ ම කියවීමේ ද්‍රව්‍යයක් තෝරා ගැනීම, ලබා ගැනීම සහ භාවිත කරන ආකාරය ලෙස අර්ථ දැක් වේ (Soroya & Ameen, 2020).

ඩිජිටල් කියවීම යනු ඩිජිටල් ආකෘතියක ඇති පෙළකින් අර්ථය උකහා ගැනීමේ ක්‍රියාවලිය බව සරලව අපට අර්ථ දැක්විය හැකි ය. ඩිජිටල් කියවීම පිළිබඳ ප්‍රධාන අර්ථයන් දෙකක් වේ. පළමු අර්ථය වන්නේ කියවීමේ විෂය වස්තුව (Object) හෙවත් කියවීමේ අන්තර්ගතය (Content) ඩිජිටල් ලෙස ඉදිරිපත් කිරීම යි. එනම්, විද්‍යුත් පොත්, මාර්ගගත නවකතා, විද්‍යුත් සිතියම්, ඩිජිටල් ඡායාරූප, බ්ලොග්, වෙබ් පිටු ආදිය යි. දෙවැනි අර්ථය වන්නේ කියවීමේ ක්‍රම ඩිජිටල්කරණය කිරීමයි. එනම් කියවීමේ වාහකය (carrier) සහ පර්යන්ත (terminal) මුද්‍රිත කඩදාසි නොව, පරිගණක තිර, PDA (Personal Digital Assistant), MP3, MP4, ලැප්ටොප්, ජංගම දුරකථන, ඩිජිටල් රීඩර් වැනි තිර සංදර්ශක සහිත ඉලෙක්ට්‍රොනික උපකරණ ඔස්සේ කියවීම යි (Nordquist, 2017). 'ඩිජිටල් කියවීම' යන්න නිර්වචනය කරන්නේ 'ඩිජිටල් උපාංගයක ඇති පෙළකින් පරිගණක, ටැබ්ලට්, ජංගම දුරකථන සහ ඊ-කියවන ඔස්සේ තොරතුරු උකහා ගැනීමේ ක්‍රියාවලිය ලෙසිනි (Lim & Toh, 2020). සංඛ්‍යාංක කියවීමේ පුළුල් නිර්වචනය යනු වාහකය, අවස්ථාව හෝ ස්වරූපය කුමක් වුවත්, සංජානනය ඩිජිටල් ආකාරයෙන් ලබා ගැනීමේ හෝ සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලිය යි. එය ඕනෑ ම ඩිජිටල් පර්යන්තයක් (වෙබ් බ්‍රවුසරයක්, විද්‍යුත් පොත් කියවනය, විද්‍යුත් කඩදාසි ආදිය), ඕනෑ ම ආකෘතියක් (විවිධ පෙළ, රූප, ශ්‍රව්‍ය) සහ ඕනෑ ම තාක්ෂණික ක්‍රමයක් හරහා විය හැකි ය. එය සමාජ කියවීම හෝ පුද්ගලික කියවීමේ අන්තර්ක්‍රියාකාරී, කාල සහ අවකාශය විය හැකි ය. ඒ අනුව මාධ්‍යය කුමක් වුවත්, කියවීම බොහෝ සංජානන ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය ඇතුළත් සංකීර්ණ කුසලතාවකි. දක්ෂ පාඨකයින් තුළ කියවීමේ අවබෝධය වේගවත්, කාර්යක්ෂම, අන්තර්ක්‍රියාකාරී සහ උපායමාර්ගික ක්‍රියාවලීන්ගේ අවසාන නිෂ්පාදනය යි (Wylie et al.,2018).

ඩිජිටල් කියවීමේ මූලික ලක්ෂණ හතරක් ඇති බව හඳුනාගත හැකි ය. පළමුවැන්න ඩිජිටල්කරණය යි. (Digitalization). එනම් කියවීමේ අන්තර්ගතයේ ඩිජිටල් ඉදිරිපත් කිරීම, කියවීමේ වාහක මත ඩිජිටල් මෙවලම් යැපීම සහ කියවීමේ ක්‍රමවල ඩිජිටල් ආකෘතිය යි. දෙවැන්න මාධ්‍ය කේන්ද්‍රීයභාවයයි (Media Oriented). එනම් බහුමාධ්‍ය පරිසරයන් තුළ ප්‍රකාශ වීම සහ මාධ්‍ය යුගයේ මාධ්‍ය සංස්කෘතියේ දැඩි බලපෑමට ලක්වීම යි. තෙවැන්න ගතිකත්වය යි (Dynamism). එනම් ප්‍රධාන වශයෙන් කියවීමේ වස්තුව ගතික තිරයක්, ගතික පෙළ,

රූප සහ වෙනත් සංකේත ලෙස ප්‍රකාශ වීම යි. සිව්වැන්න අන්තර්ක්‍රියාකාරීත්වය යි (Interactivity). එනම් ප්‍රධාන වශයෙන් ඩිජිටල් කියවීමේ හැකියාව පාඨකයන් සහ කතුවරුන් අතර ද්වි-මාර්ගික සහ අන්තර්ක්‍රියා සහ තත්‍ය කාලීන සන්නිවේදනය සාක්ෂාත් කර ගැනීමේ හැකියාව තුළ ප්‍රකාශ වීම යි.

## ඩිජිටල් කියවීම වර්ධනය කිරීම

සංඛ්‍යාංක කියවීම ආරම්භ වන්නේ විද්‍යුත් පොත් භාවිතයට පැණීමත් සමග යි. විද්‍යුත් පොත්වල ඉතිහාසය 1930 දශකය දක්වා දිව යයි. ඇමරිකානු ලේඛක බොබ් බ්‍රවුන් වේගයෙන් පෙළ කියවීමේ අවශ්‍යතාවය හඳුනා ගත් අතර එය යථාර්ථයක් බවට පත් වන්නේ වර්ෂ 1949 දී ස්පාඤ්ඤ පාසල් ගුරුවරියක් වන Angela Ruiz Roble විසින් ස්වයංක්‍රීය පොතක් නිර්මාණය කිරීමත් සමග යි. තම දරුවන්ගේ බර පෙළ පොත් සම්පාදනයට එය නිර්මාණය කළ ද ඇයගේ නව නිපැයුම ඉලෙක්ට්‍රොනික නොව ස්වයංක්‍රීය විය. විද්‍යුත් පෙළ පොතක සැබෑ ආරම්භය සිදු වන්නේ ඉන් වසර විස්සකට පසුවයි. ඉලිනොයිස් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු වන Michael S. Hart විසින් විශ්වවිද්‍යාල පර්යේෂණාගාරයක Xerox Mainframe පරිගණකයක් සහිත ප්‍රථම විද්‍යුත් පොත නිර්මාණය කරන ලදී. පළමු විද්‍යුත් පොත අන් කිසිවක් නොව ඇමරිකානු නිදහස් ප්‍රකාශනය යි. එය සත්‍ය වශයෙන් ම පත්‍රිකාවක් විය. 1971 දී ඔහුගේ ප්‍රථම විද්‍යුත් ප්‍රකාශනය දියත් කිරීමෙන් පසු හාර්ට් විසින් අයිතීන් පිළිබඳ පනත් කෙටුම්පත, ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ බයිබලයේ ඩිජිටල් පිටපත් නිර්මාණය කළේය (Team, 2023). ඒ අනුව 1750 දී පමණ මිනිසුන් ලේඛන කියවන ආකාරයෙ හි විශාල වෙනසක් සිදු විය. එතෙක් මුද්‍රිත පොතපත ඉතා සමීපව සහ ගැඹුරින් කියවීම (Intensive reading) සිදු විය. වර්ෂ 1800 මුල් භාගයේ යාන්ත්‍රිකකරණයේ වර්ධනයත් සමඟ බහුවිධ මාධ්‍ය ඔස්සේ බොහෝ දේ කියවීම (Extensive reading) දක්වා පරිවර්තනය විය (Liu, 2012).

විද්‍යුත් පොත් කියවීමේ අර්ථයට ප්‍රවර්ග දෙකක් ඇතුළත් වේ. ඉන් පළමුවැන්න වන්නේ අන්තර්ජාලය හරහා පරිගණක හෝ ජංගම දුරකථන වැනි උපාංගවලින් බාගත හැකි ඊ-පොත් (e-books) ඔස්සේ කියවීම යි. දෙවැන්න විද්‍යුත් පොත් කියවනයන් (e-readers)

භාවිතයෙන් කියවීම යි (Siegenthaler et al., 2010). විවිධ පාඨකයන්ගේ ජනප්‍රියතාවත් සමග දෙවැනි වර්ගයේ Kindle වැනි විද්‍යුත් පොත් කියවීම ක්‍රමයෙන් ප්‍රමුඛ වේ. මෙම අවස්ථාවේ දී, කියවීම යනු අන්තර්ගතය නොවෙනස් ව තිබිය දී කඩදාසිවලින් පමණක් ඈත් ව කියවීම යි. එය තවමත් පොත් ප්‍රකාශනය කිරීමේ දී ප්‍රකාශන ආයතනය විසින් පිහිටුවා ගත් තොරතුරු හා දැනුම ලෙස හැඳින්විය හැකිය. මූලික වශයෙන්, මෙය පරිවර්තනයක් හෝ අනුකරණයක් වශයෙන් වන හැසිරීමකි. අන්තර්ජාලයේ සංවර්ධනය හා පරිණතභාවය සමග ජාල කියවීම ඉස්මතු වී ඇත. අන්තර්ජාල කියවීම "මාර්ගගත කියවීම" ලෙස ද හැඳින්වේ. පරිගණක සහ ඊට අනුබද්ධ උපාංග මඟින් සංසරණය වන ඩිජිටල් තොරතුරු පාඨ කියවීම සඳහා ජාල තාක්ෂණය, බහුමාධ්‍ය පරිගණක තාක්ෂණය සහ ජංගම සන්නිවේදන තාක්ෂණය මත පාඨකයන් රඳා පැවතීම අධිපෙළ කියවීමේ හැසිරීමකි. මානවරූපී පරිගණක අන්තර්ක්‍රියා මගින් අර්ථය ගොඩනැගීම සම්පූර්ණ කිරීම සඳහා පෙළ සහ රූප ඇතුළු විවිධ බහුමාධ්‍ය තොරතුරු සම්පත් කියවා ග්‍රහණය කර ගනී. මාර්ගගත කියවීම පදනම් වී ඇත්තේ පරිගණක සහ අන්තර්ජාල වේදිකා මතය. 'Hypertext' යනු 1965 දී ඇමෙරිකානු විශාරද Ted Nelson විසින් නිර්මාණය කරන ලද නව යෙදුමකි (Hoffmann, 2023). 1980 දශකයේ මැද භාගයේ දී තනි පේළි ප්‍රකාශනයන් හි අධිපෙළ බහුල ව භාවිත වූ අතර 1990 ගණන් වන විට එය අන්තර්ජාල ප්‍රකාශනයේ ජනප්‍රිය භාවිතයක් බවට පත් විය.

පසුගිය ශතවර්ෂය අවසානයේ අන්තර්ජාලයේ වර්ධනයත් සමග ''ඉලෙක්ට්‍රොනික කියවීම" සහ "මාර්ගගත කියවීම" වැනි සංකල්ප සියල්ල ම ජංගම කියවීම, ඩිජිටල් කියවීම සහ තිර කියවීම වැනි නව නිර්වචනවලට පරිවර්තනය වී ඇත. කෙසේ වුව ද තාක්ෂණයේ දියුණුවත් සමග එම අර්ථ ඡේදනය වීමට සහ යම්තාක් දුරකට වියවුල් සහගතවීමට පටන් ගෙන තිබේ. වර්තමාන තොරතුරු තාක්ෂණයේ සහ ඩිජිටල් තාක්ෂණයේ දියුණුවත් සමග නව මාධ්‍ය පරිසරයේ ඉලෙක්ට්‍රොනික කියවීම, තිර කියවීම, මාර්ගගත කියවීම සහ ජංගම කියවීම වැනි කියවීමේ ආකෘතිවලට තවදුරටත් පැවතිය නොහැකිය. අදාළ සංකල්ප ක්‍රමයෙන් ඩිජිටල් කියවීම වශයෙන් ප්‍රතිස්ථාපනය වී ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

2022 දෙසැම්බර් 3 සිට 2023 පෙබරවාරි 15 දක්වා, ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් සිසුන් අතර ජාල නියැදි සමීක්ෂණයක් (Network Sample System) පවත්වන ලදී. ඒ අනුව ද්විතීයික පාසල් සිසුන් 270ක් මෙම අධ්‍යයනයට සහභාගී විය. Z පරම්පරාව සඳහා සමීක්ෂණ විෂය ලෙස ද්විතීයික පාසල් සිසුන් තෝරා ගැනීමට හේතු වනුයේ; පළමුව ශ්‍රී ලංකාවේ වැඩිම Z පරම්පරාවක් සිටින කණ්ඩායම වන්නේ ද්විතීයික පාසල් සිසුන් ය. දෙවනුව ද්විතීයික පාසල් සිසුන්ට දැනටමත් ඉගෙනීමේ හැකියාව, විවේචනාත්මක චින්තන හැකියාව සහ ඩිජිටල් උපාංග මෙහෙයුම් හැකියාව යම් මට්ටමක පවතී. තෙවනුව ද්විතීයික පාසල් සිසුන් සාපේක්ෂ ව අඩු අධ්‍යයන පීඩනයකට මුහුණ දෙන අතර විෂය බාහිර කියවීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඇත. එබැවින් ද්විතීයික පාසල් සිසුන් යනු කියවීමේ කුසලතා වර්ධනය කිරීම සහ ඩිජිටල් කියවීමේ පුරුදු වර්ධනය කිරීම සඳහා තීරණාත්මක කාල පරිච්ඡේදයක් නියෝජනය කරන කණ්ඩායම කි. ඒ අනුව බස්නාහිර පළාතට අයත් කොළඹ, කළුතර සහ ගම්පහ යන ප්‍රදේශවල නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන සිසුන් වෙත ප්‍රශ්නාවලී බෙදාහරින ලදී. 2020 පාසල් සංගණනයට අනුව ද්විතීයික සිසුන් බහුතරයක් සංකේන්ද්‍රණය වී ඇත්තේ බස්නාහිර පළාතේ වීම ඊට හේතුව යි.

මෙම අධ්‍යයනයේ දී භාවිත කරන ලද ප්‍රශ්නාවලිය බහුවරණ ප්‍රශ්න 28 ක් ආවරණය කරමින් සම්පාදනය කර ඇති අතර කොටස් දෙකකට බෙදා ඇත. පළමු කොටස ප්‍රධාන වශයෙන් ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ශ්‍රේණිය යනාදිය පිළිබඳ මූලික තොරතුරු වේ. දෙවැනි කොටස ඩිජිටල් කියවීමේ තත්ත්වය පිළිබඳ ප්‍රශ්නාවලියකි. එය කියවීමේ මෙවලම්, කියවීමේ වේලාව, කියවීමේ අවස්ථා, කියවීමේ හැසිරීම් වර්ග, අන්තර්ගතය කියවීම හා අදාළ සාහිත්‍යය වෙත යොමු කිරීම සහ යථාර්ථය සමඟ ඒකාබද්ධ කිරීම මත පදනම් වූ කියවීමේ අභිප්‍රේරණය වැනි මූලික මාන හයක් ස්ථාපිත කරයි. ප්‍රශ්නාවලියේ හැඩගැස්ම පහත වගුවේ දක්වා ඇත.

| අංකය | මානය | විෂය |
|---|---|---|
| 1 | කියවීමේ විලාසය | Q19、Q21、Q9、Q10 |
| 2 | කියවීමේ ආකල්පය | Q11、Q18、Q24、Q25、Q26 |
| 3 | කියවීමේ කාලය | Q12、Q13、Q14、Q15、Q16 |
| 4 | කියවීමේ ස්ථානය | Q17 |
| 5 | අන්තර්ගතය කියවීම | Q22 |
| 6 | කියවීමේ අභිප්‍රේරණය | Q23、Q28 |
| 7 | ස්වයං ඇගයීම | Q20、Q27 |

වගුව 1 : ද්විතීක පාසල් සිසුන් සඳහා ප්‍රශ්නාවලියේ හැඩගැස්ම

රැස්කරගනු ලැබූ දත්ත SPSS මෘදුකාංගය ඔස්සේ විශ්ලේෂණය කරන ලද අතර ඒ ඔස්සේ නිගමන සහ යෝජනාවන්ට එළඹෙන ලදී.

## දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව

## නියැදි දත්තවල සමස්ත විශ්ලේෂණය

සමීක්ෂණය සඳහා හැකි තරම් සිසුන් ආකර්ෂණය කර ගැනීම වෙනුවෙන සිංහල සහ ඉංග්‍රීසි භාෂා ද්විත්වයෙන් ම ප්‍රශ්නාවලියක් නිර්මාණය කරන ලදී. මෙම අධ්‍යයනයට සහභාගිවන්නන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය, වයස, දිස්ත්‍රික්කය, ජීවත්වන ප්‍රදේශය, පාසල, ශ්‍රේණිය, විෂය සහ භාෂාව යන සංඛ්‍යා ලේඛන ප්‍රතිඵල වගු අංක 2 හි දක්වා ඇත.

| පුද්ගලික ලක්ෂණ | ප්‍රවර්ග | සංඛ්‍යා | ප්‍රතිශතය |
|---|---|---|---|
| ස්ත්‍රී- පුරුෂභාවය | පිරිමි | 104 | 38.52% |
| | ගැහැණු | 166 | 61.48% |
| වයස | අවුරුදු 15 | 38 | 14.07% |
| | අවුරුදු 16 | 39 | 14.44% |
| | අවුරුදු 17 | 36 | 13.33% |
| | අවුරුදු 18 | 54 | 20% |
| | අවුරුදු 19 | 64 | 23.7% |

| | | | |
|---|---|---|---|
| | අවුරුදු 20 | 20 | 7.4% |
| | අවුරුදු 20 ට වැඩි | 19 | 7.04% |
| දිස්ත්‍රික්කය | කොළඹ | 82 | 30.37% |
| | කළුතර | 91 | 33.7% |
| | ගම්පහ | 97 | 35.93% |
| ජීවත්වන ප්‍රදේශය | නාගරික | 100 | 37.03% |
| | අර්ධ නාගරික | 111 | 41.11% |
| | ග්‍රාමීය | 59 | 21.85% |
| පාසල | ජාතික පාසල් | 193 | 71.48% |
| | පළාත් පාසල් | 25 | 9.26% |
| | අර්ධ රජයේ පාසල් | 21 | 7.78% |
| | පෞද්ගලික පාසල් | 17 | 6.29% |
| | වෙනත් | 14 | 5.18% |
| ශ්‍රේණිය | 10 ශ්‍රේණිය | 39 | 14.44% |
| | 11 ශ්‍රේණිය | 38 | 14.07% |
| | 12 ශ්‍රේණිය | 71 | 26.3% |
| | 13 ශ්‍රේණිය | 122 | 45.19% |
| විෂය ධාරාව | කලා විෂය ධාරාව | 145 | 53.7% |
| | ගණිත විෂය ධාරාව | 20 | 7.4% |
| | විද්‍යා විෂය ධාරාව | 23 | 8.52% |
| | වාණිජ විෂය ධාරාව | 21 | 7.78% |
| | වෙනත් -සා/පෙළ ශ්‍රේණි | 61 | 22.59% |
| භාෂාව | සිංහල මාධ්‍යය | 225 | 83.33% |
| | ඉංග්‍රීසි මාධ්‍යය | 37 | 13.7% |
| | දෙමළ මාධ්‍යය | 0 | 0 |
| | ද්විභාෂා | 8 | 2.96% |
| | ත්‍රෛභාෂික | 0 | 0 |

වගුව 2: පුද්ගල ලක්ෂණ පිළිබඳ සංඛ්‍යාන විශ්ලේෂණ ප්‍රතිඵල (පුද්ගලයන් 270)

මෙහිදී සමීක්ෂණයට ලක් කරන ලද ද්විතීයික පාසල් සිසුන් 270 අතර පිරිමි සිසුන් 104 ක් සිටියේය. එය සමස්ත සමීක්ෂණ නියැදියෙන් 38.52% කි. ශිෂ්‍යාවන් සංඛ්‍යාව 166 ක් වන අතර එය මුළු නියැදියෙන් 61.48% කි. ඒ අනුව ගැහැණු සිසුන්ගේ අනුපාතය පිරිමි සිසුන්ට වඩා වැඩි ය.

සමීක්ෂණ ප්‍රතිඵල පෙන්නුම් කරන්නේ අධ්‍යයන විෂයයන් වෙනුවෙන් වයස අවුරුදු 19 සිසුන් 64 (23.70%) ක්, අවුරුදු 18 සිසුන් 55 (20%) ක්, අවුරුදු 17 සිසුන් 36 (13.33%) ක්, අවුරුදු 16 සිසුන් 39

(14.44%) ක්, අවුරුදු 15 සිසුන් (14.07%) දක්වා බෙදී යන බව යි. ප්‍රධාන වශයෙන් 13 ශ්‍රේණියේ සිසුන් 122 (45.19%) ක නියෝජනය අනෙක් ශ්‍රේණි ත්‍රිත්වයට වඩා දක්නට ලැබේ.


පර්යේෂණ නියැදියට අනුව නාගරික සිසුන් 100 (37.03%) සහ අර්ධ නාගරික සිසුන් 111 (41.11%) ක නියෝජනයක් දක්නට ඇත. පාසල් බඳවා ගැනීම් අනුව බහුතරයක් සිසුන් එනම් 193 (71.48%) ක් ජාතික පාසල්වලට ඇතුළත් වේ. භාෂා ඉගෙනීම සම්බන්ධයෙන් ගත් කළ, සිංහල මාධ්‍යය කතා කරන සිසුන්ගේ සංඛ්‍යාව ඉහළම අගය වන අතර එය 225 (83.33%) කි. එයින් ඇඟවෙන්නේ ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් තවමත් ඉංග්‍රීසි අතිරේක විෂයක් ලෙස දේශීය භාෂාව ඉගෙනීමේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන බවයි.

**ඩිජිටල් කියවීමේ වත්මන් තත්ත්වය විශ්ලේෂණය කිරීම**

**ද්විතීයික පාසල් සිසුන් ඩිජිටල් කියවීමට නිරාවරණය වීම**


Z පරම්පරාවේ ද්විතීයික පාසල් සිසුන් ජීවත් වන පරිසරය ඩිජිටල් මාධ්‍යවලින් සමන්විත වේ. මෑත වසරවල දී ඩිජිටල් මාධ්‍ය ද්විතීයික පාසල් සිසුන් අතර වැඩි වැඩියෙන් ජනප්‍රිය වී ඇත. වීඩියෝ සහ වෙනත් ශ්‍රව්‍ය දෘශ්‍ය මාදිලි වඩාත් ප්‍රචලිත ව තිබිය දී එම ජනප්‍රියත්වය වැඩි වී ඇති බව අවධානයට ගත යුතු ය.

ද්විතීයික පාසල් සිසුන් ද ඩිජිටල් මාධ්‍යයට ස්වභාවික පිළිගැනීමක් සහ අනුවර්තනයක් පෙන්නුම් කර ඇත. මේ සියල්ල අද ද්විතීයික පාසල් සිසුන් ඩිජිටල් කියවීම සඳහා නිරාවරණය වීමේ අනුපාතය ක්‍රමයෙන් වැඩි වීමට හේතු වී තිබේ. ශ්‍රී ලංකාවේ ඩිජිටල් කියවීම පිළිබඳ මෙම සමීක්ෂණයෙන් පෙනී යන්නේ ද්විතීයික පාසල් සිසුන්ගෙන් අති බහුතරයක් ඩිජිටල් කියවීමට නිරාවරණය වී ඇති බව යි. ඒවා අතර, ජංගම දුරකථන (80.37%) සහ ලැප්ටොප් පරිගණක ඔස්සේ (66.30%) ඩිජිටල් කියවීමේ අනුපාතය සාපේක්ෂව ඉහළ අගයක් ගනී. ඩෙස්ක්ටොප් පරිගණක (55.93%), සීඩී (44.45%) හරහා කියවීම සහ MP3 | MP4 | MP5 (39.26%) දක්නට ඇත. ටැබ්ලට් පරිගණකය (38.15%) සහ E-reader (16.67%) වෙත සාපේක්ෂව අඩු අගයක් ගනී. තව ද, ද්විතීයික පාසල් සිසුන්ගෙන් 7.04%ක් කිසිදු ඩිජිටල් කියවීමේ මාධ්‍යයකට නිරාවරණය වී නොමැත. ප්‍රස්තාරය අංක 1 ට අනුව මාධ්‍ය නිරාවරණය සහ මාධ්‍ය භාවිතය අතර ධනාත්මක සහසම්බන්ධයක් ඇත.




රූපය 1. ද්විතීයික පාසල් සිසුන් ඩිජිටල් මාධ්‍ය සඳහා නිරාවරණය වන මාධ්‍යයේ ස්වභාවය

ශ්‍රේණි මට්ටමේ ඉදිරි දර්ශනයෙන් ද්විතීයික පාසල් සිසුන් අතර ඩිජිටල් කියවීමේ ක්‍රමවල අනුපාතය වැඩිදියුණු වී ඇත. ඒ අතරින් ඩෙස්ක්ටොප් පරිගණක 15.38% සිට 36.07% දක්වාත්, ලැප්ටොප් පරිගණක 52.46% සිට 58.97% දක්වාත්, ටැබ්ලට් පරිගණක (iPad වැනි) 15.38% සිට 31.15% දක්වාත්, ජංගම දුරකථන 71.79% සිට 77% දක්වාත්, E- reader (Kindle වැනි) 2.56% සිට 9.84% දක්වාත්, MP3 | MP4 | MP5 2.56% සිට 17.21% දක්වාත්, සීඩී 2.56% සිට 10.66% දක්වාත් ඉහළ ගොස් ඇත.





රූපය 2. විවිධ කාණ්ඩවල ද්විතීයික පාසල් සිසුන්ගේ ඩිජිටල් මාධ්‍ය භාවිතය

මෙයින් පෙන්නුම් කරන්නේ ද්විතීයික පාසල් සිසුන් ඩිජිටල් කියවීමේ මාධ්‍යයට නිරාවරණය වීම ඉගෙනුම ලබන ශ්‍රේණියේ වර්ධනයත් සමග ක්‍රමයෙන් වැඩි ව ඇති බව යි. සිසුන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව දත්ත විශ්ලේෂණය කිරීමේ දී පෙනී යනුයේ ශිෂ්‍යයින්ට වඩා ශිෂ්‍යාවන් ඩෙස්ක්ටොප් පරිගණක, ලැප්ටොප්, MP3 | MP4 | MP5, සහ සීඩී තැටිවලට නිරාවරණය වීම ඉහළ මට්ටමක පවතින බවයි. ශිෂ්‍යයන්ට වඩා ශිෂ්‍යාවන් විද්‍යුත් පාඨකයන් ලෙස සැලකිය යුතු තරම් ඉහළ අගයක සිටියි. ඩෙස්ක්ටොප් පරිගණක සඳහා ශිෂ්‍යයන් සහ ශිෂ්‍යාවන් යන දෙකොටඨාසය ම අනුකූලතාවක් දක්වයි. ද්විතීයික පාසල් සිසුන් අතර ඩිජිටල් කියවීමේ මාධ්‍යයක් ලෙස ජංගම දුරකථන භාවිතයට පිරිමි සහ ගැහැණු ළමුන් දෙපාර්ශ්වය ම වැඩි නැඹුරුවක් දක්වයි. කලාපීය දෘෂ්ටිකෝණයකින් විශ්ලේෂණය කිරීමේ දී කොළඹ, කළුතර සහ ගම්පහ ප්‍රදේශයන් හි නාගරික, අර්ධ නාගරික සහ ග්‍රාමීය සිසුන් ජංගම දුරකථන සහ ලැප්ටොප් පරිගණක භාවිතයට වැඩි නැඹුරුවක් ඇති බව පැහැදිලි වේ.

## ඩිජිටල් කියවීම සඳහා සිසුන්ගේ මනාපය

සමස්තයක් වශයෙන්, ද්විතීයික පාසල් සිසුන්ගෙන් බහුතරයක් ඩිජිටල් කියවීම කෙරෙහි ශුභවාදී ආකල්පයක් දරයි. එය ද්විතීයික

පාසල් සිසුන්ගෙන් 48.38% කි. 37.18% ක් ඩිජිටල් කියවීම කෙරෙහි මධ්‍යස්ථ ආකල්පයක් දරයි. තව ද, ද්විතීයික පාසැල් සිසුන්ගෙන් 10.11%ක් ඩිජිටල් කියවීමට කැමත්තක් නොදක්වයි. 4.33% ක් රූප සටහන 3 හි පෙන්වා ඇති පරිදි ඩිජිටල් කියවීමට අතිශයින් අකමැති බව පැහැදිලි ය.





රූපය3. ද්විතීයික පාසල් සිසුන්ගේ ඩිජිටල් කියවීම සම්බන්ධ ආකල්පවල ස්වභාවය

## ද්විතීයික පාසල් සිසුන්ගේ ඩිජිටල් කියවීමේ අවකාශීය ව්‍යාප්තිය

ඩිජිටල් මාධ්‍ය මතුවීම හේතුවෙන් විශේෂයෙන් ම ස්මාර්ට්ෆෝන්, ටැබ්ලට් ආදිය ඔස්සේ කියවීමේ පාඨ (Reading Text) සහ කියවීමේ සම්පත් (Reading Resources) වෙත වඩාත් පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි වී ඇත. එපමණක් නොව ඩිජිටල් මාධ්‍ය භාවිතය පහසු වන අතර, ඩිජිටල් කියවීම සඳහා කාලය සහ අවකාශයේ සීමාවන්ගෙන් මිදීම පහසු කරයි. මෙම සමීක්ෂණයේ රූප සටහන 4 හි පෙන්වා ඇති පරිදි, ද්විතීයික පාසල් සිසුන් වැඩි කාලයක් පාසලෙන් පසු (40.43%), සති අන්තයේ (26.71%) සහ පාසල් නිවාඩු දිනවල (17.69%) ඩිජිටල් කියවීමට ගත කරන බව සොයා ගන්නා ලදී. කුඩා සිසුන් සංඛ්‍යාවක් පන්ති කාලය තුළ (6.86%) සහ ආහාර වේලාව (6.86%) තුළ ඩිජිටල් මාධ්‍ය භාවිත කරනු ඇත. සිසුන්ගෙන් ඉතා කුඩා ප්‍රතිශතයක් (1.81%) පන්ති වෙනස්වන කාල සීමාව තුළ කියවීමට ඩිජිටල් මාධ්‍ය භාවිත කර ඇත. ද්විතීයික පාසල් සඳහා ඩිජිටල්

කියවීමේ කාලය වෙන් කිරීම සාපේක්ෂ ව බණ්ඩනය වී විසිරී ඇති බව දැකිය හැකිය.





රූපය 4. ද්විතීයික පාසල් සිසුන් ඩිජිටල් කියවීම සඳහා ගත කරන කාලය

රූප සටහන 5 හි පෙන්වා ඇති පරිදි කියවීමට ගත කළ කාලයෙහි ඉදිරි දර්ශනය අනුව ද්විතීයික පාසල් සිසුන් 27.44% ක් දිනකට පැය භාගයකට වඩා අඩු කාලයක් ඩිජිටල් කියවීමක් සඳහා ගත කරයි. ක් සෑම දිනක ම 23.10% ක් පැයකට අඩු කාලයක් කියවීමට වැය කරයි. සිසුන්ගෙන් 22.38% ක් ඩිජිටල් කියවීමට දිනකට පැය 2කට වඩා අඩු කාලයක් වැය කරන අතර සිසුන්ගෙන් 15.16% ක් ඩිජිටල් කියවීමට දිනකට පැය 3කට වඩා අඩු කාලයක් වැය කරති. ඩිජිටල් කියවීමට දිනකට පැය 5කට වඩා සාමාන්‍යයක් වැය කරන්නේ සිසුන්ගෙන් 2.89%ක් පමණි.

රූපය 05 ද්විතීය පාසැල් සිසුන් ඩිජිටල් කියවීම සඳහා ගත කරන කාල ප්‍රමාණයන්



ස්ත්‍රී පුරුෂභාවය මත ඩිජිටල් කියවීම සඳහා තෝරා ගන්නා ස්ථානය පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමේ දී ද්විතීයික පාසල් සිසුන් දෙකොට්ඨාසය ම ඩිජිටල් කියවීමට ප්‍රධාන වශයෙන් තෝරා ගන්නේ සිය නිවස යි. ඔවුන් අතරින් ශිෂ්‍යාවන් තරමක් අඩු මට්ටමක පවතී. ශිෂ්‍යාවන්ට වඩා පිරිමි සිසුන් පාසලේ දී සහ මහමග දී අවම වශයෙන් ඩිජිටල් කියවීමෙහි නිරත වන බව පැහැදිලි ය. පාසල් බස්රථයේ සහ අනෙකුත් ස්ථානවල පිරිමි සිසුන්ගේ අනුපාතය කාන්තා සිසුන්ට වඩා (3.85%-4.27%) දක්වා වැඩි වන අතර එයින් පෙන්නුම් කරන්නේ ඩිජිටල් කියවීමේ ස්ථාන තෝරාගැනීමේ දී පිරිමි සහ ගැහැනු ළමයින් අතර යම් යම් වෙනස්කම් ඇති බව යි. සමස්තයක් වශයෙන් සිසුන්ගෙන් අතිමහත් බහුතරයක් නිවසේ දී ඩිජිටල් කියවීමේ නිරත වීමට තෝරා ගත්ත ද, යම් අනුපාතයක් වෙනත් විකල්ප තෝරා ගන්නා ආකාරය පෙනී යයි. ඩිජිටල් කියවීමේ විසිරුණු සහ ඛණ්ඩනය වූ කියවීමේ ලක්ෂණ ද්විතීයික පාසල් සිසුන්ගේ ඩිජිටල් කියවීමෙන් පිළිබිඹු වේ.





රූපය 6. ද්විතීයික පාසල් සිසුන් ඩිජිටල් කියවීම් සිදු කරන ස්ථාන

## ඩිජිටල් කියැවීම සහ කඩදාසි කියැවීම සඳහා මනාපය


ශ්‍රී ලංකාවේ ද්විතීයික පාසල් සිසුන් කඩදාසි කියැවීම තෝරා ගැනීමට වැඩි නැඹුරුවක් දක්වන බව රූප සටහන 7 ට අනුව පැහැදිලි ය. ස්ත්‍රී-පුරුෂ බව සහ අධ්‍යයනය ලබන ශ්‍රේණිවලට අනුව ද්විතීයික පාසල් සිසුහු සුළු වෙනස්කම් පෙන්නුම් කළහ. පිරිමි ළමයින් කඩදාසි

කියැවීමට (47.12%) සහ ඩිජිටල් කියැවීමට (52.88%) කැමැත්තක් දක්වයි. ගැහැනු ළමයින් ඩිජිටල් කියැවීම සඳහා (31.93%) ද කඩදාසි කියැවීම සඳහා (68.07%) ද කැමැත්තක් දක්වයි. අර්ධ නාගරික ද්විතීයික පාසැල් සිසුන් කඩදාසි කියැවීමට වැඩි කැමැත්තක් දක්වන අතර නාගරික සහ ග්‍රාමීය ද්විතීයික පාසල් සිසුන් කඩදාසි සහ ඩිජිටල් කියැවීම යන ක්‍රම දෙකට ම එකම මනාපය දක්වයි. 10 ශ්‍රේණියේ සහ 13 ශ්‍රේණියේ සිසුන් කඩදාසි කියැවීමට වැඩි කැමැත්තක් දක්වයි.




රූපය7. ද්විතීයික පාසල් සිසුන්ගේ ඩිජිටල් කියවීමේ නැඹුරුව

ශ්‍රී ලාංකේය ද්විතීයික පාසල් සිසුන් තවමත් ඩිජිටල් කියැවීමේ අගය තහවුරු කරමින් සහ ඩිජිටල් කියැවීම තමන්ට සැපයිය හැකි කියැවීමේ අවශ්‍යතා වෙන්කර ගනිමින් ඩිජිටල් කියැවීම සම්බන්ධයෙන් සාපේක්ෂ ගතානුගතික ආකල්පයක් පවත්වාගෙන යන බව සමීක්ෂණයෙන් සොයා ගන්නා ලදී (වගුව 8 බලන්න).




රූපය 8. ඩිජිටල් කියවීම සම්බන්ධයෙන් ද්විතීයික පාසල් සිසුන්ගේ තෘප්තියේ ස්වභාවය

ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ දෘෂ්ටිකෝණයකින් මෙම දත්ත විශ්ලේෂණයේ දී පිරිමි සිසුන් සාමාන්‍යයෙන් ඩිජිටල් කියැවීම කෙරෙහි ධනාත්මක ආකල්පයක් දරන බව පැහැදිලි ය. තෘප්තිමත් අනුපාතය 57.69% සහ තරමක් දුරට තෘප්තිමත් අනුපාතය 36.54%කි. ශිෂ්‍යාවන් සාමාන්‍යයෙන් ඩිජිටල් කියැවීම සම්බන්ධයෙන් මධ්‍යස්ථ ආකල්පයක් දරයි. තෘප්තිමත් අනුපාතය 45.78% සහ තරමක් දුරට තෘප්තිමත් අනුපාතය 50% කි. නාගරික ව්‍යාප්තියේ දෘෂ්ටිකෝණයෙන්, නාගරිකයේ ඉහළම තෘප්තිමත් අනුපාතය (56%) සහ ග්‍රාමීය ඉහළ ම අතෘප්තිකර අනුපාතය (7.69%) ඇත. බොහෝ ද්විතීයික පාසල් සිසුන්ට ඩිජිටල් කියැවීම පිළිබඳ ඔවුන්ගේ සිතුවිලි සහ විනිශ්චයන් ඇති බව දැකිය හැකි ය.

## නිගමනය

මේ අනුව ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ඩිජිටල් කියැවීමේ හැසිරීම කෙබඳු ද? යන්න ජ්‍යෙෂ්ඨ ද්විතීය පාසැල් සිසුන්ට විශේෂිත ව සිදු කරන ලද මෙම අධ්‍යයනය මඟින් ද්විතීයික පාසල් සිසුන්ගෙන් අතිබහුතරයක් ඩිජිටල් කියැවීමට නිරාවරණය වී ඇති බව පැහැදිලි ය. අද්‍යතනයේ ද්විතීයික පාසල් සිසුන් අතර ඩිජිටල් කියැවීමේ නිරාවරණ අනුපාතය වැඩි වීමට ප්‍රධාන හේතුව වන්නේ ඩිජිටල් මාධ්‍ය යුගයේ සිසුන් ලෙස ද්විතීයික පාසල් සිසුන්ගේ ජීවන පරිසරය

දැනටමත් ගොඩනැගී ඇත්තේ ඩිජිටල් මාධ්‍යයට ස්වභාවික පිළිගැනීමක් සහ අනුවර්තනයක් පෙන්නුම් කරන අයුරින් වීම යි. තව ද, ඩිජිටල් මාධ්‍ය රූප විශාල සංඛ්‍යාවක්, වීඩියෝ දර්ශන, ශ්‍රව්‍ය යනාදී විවිධ ආකාරවලින් සරල පාඨ, සංකේත සැපයීම පමණක් නොව ද්විතීයික පාසල් සිසුන්ට වඩාත් අවබෝධාත්මක සහ පොහොසත් කියවීමේ අත්දැකීමක් ලබා දෙයි. එසේ ම ඩිජිටල් සම්පත් වෙත ප්‍රවේශ වීමේ පහසුව සිසුන්ට කාලය, අවකාශය සහ ඉදිරිපත් කිරීමේ ක්‍රමවලින් සීමා නොවී විවිධ උපාංග සහ ඉගෙනුම් වේදිකා හරහා උසස් තත්ත්වයේ ඩිජිටල් තොරතුරු ලබා ගැනීමට ඉඩ සලසන බව ද පැහැදිලි වේ. තව ද ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ඩිජිටල් කියැවීමේ ස්වරූප ඔවුන් ඒවා සඳහා ප්‍රවේශ වන වේදිකාවන් ඔස්සේ හඳුනාගත හැකි වූ අතර, ඒවායේ ඇති ප්‍රායෝගික ගැටලු සහ අභියෝග ලෙස ගතානුගතික ආකල්ප, අධ්‍යයන පරිසරය, ස්ත්‍රී- පුරුෂභාවය ආදිය ද හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය ඔස්සේ හැකි විය.

## ආශ්‍රේය මූලාශ්‍ර


Dimock, M. (2019). Defining generations: Where Millennials end and Generation Z begins. *Pew Research Center, 17*(1), 1-7.

Hoffmann, J. (2023, October 3). A brief history of hypertext - The history of the web. *The History of the Web*. https://thehistoryoftheweb.com/brief-history-hypertext/

Island Alchemists: Gen Z reboots Sri Lanka's narrative. (2024, January 11). *Daily News*. Retrieved June 24, 2024, from https://www.dailynews.lk/2024/01/11/featured/340419/island-alchemists-gen-z-reboots-sri-lankas-narrative/

Kanniainen, L., & Prieler, T. (2018). Cognitive processes and digital reading. In *Learning to read in a digital world* (pp. 57-90).

Lim, F. V., & Toh, W. (2020). How to teach digital reading? *Journal of Information Literacy, 14*(2), 24-43.

Liu, Z. (2012). Digital reading. *Chinese Journal of Library and Information Science (English edition), 85*.

Siegenthaler, E., Wurtz, P., & Groner, R. (2010). Improving the usability of e-book readers. *Journal of Usability Studies, 6*(1), 25-38.

Soroya, S. H., & Ameen, K. (2020). Millennials' reading behavior in the digital age: A case study of Pakistani university students. *Journal of Library Administration*, *60*(5), 559-577.

Team, B. (2023, January 14). A brief history of eBooks. *BookScouter Blog*. https://bookscouter.com/blog/a-brief-history-of-ebooks/

Wandhe, D. P. (2024). The new generation: Understanding Millennials and Gen Z. *Available at SSRN 4716585*.

# ශ්‍රී ලාංකේය පුවත්පත් කර්මාන්තය තුළ "දත්ත ජනමාධ්‍යවේදය" භාවිතයේ ගැටලු

**එච්. එම්. ඩී. මලින්ද**

## සංක්ෂේපය

වර්තමානය වන විට සමස්ත මානව සංහතිය ම තොරතුරු යුගයකට ප්‍රවිශ්ට වී තිබේ. මෙම තොරතුරු සහ දත්ත, ජනමාධ්‍ය හරහා ප්‍රකාශයට පත් වීමත් සමඟ දත්ත යනු ප්‍රවෘත්ති මාධ්‍ය අතර දැවැන්ත රැල්ලක් ඇති කරන යෙදුමක් බවට පත්වී තිබේ. එහි දී ව්‍යුහගත නොකළ දත්ත (Unstructured data) විශාල ප්‍රමාණයකින් තොරතුරු උපයුක්ත කර ගැනීම සඳහා අද්‍යතන ගෝලීය ප්‍රවණතාවේ කොටසක් ලෙස, මාධ්‍යවේදීන් දත්ත විශ්ලේෂණ කුසලතා වර්ධනය කර ගැනීමට උනන්දු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස දත්ත ජනමාධ්‍යවේදය සහ දත්ත දෘශ්‍යකරණය යන සංකල්පය පැන නැඟී ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ පුවත්පත් කර්මාන්තය තුළ දත්ත ජනමාධ්‍යවේදය භාවිත කිරීමේ දී මතුවන ගැටලු පිළිබඳ සොයා බැලීම ය. මේ සඳහා ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් 10ක සේවය කරන ජනමාධ්‍යවේදීන් 50 දෙනකුට (එක් පුවත්පතකින් 5 දෙනකු බැගින්) ප්‍රශ්නාවලියක් යොමු කර දත්ත ලබා ගැනීම සිදු කර එම දත්ත SPSS 22 මෘදුකාංගය මඟින් විශ්ලේෂණය කරන ලදී. එහි දී අනාවරණය වූයේ දත්ත මත පදනම් වූ ජනමාධ්‍යවේදය ශ්‍රී ලංකාවේ පුවත්පත් තුළ භාවිත කිරීමේ දී බලපාන ගැටලු ලෙස අදාළ සංකල්ප පිළිබඳ විධිමත් දැනුවත්භාවයක් නොමැති වීම, ආකල්පමය වශයෙන් දක්වන අකැමැත්ත, ජනමාධ්‍යවේදීන් අතර ඇති වන අදහස් සම්බන්ධ ගැටුම්, හිමිකාරීත්ව ගැටලු සහ භාෂා ගැටලු ඇති බව යි.

**මුඛ්‍ය පදඃ** තොරතුරු යුගය, දත්ත ජනමාධ්‍යවේදය, දත්ත දෘශ්‍යකරණය, ව්‍යුහගත නොකළ දත්ත, ශ්‍රී ලංකාවේ පුවත්පත්

**හැඳින්වීම**

එක් දිනක් තුළ සිදු වූ සිදුවීමක් හෝ සිදුවීම් සමුදායක් පුවත්පත් හෝ අනෙකුත් මාධ්‍ය හරහා ඉදිරිපත් කිරීම සරල අරුතින් ජනමාධ්‍යවේදය ලෙස හැඳින්විය හැකි ය. නමුත් වර්තමානයේ මෙකී තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස් වෙමින් පවතී. ජංගම දුරකථනය, සමාජ මාධ්‍යයේ සහ ඩිජිටල්කරණයේ වර්ධනය හේතුවෙන් විශාල දත්ත ප්‍රමාණයක් දෛනිකව ජනනය වේ. වර්තමානයේ පරිගණකය, ජංගම දුරකථනය වැනි උපාංග හේතුවෙන් මිනිසුන්ට කාලගුණ අනාවැකියේ සිට සියලු තොරතුරු හා දත්ත වෙත ක්ෂණික ව ප්‍රවේශ වීමේ හැකියාවක් පවතී. මේ නිසා අන්කවරදාකටත් වඩා දත්ත සහ තොරතුරු වෙත ඇති ඉල්ලුම වැඩි වී තිබේ.

Aminul Islam (2018) රචිත Making Sense of Data Journalism from Bangladesh Perspective යන පර්යේෂණ පත්‍රිකාවෙහි සඳහන් වන ආකාරයට අද්‍යතන ලෝකයේ සෑම දිනක ම බයිට් Quintillion 2.5ක් පමණ දත්ත නිර්මාණය වේ. එසේ ම ලොවපුරා බිලියන 3.7කට වැඩි පිරිසක් අන්තර්ජාලය භාවිත කරයි. අද්‍යතනය තුළ දෛනිකව Google සෙවීම් (Searches) බිලියන 3.5ක් සිදු වේ. Snapchat භාවිත කරන්නන් දිනකට ඡායාරූප 527,760ක් බෙදාගනියි. දිනකට පරිශීලකයන් (Subcribers) යූටියුබ් වීඩියෝ 4,146,600ක් නරඹයි. ට්විටර් 456,000ක් ට්විටර් වෙත යවනු ලැබේ. Instagram භාවිත කරන්නන් විනාඩියකට ඡායාරූප 46,740ක් පළ කරයි. දිනකට බිලියන 1.5ක ජනතාවක් ෆේස්බුක් හි ක්‍රියාකාරී වේ. දිනකට ඊමේල් මිලියන 156ක් පමණ යවනු ලැබේ. මීට අමතරව ලෝකය පුරා සිදුවන විවිධ පර්යේෂණ හරහා තොරතුරු බිලියන 1.5ක් පමණ ජනනය වේ. සෑම දිනක ම නව තොරතුරු මිලියන 140ක් පමණ බිහිවන අතර ඒ අතුරින් මිලියන 2ක් පමණ වූ තොරතුරු රූපවාහිනිය සහ වීඩියෝ මාධ්‍ය සඳහා යොදා ගනියි. ඇමෙරිකාවේ බොස්ටන්හි පිහිටි Northeastern විශ්වවිද්‍යාලය විසින් කරන ලද අධ්‍යයනයකින් ඇස්තමේන්තු කර ඇත්තේ 2013 වන විට ඩිජිටල් විශ්වයේ දත්තවල ප්‍රමාණය zettabytes 4.4ක් වූ බව යි. එය 2020 වන විට zettabytes 44ක් දක්වා ඉහළ යාමට නියමිත බව අනාවැකි පළකර සිටියේය. 2015 දී Forbes සඟරාවේ පළ වූ ලිපියකට අනුව වැඩිදුර දත්ත නිර්මාණය කර ඇත්තේ මානව වර්ගයාගේ සමස්ත ඉතිහාසයට වඩා පසුගිය වසර දෙක තුළය (Baranetsky, 2018).

මෙම දත්ත විවිධ මාධ්‍ය හරහා සෑම තත්පරයක ම සන්නිවේදනය වන අතර තොරතුරු කියවන්නාගේ ධාරිතාව ද ඉක්මවා යන තරමට නව තොරතුරු හා දත්ත ග්‍රාහකයා අතට පත්වේ. දත්ත (Data) සහ සංඛ්‍යා ලේඛන සඳහා වර්තමානයේ මෙතරම් දැඩි අවධානයක් යොමු වී ඇත්තේ මෙවන් පරිසරයක් තුළය. "මීට වසර 20 කට පෙර, දත්ත ලෙස හැඳින්වූයේ ඕනෑ ම සංඛ්‍යා එකතුවකි. මාධ්‍යවේදීන් ගනුදෙනු කළ එක ම දත්ත වර්ගය ද එයයි. නමුත් අපි දැන් ජීවත් වන්නේ ඩිජිටල් ලෝකයක ය. ඕනෑ ම දෙයක් අංකවලින් විස්තර කළ හැකි ලෝකයක ය" (Gray, Bounegru & Chambers, 2012).

"ඩිජිටල් තාක්ෂණයත් විශාල දත්ත (Big data) සහ විවෘත දත්ත (Open data) අප ජීවිතයේ බොහෝ පැතිවලට සම්බන්ධ අතර දත්ත සැකසීම, ප්‍රවෘත්ති කාමරවලට පවා බලපෑම් කරමින් පුවත්පත් කලාවේ නව ආකෘති නිර්මාණය කිරීමට හේතු වී ඇත" (Weber & Kennedy, 2018). මේ නිසා සාම්ප්‍රදායික මුද්‍රිත මාධ්‍යයට ද සිය සීමා තරණය කර නව ආකෘති සොයා ගැනීමට සිදුව ඇත. මේ හේතුව නිසා "විද්වතුන් දශක ගණනාවක සිට ප්‍රවෘත්ති වාර්තාවල සංඛ්‍යාලේඛන (Statistics) මෙන්ම ගණිතයේ යෙදීම (Mathematics) අතර සමීප සබඳතාව ගැන දීර්ඝ ලෙස සාකච්ඡා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස දත්ත ජනමාධ්‍යවේදය යන නව ජනමාධ්‍ය ප්‍රපංචය පැන නැගුණි" (Nguyen & Lugo-Ocando, 2016).

ඒ අනුව ශ්‍රී ලාංකේය පුවත්පත් කර්මාන්තය තුළ දත්ත ජනමාධ්‍යවේදය භාවිත කිරීමේ දී බලපාන ගැටලු කවරේද? යන පර්යේෂණ ගැටලුව පදනම් කරගනිමින් ශ්‍රී ලාංකේය පුවත්පත් කර්මාන්තය තුළ දත්ත ජනමාධ්‍යවේදය භාවිත කිරීමේ දී මතුවන ගැටලු සහ අභියෝග සම්බන්ධයෙන් සොයා බැලීම මෙහි දී සිදු විය. එම අභියෝග සහ ගැටලු හඳුනා ගෙන ඒවාට අවශ්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම ද මෙමඟින් සිදු වේ.

**සාහිත්‍ය විමර්ශනය**

මෙහි දී ප්‍රධාන වශයෙන් දත්ත ජනමාධ්‍යවේදය සහ දත්ත දෘශ්‍යකරණය සහ එහි වැදගත්කම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදී.

### දත්ත ජනමාධ්‍යවේදය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහය

මිනිසාගේ ආරම්භයේ සිට ම විවිධාකාරයෙන් 'දත්ත' (Data) භාවිතයට ගෙන ඇත. එය වර්තමානය වන විට මිනිසාට නැතුව ම බැරි දෙයක් බවට පත් වී ඇත්තේ එය සියලු මානව ක්‍රියාකාරකම් පාලනය කිරීමේ ප්‍රධාන බලවේගය බවට පත්ව ඇති නිසාය. දෛනිකව වර්ධනය වන, යාවත්කාලීන වන මෙකී දත්ත නිර්වචනය කිරීමට බොහෝ පර්යේෂකයන් උත්සාහ දරා ඇත. ඒ අනුව දත්ත යනු පර්යේෂකයකු විසින් ව්‍යුහගත නොකළ තොරතුරු විශ්ලේෂණය කර නිරීක්ෂණය කරන විට කේතනය කිරීමේ පළමු මට්ටම බවත් එවිට සන්නිවේදකයා දත්ත, ව්‍යුහගත තොරතුරු (Structural information) බවට පරිවර්තනය කිරීමෙන් (පෙළ හෝ ග්‍රැෆික්ස් භාවිතයෙන්) මහජනතාව සඳහා බලගතු කතාවක් නිර්මාණය කරන බවත් Kalatzi සහ තවත් අය (2018) පවසයි.

අද පවතින සංකීර්ණ දත්ත කට්ටල සහ අභිසාරී මාධ්‍ය පරිසරය තොරතුරු බහුල යුගයට අනුගත වීම මාධ්‍යවේදීන්ට අත්‍යවශ්‍ය දෙයක් බවට පත් කර ඇත. තොරතුරු විශාල වශයෙන් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, පසුගිය දශක දෙක තුළ වැඩි වැඩියෙන් වැදගත් වී ඇති මෙම දත්ත භාවිත කිරීමට මාධ්‍යවේදීන්ට අනුගත විය යුතු ය. මෙම ඩිජිටල් තොරතුරු සමඟ වැඩ කිරීමට නව මෙවලමක් වන්නේ දත්ත ජනමාධ්‍යවේදය යි. එය කතන්දර නිර්මාණය කිරීමට දත්ත භාවිත කරන සහ වගු හෝ දෘශ්‍යකරණ සමඟ ඒවාට සහාය දක්වන පුවත්පත් ප්‍රවේශයක් නියෝජනය කරයි (Porto, 2015).

සාම්ප්‍රදායික ස්වරූපයෙන්, පුවත්පත් කලාව යනු ලෝක සිදුවීම්වල වැදගත්කම සහ ඒවායේ සන්දර්භය පැහැදිලි කිරීමට තොරතුරු, කරුණු, මතය, උපුටා දැක්වීම් සහ දත්ත එකට එකතු කර ආඛ්‍යානයක් නිර්මාණය කිරීම යි. නමුත් දත්ත ජනමාධ්‍යවේදය යනු දත්ත මත පදනම් වූ තීක්ෂණ බුද්ධිය සඳහා විශ්ලේෂණ ශිල්පීය ක්‍රම සම්මිශ්‍රණය කිරීම යි (Islam, 2018). ඒ අනුව මෙකී දත්ත ජනමාධ්‍යවේදය විස්තර කිරීම සඳහා දත්ත මත පදනම් වූ පුවත්පත් කලාව (Data - driven journalism), දත්ත සමුදා පුවත්පත් කලාව (Data base journalism), පරිගණක මාධ්‍යවේදය (Computational journalism) හෝ දත්ත දෘශ්‍යකරණය (Data visualization) යන යෙදුම් දැක්විය හැකි ය (Kalatzi et al., 2018).

පුවත්පත් කලාවේ දත්ත සමුදා විශ්ලේෂණය කිරීමට සමාජ විද්‍යා සහ පරිගණක මෙවලම් ක්‍රම භාවිත කිරීම මෙහි දී සිදුවන බැවින් ඇමෙරිකානු ග්‍රාෆික නිර්මාණ ශිල්පියකු වූ සම්මානිත මහාචාර්ය පිලිප් මේයර් එය නිරවද්‍ය මාධ්‍යවේදය (Precision journalism) ලෙස හැඳින්වීය (Martin & Rosa, 2018).

දත්ත ජනමාධ්‍යවේදය ද පුවත්පත් මාධ්‍යයේ එක් කොටසකි. එය හොඳ කතාවක් සොයා ගැනීමේ මූලික කරුණු අනුගමනය කරයි. එකම වෙනස නම් කතාව ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ දත්තවලින් ලැබෙන තොරතුරු මත මිස සම්බන්ධතා, සම්මුඛ සාකච්ඡා හෝ මාධ්‍ය නිවේදන වැනි සාම්ප්‍රදායික මූලාශ්‍ර මත නොවීමයි (Kalatzi et al., 2018). තර්කානුකූල ක්‍රියාවලියක් ලෙස දත්ත ජනමාධ්‍යවේදය, දත්ත තුළ සැඟවුණු කතාවක් හෙළි කිරීමට හැකියාව ඇති අතර දත්ත දෘශ්‍යකරණ සහ දෘශ්‍ය නිරූපණ (Visual Representation) මඟින් පරිශීලකයන්ට මෙය වඩාත් පැහැදිලිව අවබෝධ කර ගැනීමේ හැකියාව ලබා දෙයි (Weber & Kennedy, 2018).

තවද දත්ත ජනමාධ්‍යවේදය යනු නව්‍ය කතාවක් නිර්මාණය කිරීමේ අරමුණින් විශාල දත්ත කට්ටල විශ්ලේෂණය කිරීම (Analyzing) සහ පෙරීම (Filtering) මත පදනම් වූ පුවත්පත් ක්‍රියාවලියකි. මෙම දත්ත ගවේෂණයේ ප්‍රතිඵල මත පදනම්ව දත්ත පිරිසිදු කිරීම (Cleaning), පරිවර්තනය කිරීම (Transforming), දෘශ්‍යකරණය කිරීම (Visualizing) සහ කථාවක් සාදනු ලබන කාර්ය ප්‍රවාහයක් ලෙස එය දැකිය හැකි ය (Bojārs, 2015).

වර්තමානයේ දත්ත ජනමාධ්‍යවේදය යන යෙදුම සම්බන්ධයෙන් තවමත් මාධ්‍යවේදීන් අතර ව්‍යාකූලතා පවතී. සමහරු තර්ක කරන්නේ එය පුවත්පත් කලාව ලෙස නිර්වචනය කළ නොහැකි බවයි. තවත් සමහරු කියා සිටින්නේ එය පුවත්පත් කලාවේ නව යුගයක ආරම්භය විය හැකි බව යි (Rogers, 2013). කෙසේවෙතත් දත්ත ජනමාධ්‍යවේදය යනු මාධ්‍යවේදීන්ට කතන්දර කීමට නව සහ ආකර්ෂණීය ක්‍රම ලබා දෙන, වර්ධනය වන ප්‍රවණතාවකි. මෙකී දත්ත ජනමාධ්‍යවේදය මේ වන විට ප්‍රවෘත්ති කාමරවල වෘත්තීය භාවිතයට පවා බලපෑම් කරමින් නව ආකෘති නිපදවමින් සිටියි.

සාම්ප්‍රදායික පුවත්පත් කලාවේ සහ මාධ්‍යයේ කාර්යය පුරවැසියන් දැනුවත් කිරීමට වඩා වැඩිය. ඔවුන් මුර බල්ලකු (Watch dog) ලෙස ක්‍රියා කරමින් සහ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල වඩා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි (Porto, 2015). මේ වැදගත් කාර්යභාරය තවදුරටත් තීව්‍ර කිරීමේ දී දත්ත සහ තොරතුරු සුවිශාල දායකත්වයක් ඉටු කරනු ලබයි. සමහර සංඛ්‍යා ලේඛන වාර්තා සහ විද්වතුන් කියා සිටින්නේ සමකාලීන දත්ත ජනමාධ්‍යවේදය ප්‍රජාතන්ත්‍රවාදය සඳහා පුවත්පත් කලාවට දායක විය හැකි ආකාරය වැඩිදියුණු කරන බව යි.

**දත්ත දෘශ්‍යකරණය සම්බන්ධ න්‍යායාත්මක විග්‍රහය**

දත්ත ජනමාධ්‍යවේදය සමඟ සෘජු ව සම්බන්ධ වන අනෙක් සංකල්පය වන්නේ දත්ත දෘශ්‍යකරණය යි. විද්‍යාව හා තාක්ෂණයේ දියුණුවත් සමඟ විවිධ ක්ෂේත්‍ර මඟින් සංකීර්ණ දත්ත ජනනය වීම සිදු වේ. නමුත් මෙකී දත්ත සමාජයේ සෑම ස්ථරයක ම පුද්ගලයන්ට අවබෝධ කර ගැනීමේ හැකියාවෙන් තොර ය. එබැවින් සංකීර්ණ දත්ත කට්ටල පහසුවෙන් ජනතාවට ඉදිරිපත් කිරීමට නම් ඒවා දෘශ්‍යකරණය කළ යුතු ය.

දෘශ්‍යකරණය යනු විවිධ ක්‍රම හරහා දෘශ්‍ය තොරතුරු භාවිතය හා සන්නිවේදනය කිරීම යි. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ ග්‍රාෆික ක්‍රම භාවිත කරමින් තොරතුරු වඩාත් පැහැදිලිව හා කාර්යක්ෂමව සන්නිවේදනය කිරීමයි (Siricharoen, 2013).

මෙය පුද්ගල සංජානනය වර්ධනය කිරීම සඳහා පමණක් නොව සංකීර්ණ තොරතුරුවල දක්නට ලැබෙන රටා සහ අන්තර්ගතය අනාවරණය කර ගැනීමට ද පහසු වේ (Inanc & Dur, 2014). මෙය සංකල්පයක් ලෙස දත්ත දෘශ්‍යකරණය ලෙස හඳුන්වයි.

දත්ත දෘශ්‍යකරණය යනු දත්ත පහසුවෙන් අවබෝධ කර ගැනීම සඳහා ඡායාරූපමය හෝ චිත්‍රක ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයකි. විශාල තොරතුරු සහ සංකීර්ණමය දත්ත ඉදිරිපත් කිරීම සඳහා ඕනෑ ම විෂය ක්ෂේත්‍රයක මෙය ප්‍රායෝගිකව භාවිත කළ හැකිය (Musa et al., 2016). එසේ ම දත්ත දෘශ්‍යකරණය යනු දත්ත හෝ තොරතුරු ඒකකවල අන්තර්ගත ගුණාංග සහ විචල්‍ය වෙනස් නොවන ආකාරයෙන් ග්‍රාෆික සහ රූප භාවිත කරමින් තොරතුරු

ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයකි (Inanc, 2012). මේ සඳහා දත්ත දෘශ්‍යකරණය, තොරතුරු දෘශ්‍යකරණය (Information visualization) හෝ තොරතුරු ග්‍රාෆික (Infographic) යන පර්යාය සංකල්ප යොදා ගත හැකිය.

දත්ත දෘශ්‍යකරණයේ මූලික අරමුණ වන්නේ පැහැදිලි සහ ඵලදායී ආකාරයෙන් ග්‍රාෆික මාධ්‍ය උපයෝගී කර ගෙන තොරතුරු ලබා දීමය. රූප සහ ග්‍රාෆික මාධ්‍ය මඟින් දත්ත ඉදිරිපත් කිරීම තුළ යම්කිසි සිද්ධියක් හෝ සිදුවීම් මාලාවක් පිළිබඳව වෙනස් ආකාරයේ අර්ථකථනයක් ලබා ගත හැකි ය. දත්ත දෘශ්‍යකරණය සුවිශේෂී විෂයක් ලෙස මෑතක දී හඳුනා ගෙන තිබුණ ද එහි ඉතිහාසය ඊජිප්තු ශිෂ්ටාචාරය දක්වා දිව යයි. වර්තමාන ලෝකයේ පුවත්පත් කර්මාන්තය තුළ දත්ත දෘශ්‍යකරණ උපක්‍රම භාවිත කිරීම සුලබව සිදු වේ. මෙහි ඇති වැදගත්කම නිසා ම මේ සඳහා වෙන් වූ ඒකක පුවත්පත් ආයතන තුළ ස්ථාපනය කිරීමට ද කටයුතු කර තිබේ.

**පර්යේෂණයේ ක්‍රමවේදය**

ශ්‍රී ලාංකේය පුවත්පත් කර්මාන්තය තුළ දත්ත ජනමාධ්‍යවේදය භාවිත කිරීමේ දී බලපාන ගැටලු සම්බන්ධයෙන් සිදු කරන ලද මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. එහි දී මෙරට තුළ දෛනිකව සහ සතිඅන්තයේ ප්‍රකාශිත සිංහල සහ ඉංග්‍රීසි පුවත්පත් 10ක් තෝරා ගන්නා ලදී.

| පුවත්පත් ආයතනය | සිංහල පුවත්පත | ඉංග්‍රීසි පුවත්පත |
|---|---|---|
| ලේක්හවුස් ආයතනය | දිනමිණ | ඩේලිනිවුස් |
| විජය පුවත්පත් සමාගම | ලංකාදීප | ඩේලිමිරර් |
| උපාලි පුවත්පත් සමාගම | දිවයින | ද අයිලන්ඩ් |
| සිලෝන් නිවුස් පේපර්ස් පුද්ගලික සමාගම | මව්බිම | සිලෝන් ටුඩේ |
| Derana Macro Entertainment (Pvt) Ltd. | අරුණ | ද මෝනින් |

වගු අංක 01- නියැදියට සාමාජිකයන් ඇතුළත් කර ගත් ආකාරය

මෙහි දී 2024 ජුනි මස 05 වැනි දා සිට 12 වැනි දා දක්වා වූ දවස් 07ක කාලය තුළ එක් පුවත්පතකින් අහඹු ලෙස ජනමාධ්‍යවේදීන්

5 දෙනකු බැගින් ජනමාධ්‍යවේදීන් 50 දෙනකු නියැදියට තෝරා ගන්නා ලදී. එසේ ඇතුළත් කර ගන්නා ලද සාමාජිකයන් සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ලබා දී ලබා ගන්නා තොරතුරු SPSS මෘදුකාංගය හරහා විශ්ලේෂණය කරන ලදී.

මේ සඳහා යොදා ගන්නා ප්‍රශ්නාවලිය තුළ ප්‍රශ්න 15ක් අන්තර්ගත අතර එය ප්‍රධාන කොටස් 03ක් යටතේ බෙදා දක්වන ලදී. එනම් ජන විකාශ සාධක, දත්ත ජනමාධ්‍යවේදය පිළිබඳ දැනුවත්භාවය සහ දත්ත ජනමාධ්‍යවේදයේ ප්‍රායෝගික භාවිතය යනාදිය යි.

| | |
|---|---|
| ජනවිකාශ සාධක | Q1-Q7 |
| දත්ත ජනමාධ්‍යවේදය පිළිබඳ දැනුවත්භාවය | Q8-Q12 |
| දත්ත ජනමාධ්‍යවේදයේ ප්‍රායෝගික භාවිතය | Q13-Q15 |

වගු අංක 02- ජනමාධ්‍යවේදීන්ට ලබා දුන් ප්‍රශ්නාවලියේ ස්වභාවය

## දත්ත විශ්ලේෂණය

### නියැදියේ ජනවිකාශ සාධක සම්බන්ධ දත්ත විශ්ලේෂණය

වගු අංක 1 හි සඳහන් ආකාරයට එක් පුවත්පතකින් මාධ්‍යවේදීන් 5 (10%) දෙනකු බැගින් නියැදියට ඇතුළත් කර ගන්නා ලද අතර එක් පුවත්පත් ආයතනයකින් මාධ්‍යවේදීන් 10 (20%) දෙනකු බැගින් නියැදියට ඇතුළත් වී තිබේ. නියැදියට අයත් ජනමාධ්‍යවේදීන්ගේ ජනවිකාශ සාධක සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණය පහත දැක්වේ.

| ජනවිකාශ සාධකය | වර්ගය | ප්‍රමාණය | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| ප්‍රකාශිත භාෂාව අනුව නියැදියට අයත් පුවත්පත් | සිංහල භාෂාව | 25 | 50% |
| | ඉංග්‍රීසි භාෂාව | 25 | 50% |
| වයස | 20-30 | 8 | 16% |
| | 31-40 | 19 | 38% |
| | 41-50 | 9 | 18% |
| | 51-60 | 14 | 28% |
| අධ්‍යාපන සුදුසුකම | අ.පො.ස. උසස් පෙළ | 12 | 24% |
| | ඩිප්ලෝමා | 4 | 8% |

| | | | |
|---|---|---|---|
| | උපාධි අපේක්ෂක | 4 | 8% |
| | උපාධිධාරී | 25 | 50% |
| | පශ්චාත් උපාධිධාරී | 5 | 10% |
| ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ පළපුරුද්ද | වසරකට අඩු | 4 | 8% |
| | වසර 1-5 | 11 | 22% |
| | වසර 6-10 | 10 | 20% |
| | වසර 11-20 | 11 | 22% |
| | වසර 20ට වැඩි | 14 | 28% |

වගු අංක 03 - ජනවිකාශ සාධක සම්බන්ධ දත්ත විශ්ලේෂණය

මෙම සමීක්ෂණය තුළ සිංහල සහ ඉංග්‍රිසි භාෂාවලින් ප්‍රකාශිත පුවත්පත් 50 (100%) ක් ඇති අතර එය සමානව 25 (50%) බැගින් කොටස් 2කට බෙදී ගොස් ඇත. නියැදිය තුළ සිටින ජනමාධ්‍යවේදීන්ගේ වයස සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණයට අනුව අවුරුදු 20-30 වයස් කාණ්ඩයට 8 දෙනකු (16%), 31-40 කාණ්ඩයට 19 (38%) දෙනකුත් 41-50 කාණ්ඩයට 9ක් (18%) සහ 51-60 කාණ්ඩයට 14 (28%) දෙනකු බැගින් සමස්ත නියැදිය නියෝජනය කරනු ලබයි. ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් දෙස බලන විට අ.පො.ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ 12 (24%) දෙනකු, ඩිප්ලෝමාධාරීන් සහ උපාධිධාරීන් 4 (8%) බැගින් 8 (16%) දෙනකු, උපාධිධාරීන් 25ක් (50%) සහ පශ්චාත් උපාධිධාරීන් 4 (8%) දෙනකු නියැදිය නියෝජනය කරයි. නියැදියට අයත් සාමාජිකයන්ට ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ඇති පළපුරුද්ද සම්බන්ධයෙන් සිදු කරන ලද දත්ත විශ්ලේෂණයට අනුව සමස්ත නියැදිය තුළ වැඩිම පිරිසක් එනම්, 14 (28%) දෙනකු නියෝජනය කරන්නේ වසර 20කට වඩා වැඩි පළපුරුද්දක් ඇති ජනමාධ්‍යවේදීන් ය. ඊට අමතර ව වසර 1-5 සහ 11-20 අතර පළපුරුද්ද ඇති 11 (22%) බැගින් 22ක් නියැදිය නියෝජනය කරන අතර අවම නියෝජනයක් ලෙස වසරකට අඩු පළපුරුද්දක් සහිත ජනමාධ්‍යවේදීන් 4 (8%) ක් නියැදිය නියෝජනය කරයි.

## දත්ත ජනමාධ්‍යවේදය පිළිබඳ දැනුවත්භාවය

| දත්ත ජනමාධ්‍යවේදය හෝ දත්ත දෘශ්‍යකරණය සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලැබුවේද | | පුවත්පත් ක්ෂේත්‍රය තුළ පළපුරුද්ද | | | | | සමස්ත එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | වසර 1ට අඩු | වසර 1-5 | වසර 6-10 | වසර 11-20 | වසර 20ට වැඩි | |
| ඔව් | ප්‍රමාණය | 2 | 1 | 4 | 1 | 0 | 8 |
| | ප්‍රතිශතය % | 4% | 2% | 8% | 2% | 0% | 16% |
| නැත | ප්‍රමාණය | 2 | 8 | 4 | 7 | 9 | 30 |
| | ප්‍රතිශතය % | 4% | 16% | 8% | 14% | 18% | 60% |
| තරමක් දුරට | ප්‍රමාණය | 0 | 2 | 2 | 3 | 5 | 12 |
| | ප්‍රතිශතය % | 0% | 4% | 4% | 6% | 10% | 24% |
| සමස්ත එකතුව | ප්‍රමාණය | 4 | 11 | 10 | 11 | 14 | 50 |
| | ප්‍රතිශතය % | 8% | 22% | 20% | 22% | 28% | 100% |

වගු අංක 4 - දත්ත ජනමාධ්‍යවේදය හෝ දත්ත දෘශ්‍යකරණය සම්බන්ධ විධිමත් පුහුණුවක් ලැබීම

ඉහත දත්ත විශ්ලේෂණයට අනුව වසර 20ට වැඩි පළපුරුද්දක් ඇති ජනමාධ්‍යවේදීන් දත්ත ජනමාධ්‍යවේදය හෝ දත්ත දෘශ්‍යකරණය සම්බන්ධ විධිමත් පුහුණුවක් ලබා නොමැති බවට 9 (18%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ. ඔවුන්ගෙන් කිසිවකුත් මේ සඳහා 'ඔව්' ලෙස පිළිතුරු ලබා දී නොමැති අතර 'තරමක් දුරට' පුහුණුවක් ලබා ඇති බවට 5 (10%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ. එසේම විධිමත් පුහුණුවක් ලැබූ බවට 'ඔව්' යනුවෙන් වැඩිම පිළිතුරු ප්‍රමාණයක් ලැබී ඇත්තේ වසර 6-10 අතර පළපුරුද්දක් ඇති ජනමාධ්‍යවේදීන් වේ. ඒ සඳහා සමස්ත නියැදියෙන් 4 (8%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ. එසේම එම පළපුරුද්ද ඇති කාණ්ඩයේ 4 (8%) දෙනකු විධිමත් පුහුණුවක් ලබා නොමැති බව සඳහන් කර තිබේ. එමෙන්ම වසරකට අඩු පළපුරුද්දක් සහිත කාණ්ඩයේ දෙදෙනකු (4%) 'ඔව්' යනුවෙන් පිළිතුරු ලබා දී ඇති විට වසර 1-5 අතර පළපුරුද්දක් ඇති 8 (16%) දෙනකු විධිමත් පුහුණුවක් ලබා නොමැති බවට පිළිතුරු ලබා දී තිබේ.

තවද වසර 11-20 අතර පළපුරුද්දක් සහිත ජනමාධ්‍යවේදීන් 8 (16%) දෙනකු විධිමත් පුහුණුවක් නොලැබූ බවට පිළිතුරු ලබා දී තිබේ. මෙම දත්ත විශ්ලේෂණය අනුව අත්දැකීම් හා පළපුරුද්ද බහුල (වසර 11-20 සහ 20ට වැඩි) ජනමාධ්‍යවේදීන්ට දත්ත ජනමාධ්‍යවේදය සම්බන්ධ විධිමත් පුහුණුවක් ලැබී නොමැති මුත් වසර 10ට අඩු පළපුරුද්දක් සහිත ජනමාධ්‍යවේදීන් ඒ සම්බන්ධ විධිමත් පුහුණුවක් ලබා ඇති බව අනාවරණය විය.

දත්ත ජනමාධ්‍යවේදය සහ දත්ත දෘශ්‍යකරණය යනු සෙසු මාධ්‍ය ශිල්පීය ක්‍රම මෙන් ම විධිමත් පුහුණුවක් ලැබිය යුතු ශිල්පීය භාවිතයකි. මෙම දත්ත විශ්ලේෂණය අනුව පෙනී ගියේ නවක මාධ්‍යවේදීන්ට (වසර 10ට අඩු පළපුරුද්දක් සහිත) සාපේක්ෂව ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්ට දත්ත ජනමාධ්‍යවේදය හා දත්ත දෘශ්‍යකරණය සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලැබී නොමැති බවයි. අන්තර්ජාලය වැනි මූලාශ්‍ර මඟින් න්‍යායාත්මක දැනුමක් ලබා ගත හැකි නමුත් එය ප්‍රායෝගිකව භාවිත කරන්නේ කෙසේද යන ගැටලුව මතු වේ.

| දත්ත ජනමාධ්‍යවේදය හෝ දත්ත දෘශ්‍යකරණය සම්බන්ධ වැඩිදුර පුහුණු අවස්ථා සඳහා යොමු කරන්නේද | | ප්‍රකාශිත භාෂාව අනුව නියැදියට අයත් පුවත්පත් | | සමස්ත එකතුව |
|---|---|---|---|---|
| | | සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් | ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් | |
| ඔව් | ප්‍රමාණය | 9 | 19 | 28 |
| | ප්‍රතිශතය % | 18% | 38% | 56% |
| නැත | ප්‍රමාණය | 16 | 6 | 22 |
| | ප්‍රතිශතය % | 32% | 12% | 44% |
| සමස්ත එකතුව | ප්‍රමාණය | 25 | 25 | 50 |
| | ප්‍රතිශතය % | 50% | 50% | 100% |

වගු අංක 5 - පුවත්පත් ආයතන මඟින් මෙම විෂය සම්බන්ධ වැඩිදුර පුහුණු සහ අධ්‍යාපන අවස්ථා සඳහා ජනමාධ්‍යවේදීන් යොමු කිරීම

ඉහත දත්ත විශ්ලේෂණය අනුව සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත්වලට සාපේක්ෂව ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් හි සේවය කරන ජනමාධ්‍යවේදීන්ට වැඩිදුර අධ්‍යාපන අවස්ථා හිමිවන බව හඳුනාගත හැකි ය. දත්ත ජනමාධ්‍යවේදය සම්බන්ධ වැඩිදුර

පුහුණු අවස්ථා සඳහා යොමු කරන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් වෙනුවෙන් වන අතර ඒ සඳහා සමස්ත නියැදියෙන් 19 (38%) පිළිතුරු ලබා දී තිබේ. එසේම ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් හි සේවය කරන ජනමාධ්‍යවේදීන් එවැනි පුහුණු අවස්ථා සඳහා යොමු නොකරන බවට ද සමස්ත නියැදියෙන් 6 (12%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ. ඉංග්‍රීසි පුවත්පත්වලට සාපේක්ෂව සිංහල පුවත්පත් හි ජනමාධ්‍යවේදින්ට එවැනි වැඩිදුර පුහුණු අවස්ථා නොමැති බව මෙම දත්ත විශ්ලේෂණයේ දී පෙනී යයි.

| පුහුණු සැසි, වැඩමුළු හෝ අධ්‍යාපන අවස්ථා ගැන දැන ගන්නා විට ඒවාට සහභාගී වීමට උනන්දුවක් තිබේද? | | වයස | | | | සමස්ත එකතුව |
|---|---|---|---|---|---|---|
| | | 20-30 | 31-40 | 41-50 | 51-60 | |
| ඔව් | ප්‍රමාණය | 5 | 13 | 8 | 0 | 26 |
| | ප්‍රතිශතය % | 10% | 26% | 16% | 0% | 52% |
| නැත | ප්‍රමාණය | 3 | 6 | 1 | 14 | 24 |
| | ප්‍රතිශතය % | 6% | 12% | 2% | 28% | 48% |
| සමස්ත එකතුව | ප්‍රමාණය | 8 | 19 | 9 | 14 | 50 |
| | ප්‍රතිශතය % | 16% | 38% | 18% | 28% | 100% |

වගු අංක 6- පුහුණු සැසි, වැඩමුළු හෝ අධ්‍යාපන අවස්ථා ගැන දැන ගන්නා විට ඒවාට සහභාගී වීම සඳහා දක්වන උනන්දුව

ඉහත දත්ත විශ්ලේෂණයට අනුව දත්ත ජනමාධ්‍යවේදය සම්බන්ධ පුහුණු සැසි සහ වැඩිදුර අධ්‍යාපන අවස්ථා සඳහා වැඩි කැමැත්තක් ඇත්තේ වයස අවුරුදු 31-40 වයසේ පසුවන්නන් වන අතර ඒ සඳහා සමස්ත නියැදියෙන් 13 (26%) දෙනකු 'ඔව්' යනුවෙන් ප්‍රතිචාර දක්වා ඇත. එම වයස් කාණ්ඩයේම 6 (12%) දෙනකු 'නැත' යනුවෙන් ප්‍රතිචාර දක්වා තිබේ. වයස අවුරුදු 51-60 අතර ජනමාධ්‍යවේදීන් කිසිවකු මේ සඳහා 'ඔව්' යනුවෙන් ප්‍රතිචාර දක්වා නොමැති අතර 'නැත' යනුවෙන් 14 (28%) දෙනකු ප්‍රතිචාර දක්වා තිබේ. එසේම වයස 20-30 අතර පසුවන ජනමාධ්‍යවේදීන්ගෙන් 5 (10%) දෙනකු 'ඔව්' යනුවෙන් ප්‍රතිචාර දක්වන විට 3 (6%) දෙනකු 'නැත' යනුවෙන් ප්‍රතිචාර දක්වා ඇත. එමෙන් ම 41-50 වයසේ පසුවන

ජනමාධ්‍යවේදීන් 8 (16%) දෙනකු 'ඔව්' යනුවෙන් ප්‍රතිචාර දක්වන විට 1 (2%) අයකු පමණක් 'නැත' යනුවෙන් මෙහි දී ප්‍රතිචාර දක්වා ඇත.

| | Responses | | Percent of Cases |
|---|---|---|---|
| | N | Percent | |
| කාලය නොමැතිකම | 8 | 30.8% | 47.1% |
| අදාළ පුහුණු කටයුතු සඳහා ආයතනයෙන් යොමු නොකිරීම | 9 | 34.6% | 52.9% |
| වැඩිදුර අධ්‍යාපන අවස්ථා සඳහා උනන්දුව නොමැතිකම | 1 | 3.8% | 5.9% |
| මූල්‍ය ගැටලු | 7 | 26.9% | 41.2% |
| වෙනත් | 1 | 3.8% | 5.9% |
| සමස්ත එකතුව | 26 | 100% | 152.9% |

වගු අංක 7- පුහුණු සැසි සඳහා සහභාගී නොවීමට හේතු

ඉහත දත්ත විශ්ලේෂණය අනුව මෙම පුහුණු සැසි සඳහා සහභාගී නොවීමට බලපා ඇති හේතුව වන්නේ 'අදාළ පුහුණු කටයුතු සඳහා ආයතනයෙන් යොමු නොකිරීමයි'. ඒ සඳහා අවස්ථා 9 (34.6%) කදී පිළිතුරු ලබා දී ඇති අතර මේ සඳහා 'කාලවේලාවක් නොමැති වීම' යන සාධකය සඳහා 8 (30.8%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ. මෙහි අවම පිළිතුරු ලෙස 'වැඩිදුර අධ්‍යාපන අවස්ථා පිළිබඳ උනන්දුවක් නොමැතිකම' යන සාධකය කෙරෙහි සමස්ත නියැදියෙන් එක් අයෙකු (3.8%) ප්‍රතිචාර දක්වන විට 'මූල්‍ය ගැටලු' පවතින බවට සමස්ත නියැදියෙන් 7 (26.9%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ.

පුවත්පත් ආයතනයක් යනු අතිශය කාර්යබහුල ස්ථානයකි. මෙවැනි කාර්යබහුලත්වය මත මාධ්‍යවේදීන්ට සිය වෘත්තීය කුසලතා වැඩිදියුණු කර ගැනීමට ද නොහැකි වී තිබේ. ප්‍රවෘත්ති ආයතනයක් යනු කාලය නිසි පරිදි කළමනාකරණය කරන ස්ථානයකි. දත්ත සඳහා විධිමත් ප්‍රවේශයක් නොමැති වීමත් දත්ත පිරිසිදු කර ගැනීමට විශාල කාලයක් ගත වීමත් නිසා බොහෝ මාධ්‍ය ආයතන මේ සඳහා යොමු නොවීමක් දක්නට ලැබේ. එසේම බොහෝ ආයතනවලට අඩු අයවැයක් ඇති බැවින් ඔවුන් දත්ත පුවත්පත් ව්‍යාපෘති සඳහා ආයෝජනය නොකරයි. විශේෂයෙන් වඩා අඩු සම්පත් ඇති දේශීය ප්‍රවෘත්ති මාධ්‍ය මේ ගැන සැලකිලිමත්

නොවේ. මෙය කුඩා ප්‍රාදේශීය මාධ්‍ය සහ විශාල ප්‍රවෘත්ති ආයතන අතර විශාල පරතරයක් ඇති කරයි (Kalatzi et al., 2018).

## දත්ත ජනමාධ්‍යවේදය ප්‍රායෝගිකව භාවිත කිරීම

| පුවත්පත් සඳහා දත්ත ලබා ගන්නා මූලාශ්‍ර | | ප්‍රකාශිත භාෂාව අනුව නියැදියට අයත් පුවත්පත් | | සමස්ත එකතුව |
|---|---|---|---|---|
| | | සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් | ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් | |
| රජය විසින් නිකුත් කරන ලද වාර්තා | ප්‍රමාණය | 16 | 17 | 33 |
| | ප්‍රතිශතය % | 32.7% | 34.7% | 67.3% |
| තොරතුරු දැනගැනීමේ පනත | ප්‍රමාණය | 7 | 10 | 17 |
| | ප්‍රතිශතය % | 14.3% | 20.4% | 34.7% |
| ගවේෂණාත්මක දත්ත | ප්‍රමාණය | 14 | 14 | 28 |
| | ප්‍රතිශතය % | 28.6% | 28.6% | 57.1% |
| අවිධිමත් මූලාශ්‍ර | ප්‍රමාණය | 13 | 10 | 23 |
| | ප්‍රතිශතය % | 26.5% | 20.4% | 46.9% |
| සමස්ත එකතුව | ප්‍රමාණය | 24 | 25 | 49 |
| | ප්‍රතිශතය % | 49% | 51% | 100% |

වගු අංක 8-පුවත්පත් සඳහා දත්ත ලබා ගන්නා මූලාශ්‍ර

ඩිජිටල් යුගය තුළ තවමත් පුවත්පත්වල ප්‍රධාන දත්ත මූලාශ්‍රය වී ඇත්තේ රජය විසින් නිකුත් කරන ලද වාර්තාය. මේ සඳහා සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් හි මාධ්‍යවේදීන් 16 (32.7%) ක් සහ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් හි සේවය කරන මාධ්‍යවේදීන් 17 (34.7%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ. එසේම තොරතුරු දැන ගැනීමේ පනත දත්ත ලබා ගැනීමේ මූලාශ්‍රයක් ලෙස වැඩිපුරම භාවිත කරන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් හි සේවය කරන මාධ්‍යවේදීන් වන අතර ඒ සඳහා 10 (20.4%) දෙනකු පිළිතුරු ලබා දී ඇති අතර සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් හි සේවය කරන මාධ්‍යවේදීන් 7 (14.3%) දෙනකු පමණක් පිළිතුරු ලබා දී තිබේ. සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් හි සේවය කරන මාධ්‍යවේදීන් 14 (28.6%) බැගින් ගවේෂණාත්මක දත්ත භාවිත කරන බවට සමව පිළිතුරු ලබා දී ඇති අතර අවිධිමත් මූලාශ්‍ර සිය දත්ත මූලාශ්‍රය ලෙස බහුලව භාවිත කරන්නේ සිංහල භාෂාවෙන් ප්‍රකාශිත

පුවත්පත් හි සේවය කරන මාධ්‍යවේදීන් බවට සමස්ත නියැදියෙන් 13 (26.5%) දෙනකු පිළිතුරු ලබා දී තිබේ.

ඉහත දත්ත විශ්ලේෂණය අනුව පෙනී යන්නේ බොහෝ පුවත්පත් සිය ප්‍රධාන ප්‍රවෘත්ති මූලාශ්‍රය කර ගෙන ඇත්තේ රජය විසින් නිකුත් කරනු ලැබූ වාර්තාය. මේ වාර්තා අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු හා සංස්ථා මෙන්ම නිල නිවේදන විය හැකි ය. මේවා රාජ්‍ය පාර්ශ්වය විසින් දොරටුපාල ක්‍රියාවලියකට ලක් කර මාධ්‍ය වෙත නිකුත් කරන නිසා මෙහි නිරවද්‍යභාවය කොතෙක් යන්න ගැටලු පවතී. අපක්ෂපාතී දත්ත වාර්තාකරණය කිරීම සඳහා තනි ආයතනයක් නොමැති වීම දැඩි ගැටලුවකි. ආර්ථිකය සම්බන්ධයෙන් දත්ත නිකුත් කරනු ලබන මහබැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව යන ආයතන මුදල් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන නිසා ස්වාධීනත්වය අහිමි ව ගොස් තිබේ (Aneez, 2013).

මේ අනුව විධිමත් දත්ත මූලාශ්‍ර වෙත ඇති ප්‍රවේශය ප්‍රමාණවත් නොවීම, සංවේදී මාතෘකා පිළිබඳ බොහෝ දත්ත සඟවා තිබීම සහ සමහර දත්ත අසම්පූර්ණ හා අවිනිශ්චිත වීම නිසා නිවැරදි දත්ත කළමනාකරණය කර ගැනීමේ දී විශාල ගැටලුවලට මුහුණ දීමට සිදු වේ.

දත්ත මාධ්‍යවේදීන්ට දත්ත වෙත ප්‍රවේශ වීමට වඩාත් දුෂ්කර ඉතා ශක්තිමත් තොරතුරු දැනගැනීමේ පනතක් නොමැති රටවල් තවමත් පවතී. තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක වුව ද බොහෝ රටවල තවමත් තොරතුරුවලට සීමා මායිම් පනවා තිබේ. ජාතික මට්ටමට වඩා ප්‍රාදේශීය මට්ටමින් එවැනි තොරතුරු සඳහා ප්‍රවේශ වීම ඉතා අපහසුය (Kalatzi et al., 2018).

| නව තාක්ෂණය ප්‍රවෘත්ති කාමර ආක්‍රමණය කිරීමට ඇති කැමැත්ත | | පුවත්පත් ක්ෂේත්‍රය තුළ පළපුරුද්ද | | | | | සමස්ත එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | වසර 1ට අඩු | වසර 1-5 | වසර 6-10 | වසර 11-20 | වසර 20ට වැඩි | |
| අතිශය එකඟ නොවේ | ප්‍රමාණය | 0 | 0 | 0 | 0 | 2 | 2 |
| | ප්‍රතිශතය % | 0% | 0% | 0% | 0% | 4% | 4% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| එකඟ නොවේ | ප්‍රමාණය | 0 | 0 | 1 | 0 | 3 | 4 |
| | ප්‍රතිශතය % | 0% | 0% | 2% | 0% | 6% | 8% |
| මධ්‍යස්ථයි | ප්‍රමාණය | 1 | 5 | 5 | 1 | 0 | 12 |
| | ප්‍රතිශතය % | 2% | 10% | 10% | 2% | 0% | 24% |
| එකඟයි | ප්‍රමාණය | 0 | 6 | 3 | 10 | 4 | 23 |
| | ප්‍රතිශතය % | 0% | 12% | 6% | 20% | 8% | 46% |
| අතිශය එකඟයි | ප්‍රමාණය | 3 | 0 | 1 | 0 | 5 | 9 |
| | ප්‍රතිශතය % | 6% | 0% | 2% | 0% | 10% | 18% |
| සමස්ත එකතුව | ප්‍රමාණය | 4 | 11 | 10 | 11 | 14 | 50 |
| | ප්‍රතිශතය % | 8% | 22% | 20% | 22% | 28% | 100% |

වගු අංක 9- නව තාක්ෂණය ප්‍රවෘත්ති කාමර ආක්‍රමණය කිරීමට ඇති කැමැත්ත

ඉහත දත්ත විශ්ලේෂණය අනුව නව තාක්ෂණය ප්‍රවෘත්ති කාමර ආක්‍රමණය කිරීම සම්බන්ධයෙන් 'අතිශය එකඟ නොවේ' යනුවෙන් පිළිතුරු ලබා දී ඇත්තේ වසර 20කට වඩා පළපුරුද්දක් ඇති ජනමාධ්‍යවේදීන්ය. ඒ සඳහා සමස්ත නියැදියෙන් දෙදෙනකු (4%) පිළිතුරු ලබා දී තිබේ. එසේම ඉහත ප්‍රකාශය සමඟ 'එකඟ නොවේ' යනුවෙන් වසර 6-10 අතර (2%) සහ 20ට වැඩි (6%) පළපුරුද්දක් සහිත ජනමාධ්‍යවේදීන් ප්‍රතිචාර දක්වා ඇත. මේ සඳහා වසරකට අඩු සහ වසර 11-20 අතර එක්අයකු ද (2%) වසර 1-5 සහ 6-10 අතර 5 (10%) බැගින් 10 දෙනකු ද 'මධ්‍යස්ථ' ප්‍රතිචාර ලබා දී තිබේ.

එමෙන්ම මෙම ප්‍රකාශය සමඟ 'එකඟයි' යනුවෙන් වසර 1-5 අතර පළපුරුද්දක් සහිත 6 දෙනෙකු (12%), 6-10 කාණ්ඩයේ 3 දෙනෙකු (6%), 11-20 කාණ්ඩයේ 10 දෙනෙකු (20%) සහ 20ට වැඩි කාණ්ඩයේ 4 දෙනෙකු (8%) බැගින් ප්‍රතිචාර දක්වා ඇත. 'අතිශය එකඟ වේ' යනුවෙන් වසරකට අඩු පළපුරුද්දක් සහිත 3 (6%) ක් ද, 6-10 කාණ්ඩයේ 1 (2%) ක් සහ 20ට වැඩි පළපුරුද්දක් සහිත කාණ්ඩයේ 5 (10%) දෙනකු ද ප්‍රතිචාර දක්වා ඇත.

නව තාක්ෂණය ප්‍රවෘත්ති කාමර තුළ භාවිත කිරීමට වැඩි කැමැත්තක් දක්වන්නේ තරුණ මාධ්‍යවේදීන්ය. වසර 20කට වැඩි

පළපුරුද්දක් සහිත ජ්‍යෂ්ඨ මාධ්‍යවේදීන් එකී තාක්ෂණයට අනුගත වීමට අකැමැති ස්වභාවයක් දක්නට ලැබේ.

| දත්ත මත පදනම්ව පුවත්පතේ වැඩ කිරීමට ජනමාධ්‍යවේදීන් කැමති වුවද, පුවත්පතේ හිමිකාරිත්වයෙන් හෝ ඉහළ කළමනාකාරීත්වයෙන් බලපෑම් සිදුවේද | | ප්‍රකාශිත භාෂාව අනුව නියැදියට අයත් පුවත්පත් | | සමස්ත එකතුව |
|---|---|---|---|---|
| | | සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් | ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් | |
| අතිශය එකඟ නොවේ | ප්‍රමාණය | 1 | 3 | 4 |
| | ප්‍රතිශතය % | 2% | 6% | 8% |
| එකඟ නොවේ | ප්‍රමාණය | 3 | 4 | 7 |
| | ප්‍රතිශතය % | 6% | 8% | 14% |
| මධ්‍යස්ථයි | ප්‍රමාණය | 14 | 13 | 27 |
| | ප්‍රතිශතය % | 28% | 26% | 54% |
| එකඟයි | ප්‍රමාණය | 6 | 5 | 11 |
| | ප්‍රතිශතය % | 12% | 10% | 22% |
| අතිශය එකඟයි | ප්‍රමාණය | 1 | 0 | 1 |
| | ප්‍රතිශතය % | 2% | 0% | 2% |
| සමස්ත එකතුව | ප්‍රමාණය | 25 | 25 | 50 |
| | ප්‍රතිශතය % | 50% | 50% | 100% |

වගු අංක 10- දත්ත මත පදනම්ව පුවත්පතේ වැඩ කිරීමට ජනමාධ්‍යවේදීන් කැමති වුවද, පුවත්පතේ හිමිකාරිත්වයෙන් හෝ ඉහළ කළමණාකාරීත්වයෙන් සිදුවන බලපෑම

ඉහත දත්ත විශ්ලේෂණයට අනුව සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත්වලට (2%) වඩා ඉංග්‍රීසි පුත්පත් මාධ්‍යවේදීන් (6%) 'අතිශය එකඟ නොවන' බවට පිළිතුරු ලබා දී ඇත. ඉංග්‍රීසි පුවත්පත් මාධ්‍යවේදීන්ගෙන් (8%) ලැබුණු පිළිතුර වන්නේ 'එකඟ නොවේ' යන්නයි. මේ සම්බන්ධයෙන් 'මධ්‍යස්ථ' මතයක් දරණ බවට සිංහල පුවත්පත් මාධ්‍යවේදීන් 14 (28%) ක්ද ඉංග්‍රීසි පුවත්පත් මාධ්‍යවේදීන් 13 (26%) ක්ද පිළිතුරු ලබා දී තිබේ. එමෙන්ම ඉහත ප්‍රකාශයට 'එකඟයි' යනුවෙන් සිංහල පුවත්පත් මාධ්‍යවේදීන් 6 (12%) ක් ප්‍රතිචාර දක්වා ඇති අතර ඉංග්‍රීසි පුවත්පත් මාධ්‍යවේදීන් 5 (10%)ක් පමණක් ප්‍රතිචාර දක්වා තිබේ. සිංහල පුවත්පත් මාධ්‍යවේදියකු පමණක් (2%) ඉහත ප්‍රකාශයට 'අතිශය එකඟ වේ' යනුවෙන් ප්‍රතිචාර දක්වා තිබේ.

මෙය හුදෙක්ම ආකල්පමය ගැටලුවක් ලෙස දැක්විය හැකි අතර මෙය බහුලවම ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් ආයතනවල සාපේක්ෂව සිංහල භාෂාවෙන් ප්‍රකාශිත පුවත්පත් ආයතන තුළ ක්‍රියාත්මක වේ. බොහෝ පුවත්පත් ආයතනවල සේවය කරන සාම්ප්‍රදායික මාධ්‍යවේදීන් මෙම නව තාක්ෂණික ප්‍රවණතාවන්ට යොමුවීමට අකැමැත්තක් දැක්වීම ද ගැටලුවකි.

## නිගමන හා යෝජනා

### නිගමන

ශ්‍රී ලංකාවේ පුවත්පත් තුළ දත්ත භාවිත කිරීම සිදු වන්නේ අවම වශයෙන් වන අතර ඔවුන්ගෙන් බහුතරයක් භාවිත කරන්නේ රජය හෝ රජයට සම්බන්ධ පාර්ශ්වයක් විසින් නිකුත් කරනු ලබන නිල දත්ත ය. එසේ ම ගවේෂණාත්මකව හෝ තොරතුරු දැන ගැනීමේ පනත උපයෝගී කර ගෙන දත්ත භාවිත කිරීම සිදු වන්නේ අවම වශයෙනි. ඉංග්‍රීසි පුවත්පත්වලට සාපේක්ෂව සිංහල පුවත්පත් අවිධිමත් දත්ත භාවිත කරයි. එමෙන් ම දත්ත දෘශ්‍යකරණය සහ දත්ත ජනමාධ්‍යවේදය සම්බන්ධ පුහුණු වැඩසටහන් සඳහා පුවත්පත් ආයතන විසින් ජනමාධ්‍යවේදීන් යොමු නොකරයි. මෙම තත්වය ඉංග්‍රීසි පුවත්පත්වලට සාපේක්ෂව සිංහල පුවත්පත්වල ඉහළ මට්ටමක පවතී.

දත්ත ජනමාධ්‍යවේදය මෙරට පුවත්පත් තුළ ක්‍රියාත්මක නොවීමට බලපා ඇති ප්‍රධානම සාධකය වන්නේ මාධ්‍යවේදීන් තුළ ඇති නිශේධනීය ආකල්පය යි. පුවත්පතේ ඉහළ කළමනාකාරීත්වයේ නිශේධනීය ආකල්පය ද මෙයට බලපායි. එසේම අත්දැකීම් බහුල සහ වයසින් වැඩි ජනමාධ්‍යවේදීන් නව තාක්ෂණයට අනුගත නොවන බව මෙහි දී අනාවරණය විය. ඊට අමතර ව දත්ත ජනමාධ්‍යවේදය, දත්ත දෘශ්‍යකරණය සම්බන්ධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට කැමැත්තක් තිබුණ ද ඒ සඳහා කාලය නොමැති වීම සහ වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා මූල්‍යමය ගැටලු ඇති නිසා බොහෝ ජනමාධ්‍යවේදීන්ට මෙවැනි වැඩමුළු සඳහා සහභාගී වීමට නොහැකි වී තිබේ.

**යෝජනා**

දත්ත ජනමාධ්‍යවේදය සහ දත්ත දෘශ්‍යකරණය පිළිබඳ ඉගැන්වීම සඳහා නිසි පුහුණුව ලත් ගුරුවරුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සම්බන්ධ කර ගෙන දත්ත ජනමාධ්‍යවේදයේ සහ දත්ත දෘශ්‍යකරණයේ ඇති වැදගත්කම සම්බන්ධයෙන් ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීම සිදු කළ යුතුය. එකී දැනුවත් කිරීම පුවත්පතේ හිමිකාරිත්වයේ සිට ඉහළ කළමනාකාරීත්වය දක්වාත් ඉන් පසුව කර්තෘවරුන්ගේ සිට ජ්‍යෙෂ්ඨ ජනමාධ්‍යවේදීන් දක්වාත් සිදුවිය යුතුය. එමෙන් ම මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන න්‍යායාත්මක දැනුම වර්ධනය කිරීම සඳහා පර්යේෂණ පුළුල් කළ යුතුය.

පුවත්පත් ජනමාධ්‍යවේදීන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා අවස්ථාව ලබා දිය යුතු අතර ඒ සඳහා ආයතනගත පුහුණුව, බාහිර පාඨමාලා සඳහා යොමු කිරීම, ක්ෂේත්‍ර වැඩමුළු සඳහා සහභාගී කරවීම මෙන්ම අන්තර්ජාලය පදනම් කර ගත් ස්වයං අධ්‍යයන සඳහා යොමු කරවීම සිදු කළ යුතුය. මෙකී පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය ශිෂ්‍යත්ව පහසුකම්, අධ්‍යාපන ණය පහසුකම් ලබා දීමට රජය මෙන්ම අදාළ ආයතන ද කටයුතු කළ යුතුය.

**ආශ්‍රේය මූලාශ්‍ර**

Aneez, S. (2013). Sri Lankan experience of data journalism during the balance of payments crisis in 2008. In S. Winkelmann (Ed.), Data journalism in Asia.

Baranetsky, V. (2018). Data journalism and the law. Columbia Journalism Review.

Bojārs, U., & Bojārs, E. (2015). Open data in data journalists' workflow. Institute of Mathematics and Computer Science, University of Latvia, Riga, Latvia.

Gray, J., Bounegru, L., & Chambers, L. (2012). The data journalism handbook. O'Reilly Media, Inc.

Inanc, B., & Dur, U. (2014). Data visualization and infographics in visual communication design education at the age of information. Journal of Arts and Humanities, 3(5), 39-50.

Islam, A. (2018). Making sense of data journalism from Bangladesh perspective. Global Media Journal, 16(31), 154.

Kalatzi, O., Bratsas, C., & Vegli, A. (2018). The principles, features, and techniques of data journalism. Studies in Media and Communication, 6(2). Redfame Publishing.

Martin, T. S., & Rosa, L. L. (2018). Big data as a differentiating sociocultural element of data journalism: The perception of data journalists and experts. Communication & Society, 31(4), 193-209.

Nguyen, A., & Lugo, O. J. (2016). The state of data and statistics in journalism and journalism education: Issues and debates. Journalism, 17(1), 3–17.

Parasie, S., & Dagiral, E. (2012). Data-driven journalism and the public good: "Computer-assisted reporters" and "programmer-journalists" in Chicago. New Media & Society, 15(6), 853–871.

Porto, T. S. (2015). Data journalism, millennials & social networks: What does data journalism mean for journalists? And how it can affect millennials. University Fernando Pessoa.

Rogers, E. M. (1983). Diffusion of innovations (3rd ed.). The Free Press.

Sadiku, M. N. O., Shadare, A. E., Musa, S. M., & Akujuobi, C. M. (2016). Data visualization. International Journal of Engineering Research and Advanced Technology (IJERAT), 2(12).

Siricharoen, N., & Siricharoen, W. V. (2013). How infographic should be evaluated? ResearchGate.

Weber, W., & Kennedy, H. (2018). Data stories: Rethinking journalistic storytelling in the context of data journalism. Studies in Communication Sciences, 18(1), 191–206.

# ජනශ්‍රැතියෙන් ප්‍රභාවත් වූ නිර්මාණාත්මක සන්නිවේදන ශික්ෂානන්දය

(උලලේනා කේන්ද්‍රීය නිමිති, ජනකවි හා ඒ ආශ්‍රිත ගීත නිර්මාණ ඇසුරෙන්)

**ආචාර්ය විමල්සිරි මුණසිංහ**

**සංක්ෂේපය**

සාක්ෂරතාවෙන් තොර සමාජ පසුබිමක මිනිසා විසින් සම්මත හා ව්‍යවහාර කරගත් ආචාර, සාරධර්ම පද්ධතියක් ජනශ්‍රැතියෙ හි ගැබ් වී ඇති අතර, ජනශ්‍රැතිය හුදෙක් පොදුජන විශ්වකෝෂයකට සමාන ය. මුඛ පරම්පරාගත ව පවත්වාගෙන ආ පාරම්පරික දැනුම ජනශ්‍රැති මගින් තහවුරු වී තිබේ. මේ දැනුම ප්‍රායෝගික අත්දැකීම් ඔස්සේ පරපුරෙන් පරපුරට දායාද වූවකි. ජනශ්‍රැතිය කිසියම් ජන කොටසකට ඍජුව ම සම්බන්ධ වේ. මානව විද්‍යාව, සමාජ විද්‍යාව තුළ පමණක් නොව ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර ඔස්සේ අධ්‍යයනය කෙරෙන විෂයයන්වල දී ජනශ්‍රැතිය පිළිබඳ අවධානය යොමු කරයි. ජන කවි මතු වූයේ සිත කය වෙහෙසීමත්, කටුක ජීවිතයක් නිසා ලබන දුක් පීඩා අමතක කරනු පිණිස ය. ඔවුන්ගේ කවි අධික දුක් පීඩාවෙන් වෙහෙසවූවන්ගේ හදින් නැගී පිටවුණු දොම්නස් සුසුම් හා සොම්නස් සුසුම් වැන්න. පෙර නිමිති පිළිබඳ විශ්වාසය ගැමියන් අතර ප්‍රචලිතව පැවති ආකාරය ජන කවි පරීක්ෂා කිරීමේදී දැකිය හැකි ය. පූර්ව ඓතිහාසික යුගයේ ජනවහරේ උපන් නිමිති යන්න ලංකා ජනතාව අතර අදත් භාවිත වන ආරම්භය නිගමනය කළ නොහැකි අභිචාරාත්මක වචනයකි. උලලේනා හා බැඳුන ජනප්‍රවාද ද බොහෝ ය. උලලේනා ගැමි ගොවියන්ට "වැහි පෙර නිමිති" සපයන්නාක් මෙන් ම, විපත් ද දැනුම් දෙන්නෙකි. අප සමාජයේ ක්‍රියාත්මක වන සකල විවිධ විශ්වාස අතර උලමා සම්බන්ධ නිමිති ලාංකේය ගීත රචකයන් සිය නිර්මාණ කාර්යයන් හිදී කොතෙක් දුරට භාවිත කර ඇත්ද? යන්න විමසා බැලීම මෙම විස්තෘතයේ අපේක්ෂාවයි. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් පුස්තකාල පර්යේෂණ ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ඔස්සේ ගොනුකරනු ලැබූ අතර, මෙහි අරමුණ වූයේ උලලේනා සංකල්පය ජනකවිය සහ ගීත තුළ ගම්‍ය ව ඇති ආකාරය විමසා බැලීමයි.

**මුඛ්‍ය පදඃ** ජනශ්‍රැතිය, නිමිති, උලලේනා, ජන කවිය, ගීතය

**ජනශ්‍රැතිය**

ආර්. ඩී. ජෙම්සන්ගේ අර්ථ දැක්වීම්වලට අනුව ජනශ්‍රැතිය යනු ''දේශීය සිරිත් විරිත් කතා සහ සම්ප්‍රදායන් සමඟ කටයුතු කරන මානව විද්‍යාවේ ශාඛාවකි.'' Library of World Encyclopedia හි මිථ්‍යාවන්, සම්ප්‍රදායන් සහ විශ්වාසයන් සලකන ජනවාර්ගිකයන්ගේ ආනුභාවයන් හා චාරිත්‍ර වාරිත්‍ර සම්බන්ධ ස්වභාවය හා බැඳී මානසික දෘෂ්ටිය අධ්‍යයනය කිරීම ජනශ්‍රැතිය ලෙස අර්ථ දක්වා ඇත. ටයිලර්ට අනුව ජනශ්‍රැතිය ''වාචික හෝ සිරිත්විරිත් මගින් සම්ප්‍රදායෙන් උරුම කරනු ලැබූ දෙයකි.'' ජනශ්‍රැතිය ජනයා විසින් නිර්මාණය කර ගත්ත ද එය ජන ජීවිතය කෙරෙහි මෙන් ම සමස්ත සමාජය කෙරෙහි ද බලපැවැත් වේ. සාක්ෂරතාවෙන් තොර සමාජ පසුබිමක මිනිසා විසින් සම්මත හා ව්‍යවහාර කරගත් ආචාර, සාරධර්ම පද්ධතියක් ජනශ්‍රැතියෙ හි ගැබ් වී ඇති අතර, ජනශ්‍රැතිය හුදෙක් පොදුජන විශ්වකෝෂයකට සමාන ය. ජනශ්‍රැතිය පිළිබඳ පුළුල් අදහස් දැක්වීමක් කරන ඔවුන් ජන කවි, ජන කතා, ජනප්‍රවාද ආදියට අමතරව භාෂාව, සාහිත්‍ය, සංගීතය, නැටුම්, ක්‍රීඩා, චාරිත්‍ර, වාරිත්‍ර, අත්කම්, ගෘහ නිර්මාණ ආදී අංග රාශියක් ජනශ්‍රැති විෂයට අයත් වන බව දක්වමින් ජනශ්‍රැතිය පුළුල් ක්ෂේත්‍ර පථයක් බව නිරූපණය කිරීමට උත්සහ කොට ඇත. එසේ ම Folklore යන පදය හඳුන්වාදුන් විලියම් තෝමස් විසින් ජනසම්මත පුරාවස්තු සහ ජනසම්මත සාහිත්‍යය යන අංග ද පැරණි ජන කොටස් අතර පැවති සිරිත් විරිත්, වත්පිළිවෙත්, පාරම්පරික විශ්වාස ලෙස දක්වමින් ජනශ්‍රැති සංකල්පයේ පරාසය විග්‍රහකොට ඇත.

මුඛ පරම්පරාගතව පවත්වාගෙන ආ පාරම්පරික දැනුම ජනශ්‍රැති මගින් තහවුරු වී තිබේ. මේ දැනුම ප්‍රායෝගික අත්දැකීම් ඔස්සේ පරපුරෙන් පරපුරට දායාද වූවකි. ඒ නිසා ම වර්තමානිකයින්ට අතීත මුතුන්මිත්තන් අනුගමනය කළ මුඛ පරම්පරාගත දැනුම භාවිතයට ගත හැකි ය. ජනශ්‍රැතියේ සමාරම්භය කටවහර ඔස්සේ ප්‍රභවය ලබන අතර, ප්‍රභව බීජ මිනිසා විසින් දෛනික ජීවිතයේ දී ලබන ලද අත්දැකීම් මගින් පෝෂණය වේ. අත්විඳි අනුභූතීන් පුද්ගලයා විසින් රෝපණය කරනු ලබන්නේ ස්වකීය කුටුම්භය හෙවත් න්‍යෂ්ටික පවුලෙහි ය. ඒ සඳහා ඔහු දෛනික ජීවිතයේ දී ලැබෙන කාල අතිරික්තය උපයෝගී කර ගන්නා ලද බව පැහැදිලි වේ. ''ජන ජීවිතයේ විවිධ අංශ ආශ්‍රිතව නිපැයුණු අංග ගණනාවක් ජනශ්‍රැතියේ දක්නට ලැබේ. මානවයාගේ රැකිරක්ෂා, ගමනාගමනය, ශාන්තිකර්ම, විනෝදාංශ, සිරිත් විරිත්, ඇදහිලි ක්‍රම ආදිය ඇසුරෙන් ජනිත වී ඇති

ජනශ්‍රැතිවලින් පිළිබිඹුවන සාහිත්‍යමය ගුණාංග පිළිබඳව ද විශේෂයෙන් අධ්‍යයනය කිරීමට හැකි ය. ජනයා පිළිබඳ විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ යුරෝපීය ජාතිකයන් අතිනි. ඔවුන් විසින් ජනශ්‍රැතිය යන වචනය මුලින් ම භාවිත කිරීම සුදුසු යැයි පිළිගෙන තිබේ. ඊට පෙර ජනශ්‍රැතිය යන්න හඳුන්වා ඇත්තේ ජන සම්මත පුරාවස්තු, ජන සම්මත සාහිත්‍ය වශයෙනි. මීට ගෝත්‍රික මිනිසුන්ගේ ගති පැවතුම්, චර්යාධර්ම, සිරිත් විරිත්, පිරුළු, කවි, කතා ආදී සියල්ල ඇතුළත් වේ'' (රත්නපාල, 1986).

ජනශ්‍රැතිය තුළ මිනිසුන්ගේ සම්ප්‍රදායන් පිළිබඳ නොලියවුණු දෑ අන්තර්ගත වේ. එය තුළ මෙම සම්ප්‍රදායන්ගේ විවිධ අන්තර්ගත සහ ප්‍රකාශිත විධි (හැඩතල) අන්තර්ගත වේ. එමෙන් ම එම සම්ප්‍රදාය පුද්ගලයාගෙන් පුද්ගලයාට සන්නිවේදනය වන ආකාරය විලාසිතා හෝ ශිල්පක්‍රම ද මේ තුළ අන්තර්ගත වීම විශේෂත්වයකි (Brunwand, 1978).

ගීතයක්, ප්‍රසංගයක්, ඉදිරිපත් කිරීමක් හෝ නිර්මාණයක් ඒ හා බැඳි සංස්කෘතිය හෝ උප-සංස්කෘතිය පිළිබඳ වැටහීමකින් තොරව මනාව තේරුම්ගත නොහැක. එමෙන් ම කිසිම කලාත්මක නිර්මාණයක් ඒ හා බැඳි අඛණ්ඩව පවතින නිර්මාණ පරිභෝජන රටාවෙන් තොරව හඳුනාගත නොහැක (Ives, 1978). ජනශ්‍රැතිය යන පර්යාය පදය 1846 බිහිවුව ද මෙම 'ජන' යන්නට ඉමහත් දිගු ඉතිහාසයක් තිබේ. මෙහි ලා ඉදිරිපත් ව තිබෙන අර්ථකථන, නිර්වචන බොහෝ ය. නමුත් ඒ සියල්ලෙන් ම මානවයාගේ නිර්මාණශීලි සාමූහික ක්‍රියාකාරිත්වය පිළිබඳ පැහැදිලි අදහසක් ලබා දේ. ජනශ්‍රැතිය යනු සාම්ප්‍රදායික මෙන් ම වෙනස්වීම අනිවාර්යයෙන් ම සිදුවන නමුත් එය ඉතා ම මන්දගාමී ව ක්‍රියාත්මක වන දෙයකි. මතකය වෙනස් වීම හා අමතකවීම යන කරුණු මත ජනශ්‍රැතිය ක්‍රමිකව වෙනස්වන පදාර්ථයකි. නමුත් එය සාම්ප්‍රදායික මානව ප්‍රකාශනයකි (Berrias, 1937).

ජනශ්‍රැතිය තරම් මානව ඉතිහාසය පුළුල්ව හදාරන, එතරම් ඈතට දිවයන අන්දමේ විෂය ක්ෂේත්‍රයක් තවත් නොමැත. විවිධ සංස්කෘතික ප්‍රකාශන අතර, තිබෙන එකිනෙක සබඳතාව හදාරනු ලබන විෂය ක්ෂේත්‍රය වන්නේ ජනශ්‍රැතියයි. මානව ස්වරූපය මෙතරම් ගැඹුරින් හදාරනු ලබන්නේ ජනශ්‍රැතිය තුළ ය. අපගේ පොදු මානව ධර්මතාව,

මානවීයත්වය, මානව අත්දැකීම් හා ගතිකතාව පුළුල්ව හදාරනු ලබන්නේ ජනශ්‍රැතිය තුළ ය (Wilson, 1996).

''ජනශ්‍රැතිය'' යන පදයට සම්මත වූ නියත තේරුමක් ලබාදීම අසීරු බව උක්ත විග්‍රහයන්ගෙන් පැහැදිලි වෙයි. ජනශ්‍රැතිය යන්න පැහැදිලි කරන ශාස්ත්‍රඥයෝ වැඩි දෙනෙක් එය සමාජ මානව විද්‍යාවේ කොටසක් ලෙස හඳුන්වා දෙති. අද වන විට ජනශ්‍රැති පිළිබඳව අධ්‍යයනය කිරීම ලොව විවිධ රටවල් අතර, ඉතා දියුණු විද්‍යාවක් නොහොත් ශාස්ත්‍රයක් බවට පත්ව තිබේ. සිංහල ජනශ්‍රැතිය පිළිබඳ විවිධ අධ්‍යයනයන් සිදුකළ හෙන්රි පාකර් විසින් 'සිංහල ජනකතා' නම් ග්‍රන්ථයේ ජනකතා ක්‍රමානුකූල පදනමක් මත පරිවර්තනය කරමින් වර්ගීකරණය කොට ඉදිරිපත් කරන ලදී. ඔහුගේ පැරණි ලංකාව (Ancient Ceylon) නම් කෘතියේ ලාංකේය ජනශ්‍රැතිය පිළිබඳ විවිධ අයුරින් විමසීමට ලක්කර ඇත. මීට අමතරව හියු නෙවිල්ගේ 'තැප්‍රොබේනියස්' නම් ශාස්ත්‍රීය සංග්‍රහය පැරණි ලංකාවේ ජනකවි, චාරිත්‍ර වාරිත්‍ර, උත්සව, නාට්‍ය ගීත, ජන නැටුම් හා කුලය ආදිය පිළිබඳ මානව වංශ විද්‍යාත්මක තොරතුරු අන්තර්ගත ශාස්ත්‍රීය සංග්‍රහයකි.

ජනශ්‍රැතිය කිසියම් ජන කොටසකට ඍජුව ම සම්බන්ධ වේ. මානව විද්‍යාව, සමාජ විද්‍යාව තුළ පමණක් නොව ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍රයන් ඔස්සේ අධ්‍යයනය කෙරෙන විෂයයන්වල දී ජනශ්‍රැතිය පිළිබඳ අවධානය යොමු කරයි. මානව විද්‍යාවේ බොහෝ අධ්‍යයන පර්යේෂණයන් හි සිද්ධාන්ත තහවුරු කිරීම සඳහා ජනශ්‍රැති දැනුම උපයෝගී කරගන්නේ දහනව වන සියවසේ මැද භාගයේ සිට ය. ඊ.බී. ටයිලර්, සර් ජේම්ස් ෆ්‍රේසර්, බී. මැලිනොවුස්කි, රැඩ්ක්ලිෆ් බ්‍රවුන්, ෆ්‍රාන්ස් බෝවාස් වැනි මුල් කාලීන මානව විද්‍යාඥයින් පමණක් නොව ඊ.ආර්. ලීච්, රේමන්ඩ් ෆර්ත්, එවන්ස් ප්‍රිට්චාර්ඩ් ආදී විසිවන සියවසේ මානව විද්‍යාඥයින් ද මෙහි වැදගත්කම පෙන්වා දී ඇත. විශේෂයෙන් ම මෑතක සිට සමාජ හා සංස්කෘතික මානව විද්‍යාඥයන් ජනශ්‍රැතියේ නොයෙකුත් ස්වරූප හා එහි විවිධ අංගෝපාංග පිළිබඳ පැහැදිලි අර්ථකථන ඉදිරිපත් කොට ඇත.

ජනශ්‍රැතියෙන් වර්තමාන සමාජයට උපදේශ ලබා දීම වෙළඳ දැන්වීම් තුළ සුලබව දක්නට ලැබේ. එයට හේතු වී ඇත්තේ ජනශ්‍රැතිය ජනයාට ඉතා සමීප මාධ්‍යයක් වීම ය. ජනශ්‍රැතිය නිර්මාණාත්මක සන්නිවේදනයෙහි ලා භාවිත වෙමින් ක්‍රියාත්මක වන ආකාරය ද

ප්‍රශස්ත ය, ජනශ්‍රැතිය එසේ ජනතාවගේ නිර්මාණ කෝෂ්ඨාගාරයක් ලෙස භාවිත කිරීමට හේතුවන ලක්ෂණ කිහිපයක් ජනශ්‍රැතිය හා නිර්මාණාත්මක සන්නිවේදනය කෘතිය තුළ අන්තර්ගතව ඇත.

ජනශ්‍රැතිය කාලාන්තරයක් තිස්සේ ජන සමාජය තුළ භාවිත ව තිබීම, ජනයා තුළ ජනශ්‍රැතිය කෙරෙහි තිබෙන සමීපත්වය, මානවයාගේ සවිඥානික හා අවිඥානික වශයෙන් ජන විඥානය තුළ එය තැන්පත් ව තිබීම, හුරුපුරුදු සංඥා, සංකේත හා අර්ථකථන සමුදායක් ජනශ්‍රැතිය තුළ තැන්පත්ව තිබීම, ප්‍රතිඵල පිළිබඳව තිබෙන නියත විශ්වාසය, හුරුපුරුදු රසිකත්වය හා දිගුකාලීන වශයෙන් ගොඩ නැගී තිබෙන විනෝදාස්වාදන මාධ්‍යයක් වීම, සක්‍රීය ප්‍රජා සහභාගිත්වය, ප්‍රජාවගේ නිර්මාණශීලීත්වය මත ජනශ්‍රැතිය තවදුරටත් සම්ප්‍රදාය තුළ විවිධ ආකාරයට අර්ථ නිරූපණය වෙමින් ඉදිරියට නිර්මාණය වීම, ජනප්‍රිය සංස්කෘතිය තුළ බොහෝවිට ආකර්ෂණීය ලෙස වඩාත් කෙටි කාලයකින් ජනගත වීම කෙරෙහි ජන විඥානය, ජන රසිකත්වය බලපාන නිසා මාධ්‍ය හා තාක්ෂණය තුළ කලා කර්මාන්තය (Art Industry) වර්ධනය කෙරෙහි ජනශ්‍රැති චරිත, කතා, ප්‍රතිරූප දායක කර ගැනීම, මානවයාගේ සැබෑ තත්ත්වය ගැබ්ව පවතින මූලාශ්‍රයක් ලෙස ජනශ්‍රැතිය සලකනු ලැබීම. මේ නිසා ජනශ්‍රැතිය තුළ බොහෝ මානව තත්ත්වයන් ගැබ්ව තිබීම සුවිශේෂී ලක්ෂණයන් ය (දනන්සූරිය, 2002).

ලෝකයේ බොහෝ රටවල නිර්මාණකරුවන්, ආකෘති සපයා ගන්නේ තම රටේ හෝ වෙනත් රටක වූ ඉපැරණි ශ්‍රැති පරපුරෙන් බව පෙනී යයි. ජීවිතය සඳහා ආදර්ශ සැපයෙන්නේ රූපකවලිනි. රූපක භාෂාවේ මතු නොව, අපේ ජීවිතයේ චින්තන රටා සහ සංකල්ප රටා ඔස්සේ ද පැතිර ඇත.

**ජන කවිය**

ඉංග්‍රීසි ජන ගී (English Falk Songs) නමැති ග්‍රන්ථය රචනා කළ සිසිල් ජේ. ෂාර්ප් ගේ අදහස නම් ශිෂ්ට හෝ අශිෂ්ට වේවා මිනිසා තම සිතෙහි උපන් අදහස් අන්‍යයන්ට ප්‍රකාශ කිරීමේ ආශාව සහජයෙන් ම ගෙනෙන ලද්දක් වූ අතර, මේ සහජ ආශාව නිසා කවියේ උපත සිදුවන්නට ඇත යන්නයි. එපමණක් ද නොව මිනිසාගේත්, සතුන්ගේත් ඇති ප්‍රධාන වෙනස නම් ස්මරණ ශක්තියයි. සතුන් ජීවත් වන්නේ එදිනෙදා ලෝකයක ය. නැතහොත් එසැණ

ඇතිවන හැඟීම් මත ය. අතීත සිතුවිලි හෝ, අත්දැකීම් සතුන්ගේ මතකයෙහි නැත. සතුන්ගේ මනෝ ජීවිතය සම්බන්ධයෙන් තොරතුරු දැනීම් සමුදායකි. එහෙත් වනචාරී යුගයේ ජීවත් වූ මිනිසාගේ සිතෙහි පවා අතීත අත්දැකීම් ගබඩා වී තිබුණි. අවශ්‍ය වූ විට එම පින්තූර රාමුව උඩු හිතට ගෙන එයි. මෙකී මතක තබා ගැනීමේ ශක්තිය නිසා මිනිසා ආස්වාදයක් ලබයි. වනචාරී අවධියේ ජීවත් වූ මිනිසා පවා ඔහු මුහුණ පෑ අතීත ත්‍රාසජනක සිද්ධීන් මතකයට ගෙන රඟපෑමෙන් හෝ වචනයෙන් ප්‍රකාශ කිරීමේ ශක්තියක් තිබුණේ ය. ඒ සිද්ධිය රිද්මයක් හා තාලයක් ඇතිව ප්‍රකාශ කිරීමෙන් කවියේ උපත සිදුවන්නට ඇතැයි ඔහු විශ්වාස කරයි (ගමගේ, 2002).

කෘෂිකාර්මික යුගයට පා තැබීමෙන් පසු, ඉර, හඳ, පොළොව ආදී ස්වාභාවික වස්තූන් දෙවියන් වශයෙන් ද, අව්ව, වැස්ස, සුළඟ දේව වරප්‍රසාදයෙන් ලැබෙන දේවල් වශයෙන් ද ප්‍රාථමික ජනයා සැලකීය. යක්ෂ, භූත, යාග විධිවලට අමතරව දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමට ද මිනිසා පෙළඹුණේ ය. ගොවිතැන ආරම්භ කිරීමෙන් පසු ගොවිතැනේ සශ්‍රීකත්වය, පත්තිනි දේවතාවියගේ අනුග්‍රහයෙන් සිදු වන්නේ යන විශ්වාසය මත අතීතයේ සිට පත්තිනි දේවතාවිය සඳහා පුද පූජා පැවැත්වූහ. පොල් පූජාව, අං කෙළිය ඉන් සමහරකි. මේ යාග විධීන්හි භාවිත කරන කන්නලව් බොහෝ සෙයින් ම ගැමි ජනයා භාවිත කරන කන්නලව්වලට නෑකම් කියයි. එය පහත ජන කවියෙන් මනා ලෙස ගම්‍ය වේ.

සසරිබර - මෙසිරි ලක - කඳ කුමරු සාමිනේ
දොළහ පත්තිනි දෙවියනේ රකිනු අප සැම දිනේ
පත්තිනි සිරි කොමඟා- බැස දෙදෙන යන මගා
විලක් දැක එහි යොදා - එවිල මැද සපුරුකා

සිංහල ජන කවියේ උපත සෙවීමට මූලාශ්‍ර ග්‍රන්ථයන්ගෙන් ද එතරම් පිටිවහලක් නොලැබේ. බුද්ධඝෝෂ හිමියන් විසින් ලියන ලද පාලි අටුවා ග්‍රන්ථයක් වූ "සාරත්ථප්පකාසිනියෙහි" ඇල් ගෙවිලියක විසින් ජාති, ජරා, මරණ යන ත්‍රිලක්ෂණය ප්‍රකාශ කරන ලද ගීයක් ගායනා කරනු අසා සිටි සිව් සැට නමක් භික්ෂූන් රහත් වූ හ' යි සඳහන් වේ. මේ ප්‍රවෘත්තිය සිංහල උගතුන් කාව්‍ය ග්‍රන්ථ රචනා කිරීමට ප්‍රථම වූ සිද්ධියක් සේ සැලකිය හැකි ය. ජන කවියේ උපත සෙවීමේ ආශාව

නූතන විචාරකයන්ට මෙන් ම, පෙර විසූ ජන කවියන්ට තිබුණු බවට උදාහරණ වශයෙන් පහත සඳහන් ජන කවිය පෙන්වා දිය හැකි ය.

අහස උපන් තැන් සකි නුඹ දන්නවද
පොළොව උපන් තැන් සකි නුඹ දන්නවද
මුහුද උපන් තැන් සකි නුඹ දන්නවද
සිව්පද උපන් තැන් සකි නුඹ දන්නවද
(තිලකරත්න, 1971)

විද්‍යාත්මක දැනුමෙන් පෝෂණය නො වූ ආදී යුගයේ ජීවත් වූ මිනිසාට අහස, පොළොව, මුහුද ආදී ස්වභාවික වස්තූන් ඇති වූ ආකාරය හා ඇති වූ වකවානුව පිළිබඳ මහත් සැකයක් තිබුණු බව පුදුමයට කරුණක් නො වේ. ඒ ස්වභාවික වස්තූන් ගේ නිර්මාණය මෙන් ම සිවුපදය ආරම්භය සිදු වූ වකවානුව ද එය සිදුවූයේ කෙසේ ද? යනාදී විස්තර ද දැන ගැනීමේ අවශ්‍යතාවක් තිබුණු බව ඉහත සඳහන් ජන කවියෙන් ප්‍රකාශ වේ.

ඉරුටත් එපිට ඉරු දෙවියන්ටත් එපිට
සඳුටත් එපිට සඳ දෙවියන්ටත් එපිට
රජුටත් එපිට රජ දරුවන්ටත් එපිට
ඊටත් එපිට සිව් පදයක් කියන් මට
(සිරිසේන, 2014)

''ඉරුටත් එපිට, සඳුටත් එපිට'' යනුවෙන් සඳහන් කළේ දීර්ඝ ඉතිහාසය සිහි ගැන්වීම පිණිස ය. එහෙත් තුන්වැනි පාදයෙන් කවියා, මානව ඉතිහාසය අපේ මතකයට ගෙන මේ කවියෙන් අපේ පැරණි ජන කවියා ද, කවියේ උපත සිදුවූයේ ග්‍රාම්‍ය යුගයේ දී ය යන ආකල්පය දැරූ බව පැහැදිලි වේ. අද පොදු ජනයා අතර ව්‍යවහාර වන ජන කවි විවිධ නම්වලින් හඳුන්වා ඇත. එසේ ව්‍යවහාරයේ පවත්නා නම් අතර ජන කවි, ගැමි කවි, ගම්බද කවි යන ව්‍යවහාර තුළ ජන කවිය ගමට ම සීමා වූවක් යන්න ආකල්පයක් ගොඩනැගුන ද ජනකවි ගමටත් නගරයට පමණක් නොව ජනතාවට ම පොදු වූවකි.

"ජන කවි මතු වූයේ සිත කය වෙහෙසීමත්, කටුක ජීවිතයක් නිසා ලබන දුක් පීඩා අමතක කරනු පිණිස ය. ඔවුන්ගේ කවි අධික දුක් පීඩාවෙන් වෙහෙසවූවන්ගේ හදින් නැගී පිටවුණු දොම්නස් සුසුම් හා සොම්නස් සුසුම් වැන්න. උගතුන් හා නූගතුන් ද, ධනවතුන් හා දිළින්දන් ද එකසේ පෙළෙන මෙකල සමාජයේ තතු දකින

කවියකුගේ හදින් නගින හැඟීම හා පැතුම් කීමට උචිත බසක්, රීතියක්, තාලයත් සඳහා ජන කවියෙන් යම්කිසිවක් උගත හැකි ය. ඔවුනොවුන් නියැළී සිටින්නා වූ ජීවන වෘත්තීන් පිළිබඳ මෙන් ඔවුන් ඇසූ පිරූ තැන් සහ ඔවුන්ගේ දුක, සතුට ආදී අනෙක් ආකාර අත්දැකීම් මෙකී නොකී සියලු දෑ ජන කවිය තුළින් පිළිබිඹු විය. ස්වාභාවික සෞන්දර්යයෙන් පෝෂිත වූ ජන කවිය මගින් ගැමි කවීන්ගේ සහජ කවිත්වය මෙන් ම නිර්ව්‍යාජ සිතුවිලි සමුදාය මැනැවින් හෙළිදරව් කෙරේ" (ගුණවර්ධන, 1996).

එලෙස සැකසුණු ජන කවිය එදා මෙදා තුර මුඛ පරම්පරාගත ව පැවතුණු අතර, ව්‍යාප්ත සම්ප්‍රදායෙන් පද්‍ය මෙන් ග්‍රන්ථාරූඪ කිරීමක් සිදු නොවී ය. ජන කවිය ග්‍රන්ථාගත වූවක් නොව ක්ෂණයෙන් සිතට නැගෙන හැඟීම් ආශ්‍රයෙන් පබඳින ලද්දකි. ඔවුන් සතුව ඇත්තේ සහජ කවිත්වය පමණි. සිංහල ජන කවිය සිංහලයාගේ උත්පත්තියේ සිට මරණය දක්වා ම ජීවිතය හා සම්බන්ධ වූ සාහිත්‍යයක් බව පැවසීම අතිශයෝක්තියක් නො වේ. උපත ලබා රන්කිරි කට ගා නැළවිලි ගීයෙන් සුවය ලබන දරුවාගේ සිට මරණය තෙක් ජීවිතයේ විවිධ අවස්ථාවන් පිළිබඳ තේමා ජන කවියේ අන්තර්ගත වේ. වෙස්සන්තර ජාතකය, යශෝදරාවත වැනි ජන කවි පරපුරෙන් පරපුරට මරණයක දී ශෝකී වූවන්ගේ සිත් සනසාලයි. මහනුවර යුගය ආරම්භ වෙත් ම සම්භාව්‍ය සාහිත්‍යයේ පිරිහීම ආරම්භ වී ජන කවි පෙරට ආ බව විද්වතුන්ගේ අදහස වී ඇත.

**පෙරනිමිති**

පෙරනිමිති පිළිබඳ විශ්වාසය ගැමියන් අතර ප්‍රචලිත ව පැවති ආකාරය ජන කවි පරීක්ෂා කිරීමේදී දැකිය හැකි ය. ගමනක් සඳහා පිටත්ව යාමේ දී මුලින් ම ඉදිරියට හමුවන පුද්ගලයා ද යම් කිසි කටයුත්තක් ආරම්භයේ දී සිදුවන පළමු සිදුවීම ද පෙරනිමිති වශයෙන් ගැමියෝ සැලකූහ (අස්සජි හිමි, 1990).

හූනා, කැරලා, නරියා, උලමා, කබරගොයා, පෙරනිමිති ප්‍රකාශ කරන සත්ත්වයෝ ය. හූනාගේ හැඬීම අසුබ බාධා ගෙන දෙන්නක් ලෙස බොහෝ ප්‍රදේශවල ගැමියෝ විශ්වාස කරති. කැරලා ශෝක, මරණ, දිගු නියං සමයක පෙර නිමිති දැක්වීම හා බාධක ගෙන දෙන පක්ෂියෙකි. ඉතා ම අප්‍රසන්න හඬක් ඇති කැරලා දුර්නිමිති කාරක පක්ෂියෙකු බව විශ්වාසය යි. නරි හූ කීම ද අසුබ පල දෙන දුක් නිමිත්තක් වන අතර කබරගොයෙක් නිවසට පැමිණීම වූ කලී ගෘහ

මූලිකයාගේ ජීවිත සංස්කාරයන් හි අවසානය දක්වන්නක් යනු ජන විශ්වාසය යි. ඉහත දක් වූ පෙරනිමිති පිළිබඳ පවත්නා ජන විශ්වාසය ජන කවි රැසකින් දැක ගත හැකි ය (චන්දන හිමි, 1990).

පූර්ව ඓතිහාසික යුගයේ ජනවහරේ උපන් නිමිති යන්න ලංකා ජනතාව අතර අදත් භාවිත වන ආරම්භය නිගමනය කළ නොහැකි අභිචාරාත්මක වචනය කි. සුබ මෙන් ම අසුබ නිමිති අනුව අනාවැකි කීමට සිංහල ගැමියා උපන් හපනෙකි. උලළිහිණියා, උලලේනා හෙවත් උලමාගේ හැඬීම අපේ ගැමියන් සලකන්නේ අසුබ සිදුවීමක පෙර නිමිත්තක් ලෙසිනි (ආරියරත්න, 1996). උලමා හෙවත් උලලේනාගේ හඬ අප්‍රිය කරන ගැමියෝ උගේ බිහිසුණු හඬින් පූර්ව නිමිති දුකක් වන බව විශ්වාස කරති. උලමාගේ 'සොහොන් බෙර ගැසීම' යනුවෙන් හඳුන්වන බියකරු හඬ කලාතුරකින් අසන්නට ලැබෙන්නෙකි. සමහර විට එම හඬ පුද්ගලයෙකුට ජීවිත කාලයේදී ම එක් වරක්, දෙවරක් පමණක් ඇසීමට ලැබෙන්නකි. ගම්මාන පිටින් ම විනාශ වී යා හැකි වසංගත රෝගයක් හෝ ගසකින් වැටී හෝ අලියෙකු ගසා හෝ කිසිවෙකු මිය යාම වැනි ශෝක ජනක මරණ පිළිබඳ පූර්ව නිමිත්තක් දැක්වීම උලමාගේ සොහොන් බෙර ගැසීමෙන් සිදුවන බව ගැමියෝ විශ්වාස කරති (චන්දන හිමි, 1992).

සාමාන්‍යයෙන් උලමා සොහොන් බෙර ගැසීමට අමතර ව නඟන හඬක් ද ඇත. ඒ හඬ ද බියකරු ය. එම හඬ නොඋස්ය. ශෝකාකුල ය. එහෙත් බිහිසුණු බවක් පළ කරන්නේ ය. යනුවෙන් ඔරුක්මාන්කුලමේ චන්දන හිමි නුවර කලාවියේ නිමිති නම් කෘතියේ සඳහන් කරයි. උලමා පිළිබඳ සංකල්පය ආර්. එල්. ස්පිට්ල්ගේ FAR OFF THINGS නම් කෘතියේ විමර්ශනයකට ලක් කොට තිබේ. වැඩි වශයෙන් රාත්‍රී කාලයේ දී පමණක් ඇසෙන අමනුෂ්‍ය ශබ්දයකට බඳු හඬින් උලමා අඳුනාගත හැකි ය. ගැමියෝ මේ බිහිසුණු හඬ නිසා උලමා අප්‍රිය කරති (හෙට්ටිආරච්චි, 1974). දිවා කාලයේ ඈත කැලයේ වෙසෙන උලලේනාට ව්‍යවහාර කරන ප්‍රචලිත නම උලමා ය. ඌටම යක්කුරුල්ලා යන්න ද යොදයි. මන්ද? ඒ කුරුල්ලාට අමනුස්සයෙක් ආවේස වී ඉන්නවාය යන්න ගැමියන්ගේ විශ්වාසයයි.

උලලේනා හා බැඳුන ජනප්‍රවාද ද බොහෝ ය. උලලේනා ගැමි ගොවියන්ට 'වැහි පෙර නිමිති' සපයන්නාක් මෙන් ම, විපත් ද දැනුම් දෙන්නෙකි. රාත්‍රි පෙරයම හැඬීම, ඉඩෝරය දීර්ඝ වන බව දැනුම් දෙන අතර, මැදියම හැඬීම වර්ෂාව ඉතා ම ළංව එන බවට දෙන

ඉගියකි. නිවසක වහල මත සිට හැඬී නම් එම නිවසේ ගැබිණිය මිය යෑම ඒකාන්ත බව කියා පායි. කාලාන්තරයක් මුළුල්ලේ උලලේන් විලාපයට සවන් යොමා ඇති ග්‍රාමීය ජනයා, උලලේන් පෙර නිමිති සත්‍ය බව විශ්වාස කරන්නේ ලබා ඇති අත්දැකීම් අනුව ය. එහෙත් ඔවුන්ගේ විශ්වාසයන් වල පරස්පරතාවන් ද නැත්තේ නොවේ. රෑ යාමේ නිර්වස්ත්‍රව හා හුදකලාව ගොස් උලලේනා හඬන ගසකින් උපුටා ගත් පොතු, තවත් ඖෂධ සංයෝග කොට අඹරා කළුවර අඳුන සකස් කරගත හැකි බවට මතයක් ගැමියන් අතර පවතී. මේ පොත්ත ගලවා ගත යුතුවන්නේ උලලේන් හඬත් සමඟ ම ය. එහෙත් එය ඉතා අසීරු ය, එහි යථාර්ථය නම් නිර්වස්ත්‍රව, හා හුදකලාව ගන අන්ධකාරයේ කිමිදී කවරෙකු හෝ උලලේනා හඬන ගසට ආසන්නවන විට ම උලලේනා ක්ෂණයෙන් ඈතට පියඹා යාම සිදු වේ. අන්ධකාරයේ අපට උලලේනා නොපෙනුන ද, නිශාචරයෙක් වන උලලේනාට ගසවෙත ට ළඟාවෙනු තැනැත්තා දැක ගත හැකි වේ. ගස ළඟට එන අමුත්තාට බියවන උලලේනා ඈතට පියඹා යෑම සාමාන්‍ය දෙයකි. කළුවර අඳුන නළලත තිලක තබා ගෙන නිර්වස්ත්‍ර වූ විට දිවා කාලයේ පවා ඒ තැනැත්තා කිසිවෙකුට දැක ගත හැකි නො වේ. ගසේ උලලේනා හඬන ඉසව්ව දැන ගෙන සීරු මාරුවට වහංවී ගොස් පොතු ගලවා ගැනීමට තරම් දක්ෂයින් ගම්වල සිට ඇති බව ජනශ්‍රැතියේ ම සඳහන් ය.

රෑ යාමේ හේන්වල පැල් රකින හේන් ගොවීන්ට නම් උලලේන් හඬ අරුමයක් නො වේ. හේනේ පැල හදන්නේ ලොකු ගහක දෙබලක් එක් පැල් කණුවක් සේ යොදා ගෙන ය. සමහර විටෙක උලලේනෙකු පැමිණ එම ගසේ ම අත්තක වසා විලාප නඟන අවස්ථා ද නැත්තේ නො වේ. පැලේ වාසය කරන්නේ හුදකලා පුද්ගලයෙකි. සමහර විට ඔහු ඒ වෙලාවේ තද නින්දේ ය. ඒ කෙසේ වෙතත් ඔහු, උලලේන් හඬට ඇති බිය නිසා ම උලලේනාගේ කටහඬ මුඛ බඳී. ඉන්පසු උලලේනා නිහඬවෙයි. උලලේනාගේ හඬ මුඛ බැඳීම භයානක ය. මුඛ බැඳි උලලේනා ඉගිලී ගොස් දිරාපත් වී ඇති අත්තකට පාත් වී එම දිරාපත් අත්ත බිඳී වැටුණොත්, උලලේනාගේ මුඛ වාඩම අහෝසි වී මුඛ බැඳි තැනැත්තා ගොළු බවට පත්වන බවත්, ඒ නිසා උලලේනාගේ මුඛ නොබැඳිය යුතු ය, යනුවෙන් කියමනක් ජනශ්‍රැතියේ පවතී.

උලලේනා හා බැඳුණු ජන විශ්වාසය විදාරණය කරමින් බඳින ලද ජන කවි අතර ඇති උලලේනාගේ මුඛ බැඳීම ගැන කියැවෙන ජන කවියක් පහත දැක් වේ.

උඩින් යන්ඩ උඩ බෝලේ        බඳින්නම්
බිමින් යන්ඩ බිම බෝලේ        බඳින්නම්
බෝල දෙකම එක බෝලෙට     බඳින්නම්
**උලලේනගේ** රහ දිව මුඛ        බඳින්නම්
(වත්තේවැව, 2002)

"රාත්‍රියේ පැලේ පැල් රකිමින් සිටින අවස්ථාවක එක්වර ම උලලේනා කෑ ගැසීම බිය දනවන කාර්යයකි මෙම තැතිය නැත්නම් බිය තුනී කර ගැනීම සඳහා  එම අවස්ථාවේ ස්වයං වින්දනය කර අල්ල මතට ශුක්‍රාණු රැගෙන එයට කෙළ පිඬක් ගසා ඉවතට විසි කිරීම එදා ගැමියා සිදුකළ කෙමක් වේ" (දළුපොත, 2024).

මේ බියකරු කුරුල්ලා සම්බන්ධයෙන් පවත්නා ජන ප්‍රවාද රැසකි. ඒ අතරින් මෙම නිරීක්ෂණයෙහි දී හමු වූ ප්‍රවාද ත්‍රිත්වයක් පහත සඳහන් කොට ඇත. "අඹු සැමි දෙදෙනෙක් කුඩා ගැහැනු දරුවකුත් සහිත පවුලක් ගමක ජීවත් වුහ. බේබද්දෙකු වූ සැමියා දිනක් සොරාගත් ගව දෙනක මරා ලබා ගත් මස් කුට්ටියක් ද අතැතිව පදමට මත්පැන් පානයකොට නිවසට ආවේ ය. ගෙනා මස් කුට්ටිය රාත්‍රී කෑමට සාදන ලෙස බිරිඳට ලබා දී ඔහු මත්පැන් පානය කරමින් පසෙකට වී සිටියේ ය. මස් පිසීමට සුදානම් වූ බිරිය එය වළඳක ලා කුස්සියෙහි තබා කිසිවක් ගෙන ඒම සඳහා ඉන් පිටතට ගියා ය. ඇය ආපසු එද්දී මස් කුට්ටිය එහි නොවී ය.  බෙහෙවින් බියටත් කලබලයටත් පත් ඇය හැම තැනකම එය සෙවූ නමුත් ඇගේ උත්සාහය නිෂ්ඵල විය. සැමියාගේ කුරිරුකම දන්නා කාන්තාව හැඬූ කඳුළෙන් යුතුව අඩඳබරයකට මූණදීමට සූදානමින් ඔහු කරාගොස් සිද්ධිය කීවා ය. පුදුමයකට මෙන් බිරියට පහර දීමට උත්සාහ නොගත් සැමියා එවැනි ම හොඳ මස් කුට්ටියක් ගෙන එන්නෙමි යි පවසා නිවසින් පිට වූයේ ය. මිදුලේ කෙළවරක සිටි සිය කුඩා දියණිය දුටු බේබදු පියා ඇය අඳුරු තැනකට කැඳවා ඝාතනය කොට ඇගේ ළපටි සිරුරෙන් මස් කුට්ටියක් කපා ගෙන ගොස් බිරිය අතට දුන්නේ ය. අහර පිස අවසනදී සැමියාට කෑමට ඇරයුම් කළ ඕ ඔහුට කෑම බෙදන්නට වූවාය. මස් වෑන්ජනයෙන් හැන්දට ගත් කොටසෙහි තිබුණු කුඩා ඇඟිල්ලක් දැක ඕ තිගැස්සුණා ය. ඒ තම දූගේ ඇඟිල්ලක් බව හඳුනා

ගන්නට ඇයට ගත වූයේ නිමේෂයකි. මගේ ළමයා කෝ.......... යි වියරු වැටුණියක සේ බිරිය විලාප නගද්දි බීමත් සැමියා රකුසකු මෙන් ඇය දෙස ගිනිකන ඇස් යොමා ගෙන බලා සිටියේ ය. සැමියාගේ බැල්මෙන් බිරිය සියල්ල තේරුම් ගත්තාය. තම අතතිබූ හැන්ද කොණ්ඩයෙහි ගසාගත් බිරිය මයේ ළමයා කෝ......යි විලාප නගමින් වල් වැදුණාය. යළි කවදාවත් ඈ ආපසු නොපැමිණියා ය. පසුව උලමෙකු බවට පත්වුණු ගැහැනිය, සිරුරකින් ආත්මය පලා යන හැම මොහොතකම, ඒ මළ සිරුර ගෙන යන, අවමඟුල් පෙරහැර දෙස ගසක සැඟවී බලා සිටින බව ගැමියෝ විශ්වාස කරති" (විජේපාල, 1997).

මෙය ද, උලලේනාගේ උත්පත්ති කතාවකි. "ගමක කාන්තාවක් සිටියා ය. ඇය විවාහ වී දියණියක ලැබීමෙන් පසු ඇයගේ සැමියා වියෝ විය. දියණිය තරමක් ලොකු මහත් වීමෙන් පසු ඈ වෙනත් විවාහයක් සිදු කර ගත්තා ය. ඇය, මස් මාංශවලට ඇත්තේ මහත් ගිජු බවකි. ඇයට තුන්වේලටම මස් මාංශයක් අවශ්‍ය ම විය. ඇගේ දියණිය පර අප්පාට (සුළු පියාට) දැක්වූයේ මහත් අකමැත්තකි. දියණිය සෑම විට ම පර අප්පාට විරුද්ධකම් සිදුකළ අතර, දිනක් බිරිඳ කුරක්කන් කැපීමට හේනට ගොසින් සිටි අතර, ඥාති දියණියත් බාප්පාත් අතර බහින් බස් වීමක් සිදුවිය. එහි දී බාප්පා ගල් කැටයක් අතට ගෙන දියණියට එම ගලින් දමා ගැසුවේ ය. එය දියණියගේ කන මැදට වැදීමෙන් පසු ඈ මිය ගියා ය. ඉන් අනතුරුව බාප්පා, දියණිය මස් කර මස් ව්‍යංජනයක් සහ බත් ද සකසා තබා කුරක්කන් හේනේ පැලට ගියේ ය. බිරිඳ කුරක්කන් හේනේ සිට ගෙදර පැමිණ, දැඩි කුසගින්න හේතුවෙන් දුවණිය ගැන නොසිතා ම, රෑ ආහාරය ගැනීම ඉර බැසීමටත් පළමු ආරම්භ කළා ය. ඇය කෑම කන අතරතුරේ ඇඟිලි පුරුකක් හමුවිය. ඇඟිලි පුරුකේ පුංචි මුදුවක් විය, එය තමාගේ දියණියගේ ඇඟිල්ලේ තිබූ මුදුව බව ඇයට පසක් විය. ඒ සමඟ ''අයියෝ! දෙයියනේ මං මේ කෑවේ දුවගේ මාළු නේද? දෙයියනේ" කියමින් විලාප නගා මස් භාජනයේ තිබුණ හැන්ද අතට ගත් ඈ, හැඳි මිටේ උල් කෙළවරින් හිස් මුදුනට ඇණගෙන එසැණ ම මැරී වැටුණා ය. පසුව ඇගේ මළ කඳෙන් උඩට නැගුන විශාල පක්ෂියෙකු ඈත වනාන්තරය බලා ඉගිලී ගිය බවත්, එම පක්ෂියා උලලේනා බවත් අදට ද ගැමියන්ගේ විශ්වාසයයි" (කුමාරතුංග, 2024).

උලමාගේ උපත් කතා අතර, මෙය වඩාත් ප්‍රකට කතාවයි. "අතීතයේ ඉතා ළෙන්ගතු බැඳීමකින් කල් ගෙවූ වැදි සහෝදරයෝ දෙදෙනක්

මහ වනයේ ගල් ලෙනක් තුළ ජීවත් වූහ. ඒ අතරින් බාල වැදි සහෝදරයා විවාහයට එළඹුණු අතර, ඔහු විවාහ ගිවිසගත්තේ ඉතා රූමත් වැදි තරුණියක සමඟ ය. මෙම විවාහය පිළිබඳ වැඩිමල් වැදි සහෝදරයා පසුවුයේ අසතුටිනි. දිනක් දෙදෙනා මී වද කඩන්නට මහ වනයට ගොස් ඇති අතර, අතරමගදී වඳුරකු දඩයම් කිරීමට බාල සහෝදරයා ගසකට නැගීම සිදුකළ අතර, මෙම අවස්ථාව තමන්ට සහෝදරයා ගේ බිරිය ලබාගැනීමට ඇති හොඳම අවස්ථාව බව සිතා ගසේ සිටි ඔහුට ඊතලයකින් විද ඝාතනය කරන ලදී. වැදි සිරිතට අනුව සහෝදරයා මිය ගිය පසු ඔහු ගේ බිරිය අනෙක් සහෝදරයාට හිමි වීම සම්ප්‍රදායයි. සහෝදරයා මිය ගිය බවට සාක්ෂි වශයෙන් ඔහුගේ සිරුරින් ඇඟිල්ලක් කපා බුලත් මඩිස්සලයේ දමා ගෙන වැඩිමලා රැගෙන ගියේය. මේ අතර බාල පුතුගේ පමාව පිළිබඳ වැදි මව සැලකිලිමත් වී, පමා වී ලෙනට පැමිණි වැඩිමහල් පුතුගෙන් සහෝදරයා ගැන විමසුවත් ඔහු නිසි පිළිතුරක් ලබා නොදුන් අතර, ඒ පිළිබඳ ශෝකයෙන් සිටින මව බුලත් විටක් කන්නට ලොකු පුතා ගේ බුලත් මඩිස්සලය ගත් මවට තමන්ගේ පොඩි පුතු ගේ සුළැඟිල්ල හමු විය. බාල පුතු මරා දමා ඇති බව තේරුම් ගත් ඇය, මර ළතෝනි දෙමින් විලාප තියමින් මහ වනයට දිව ගිය බවත්, මඟදී ඇය මිය ගිය බවත් පසුව ඇය උලමා නම් යක්ෂණිය වී නැවත ඉපදුණු බවත් ජනශ්‍රැතියේ සඳහන් වේ. ගම්මාන තුළට රාත්‍රියේ පැමිණ තම පුතු මියගිය ශෝකයට විලාප තියන්නේ ඒ උලමා ගේ අවතාරය බව නුවර කලාවිය ප්‍රදේශයේ ජනයාගේ විශ්වාසයයි'' (දළුපොත, 2024).

## උලලේනා සංකල්පය හා බැඳි ජන කවි

උලලේනා බොහෝ දෙනෙකු විසින් 'යක් කුරුල්ලා' නමින් හඳුන්වනු ලැබේ. මෙම පක්ෂියා රාජාලි පවුලට අයත් නිශාචර පක්ෂියෙකි. උගේ විලාප හඬට ඉතාම දැඩි හදක් ඇත්තෙකුගේ වුව ද හිත තැති ගන්වයි. මහ ගන වනාන්තරවල දිවි ගෙවන උලලේනා ගම් දනව්වලට ද පැමිණ උස් තුරු මුදුන්හි සිට ශබ්ද නගයි.

**උල ලේනයි උල ලේනියි** නාඩ බොල
නාඩා ඉන්ඩ තොට වරමක් දුනිය බොල
අනඳ මහ තෙරුන් පැටියෙක් බැන්ද බොල
මෙතේ බුදුන් බුදුවෙන තුරු නාඩ බොල

දහස් ගණන් පටවන්නේ කපු ගෝණී
මන්නාරන් පටවන්නේ ලුණු ගෝනී
'මේ හිමයේ ගස් ඔක්කොම පර වේණී
බුද්දන් සරණයට නාඩන් **උල** **ලේනී**

උඹ ඉගිලෙන අත්තටු දා වැටීයන්
ගහේ වහන පා දෙක දා වැටීයන්
හූයි කියන කට හඬ මුඛ බැඳීයන්
**උලලේනී** හතරට ඉරි තැළීයන්

මන්දාරමට උඩ ඉගිලෙන වැහි ලේනී
ගොනුගේ පිටේ බැන්දා වැනි බර ගෝණී
වෙලමැද අම්බලම කාටත් පර වේණී
මගේ දුකට නුඹ නාඩන් **උල** **ලේනී**
(සිල්වා, 1980)

සේවර දෙන්න රැව්දී ඉඳ සිතු ජෙනී
මේවර කරන ලෙසගහිම් හට යස මානී
රූබර රුවැති හඳ පානට මදු පානී
දෑවර හඬන හඬ මොකදැයි **උල** **ලේනී**

රැකල උලලේනා හඬ වියො දුක් වීම
පානු පැයේ ඇඬුවම වැහි ළඟ ඒම
තුන් දින යාම වහලේ උඩ ලෑම
අපලයි ගැබිණියක් හටවෙයි මිය යාම
(පොඩි අප්පුහාමි, 2010)

**පෙරනිමිති හා ගීතය**

සිංහල ගීත රචකයන් ඔවුන් හුරුපුරුදු කරගත් ඇදහිලි විශ්වාස මතින් ද නිර්මාණාවේශය ලබා තිබේ. එම විශ්වාස ද ඔවුන්ගේ විඥානයෙන් ඉවත්ව ගොස් නොමැත. ඇදහිලි යනු විශ්වාසය පදනම් කොට ගෙන පහල වන්නකි. ජන සමාජයක පුරාණයේ පටන් විශ්වාසය අරමුණු කොට ගෙන පැන නැගුණු ඇදහිලි රාශියක් දැක ගත හැකි ය. ජන සමාජයක පවන්නා ඇදහිලි, විශ්වාස පුද පූජා විධි හා අභිචාරාත්මක ක්‍රියා සොයා විමසීම සමාජීය විශ්ලේෂකයන් සතු ප්‍රමුඛ කාර්යයකි. අප සමාජයේ ක්‍රියාත්මක වන සකලවිද විශ්වාස අතර, උලමා සම්බන්ධ නිමිති ලාංකේය ගීත රචකයන් සිය නිර්මාණ කාර්යයන්හි

දී කොතෙක් දුරට භාවිත කර ඇත් ද යන්න විමසා බැලීම මෙම විස්තෘතයේ අපේක්ෂාවයි.

අධිනීතිඥ රන්බණ්ඩා සෙනෙවිරත්න විසින් රචිත ''උලලේනෝ'' ගීතය විපත හා වියෝව සංකල්පය පාදක කොට රචිත ගීතයකි. නුවරකලාවියේ අව්ව, වැස්ස හා සුළඟ වැනි ස්වාභාවික සංසිද්ධීන්ගෙන් පීඩා විඳින ගැමියාගේ කටුක බව ඔහුගේ ගීතවල ආත්මය විය. එම ප්‍රබන්ධවලින් නැගෙන්නේ එකී වේදනාවේ රිද්මයයි. ඔහු අතින් ලියවුණු මෙම ගීතය අස්පර්ශනීය සංස්කෘතිකාංග උරුමයක් අනාගතයට පවරාදීමක් බඳු ය.

**උලලේනෝ**

පාළුව දෙවනත් කරලා - නාඩං **උලලේනෝ**
කාටත් නුපුරුදු - තනිකම ඇති වෙනවා

හීත හුළං හිරිකඩයි - කැලේ අපට උරුමේ
උඹට පිහාටුයි - මට පැල්පතයි තියෙන්නේ
**උලලේනෝ** ..... //

ඉහිරුණ කිරි කොතලෙට ඉකි බිඳිලා පල නෑ
උඹටත් එක්කයි - මේ පැල් කවිය කියන්නේ
**උලලේනෝ** ..... //

සංසාරේ හැටි තමයි - වියෝග ඇති වන්නේ
නිවනට ගිය දා - මේ හැම දුක් නැති වෙන්නේ
**උලලේනෝ** ..... //

(සෙනවිරත්න, 1998)

ගීත රචක ප්‍රවීණ විචාරක ධම්මික බණ්ඩාරයෝ උලලේනෝ ගීත පිළිබඳ මෙලෙස අදහස් දක්වති. ''මෙම ගීතය රැක ඇහෙන විට පාළු, මූසල, මලානික ගතිය දැනෙනවා. සමහර ගීත තියෙනවා තමාට කැමති ආකාරයකට විඳගත හැකි ගීත. සමහර කෙනෙක්ට ඇත්තට ම මේ ගීතය දකින්න පුළුවන් **උලලේනා** නැත්නම් උලමා ගැන කියවෙන ගීතයක් බව. රාත්‍රී 11 ත් පාන්දර 1 ත් අතර වන්නි ගම් තුලානවල මහ කැළේ මැද්දෙන් ඇහෙන ශබ්දය උලමාගේ නාදයයි. එහි හරි ලස්සන දෙයක් තියෙනවා. ඔබ හිතන්න රෑ 12ට විතර ඇහෙන මේ උලමාගේ සද්දය එකදිගට ඇදීලා යන ශබ්දයක්. නමුත් උලමා දීර්ඝ ව හැඬුවායින් පසු, ආයෙත් කැළේ වෙන පැත්තකින්

එනවා ඒ සද්දෙ. එතකොට අපි කල්පනා කරනවා උලමා මේ පැත්තට ගියාද කියලා. සාමාන්‍යයෙන් ගැමි විඥානය අනුව නම් ඒ ගෙදර වැඩිහිටි මිනිස්සු ඉන්නවනම් කාමරයට එබිලා බලනවා ඒ මරණයේ සංකේතය බැවින්. අපේ ගම්වල බළල්ලු පොර කෑම, හූනා කෑ ගැසීම, කනකොකා වහලට උඩින් පියාඹා යෑම, පාන් කිරිත්තෙක් නිතර ගෙදරට ඒම, උලමා හූ කීම මංගල කාරණා හැටියට සලකන්නේ නෑ. නමුත් මෙතන, මේ රත්බණ්ඩා සෙනෙවිරත්න රචකයා අපි මතුපිටින් දකිනවාට වඩා එහා තැනකට මෙම ප්‍රබන්ධය හරහා අපව රැගෙන යනවා. මෙම ගීතයට පසුබිම් වී ඇත්තේ 1971 අප්‍රේල් කැරැල්ලයි. අප්‍රේල් 5 රෝහණ විජේවීර යාපනය බන්ධනාගාරේ ඉන්න විට මේ පැත්තෙන් තව කැරැල්ලක් මතු වුණා. එකල ජනතා විමුක්ති පෙරමුණේ ආකල්පයක් තිබුණා අපි පරාජයට පත් වුවහොත් මේ වනාන්තරවලට පසුබසින බව. එක්කෝ ළඟ ම ඇති වනන්තරයට හෝ විල්පත්තුවට. දැන් මෙහෙම පරාජිත කැරලිකරුවෙක් ඔහුට ඉන්නකොට තනිකම හා බිය දැනෙනවා. ඒ වගේම පරාජිත බව ජීවන යථාර්ථය යි. ඒ ඔහුගේ සඟයින් මියැදී ඇති නිසාවෙනි. ඒ එක්කම ඔහුට උලමාගේ කෑ ගැසීම ඇහෙනවා. ඔහු දන්නවා ඒක සුබ පෙර නිමිත්තක් නෙවෙයි. දැන් ඔහු වෙනදට වඩා යථාර්ථවාදී ව කල්පනා කරනවා. මෙය මාක්ස්වාදී චින්තනයක් හෝ භෞතිකවාදී චින්තනයක් නොවේ. ''පාළුව දෙවනත් කරලා නාඩන් උලලේනෝ....'' මම දැන් තනිවෙලා, මට මගේ සටන් සගයො නෑ. කාටත් නපුරු තනිකම් ඇතිවෙනවා. වරදිනවා කියන එක කාටත් එකයි උලලේනෝ. හීත හුළං හිරිකඩයි කැලේ අපිට උරුම. අපේ බලාපොරොත්තු පිංබරයි. ඉහිරුණු කිරි කොතලයට ඉකිබිඳලා එල නෑ. උඹටත් ඒක වෙනවා. ඒකයි මම පැල් කවිය කියන්නේ. මෙය කැරලිකරුවන්ට විතරක් සීමා වුණු දෙයක් නොවේ. අපේ ජීවිතයේ සමහර තැන්වල අපි කිරි කොතලයන් ඉහිරිව ගන්නවා, ජීවිතයේ හුදකලා වෙනවා, තනිවෙනවා, ප්‍රියයන්ගෙන් වෙන්වෙනවා, අප්‍රියයන් හා එක්වෙනවා. ඒ ඕනෑම මොහොතකට මේ ගීතය සාධාරණයි. අපිට ගීතයක අත්දැකීම පෞද්ගලික වුණහම සීමාසහිත පටු පිරිසක් පමණක් විඳගන්නවා. එතනින් එහාට ගියහම එය පුළුල් බවට පත්වෙනවා. දැන් අවසානයේ බුදුදහමට පැමිණ ඇත. සංසාරේ හැටි තමයි වියෝව ඇති වන්නේ. අද හිටියා හෙට නෑ. නිවනට ගිය දා මේ හැම දුක් නැති වන්නේ. අපිට මතක් වෙනවා ප්‍රබුද්ධ කාව්‍යයෙන් ප්‍රශ්න විමසන ආකාරය. බතක් පතක්, ගෙයක් දොරක් ලැබූ පමණින් සියල්ල සම්පූර්ණ වෙන්නේ නැත. නිවනට ගිය දා මේ හැම දුක් නැති වන්නේ. කපුගේ මෙය සඳහා දීර්ඝ ස්වර යොදා ගන්නවා,

උලලේනෝ යන වචනය සම්පූර්ණයෙන් ම ප්‍රයෝජනයට ගන්නවා. එය දීර්සාස්වර වචනයක් "(බණ්ඩාර, 2022).

කවියා ගැමියෙකුගේ ව්‍යාජයෙන් බෙණෙමින් උලලේනාට නාඩන් ලෙස ආයාචනා කරයි. මන්ද සීතලෙන් සුළගෙන් සිරිකඩෙන් බේරීමට උල ලේනාට පියාපත් ද ගැමියාට පැල්පත් ද ඇති බැවිනි. ඉහිරුණු කිරි කොතලෙට හඬා පලක් නැති බැවිනි. කවියා සිය ගීය මගින් අන්‍යාලාපයකින් කියා සිටින්නේ සකලවිද දුක්ඛ දොම්නස්නයන් මැද හඬා නොවැලපී අප ජීවත් විය යුතු බවයි (චන්දන හිමි, 1992).

මඩවල එස්. රත්නායක නම් විශිෂ්ට ගී ප්‍රබන්ධ රචකයා ද ජනශ්‍රැතියේ අපූර්වත්වය තම ප්‍රබන්ධයන්ට සංකල්ප කරගත්තෙකි. ඔහු පබැඳූ ආචාර්ය අමරදේවයන් ගායනා කරන ලද පහත දැක්වෙන ගීතයට ද ''පෙර නිමිති'' ඇසුරු කරගත් ගීතයකි.

ගම ඉස්මත්තේ නරි හූ කීවේ
කබර ගොයා ගේ මිදුලට ආවේ
උදෑසනම හූනෙක් හඬ ලෑවේ
ළිඳ ළඟ ගැහැනුන් කසු කුසු ගෑවේ

මහ රෑ හේනට අලි රැළ ආවේ
**උලමා** ඇටඹේ මර හඬ ලෑවේ
දිය බොන වැව ඊයෙම බොර වූයේ
මොකද කියා මට දැන් සිහිපත් වේ

ආදර ස්නේහයේ අඩුවක් වුණාදෝ
නොදැනී මගෙන් වරදක්වත් වුණාදෝ
ටිකිරාගේ බහටවත් රැවටුණාදෝ
මා හැර දමා මලියා කොහි ගියාදෝ

රොත්තෙන් රොත්ත එන වලි කුකුළු පැටියනේ
නිත්තෙන් පබළු දෙපතුල් රතු කොබෙයියනේ
ඇසල ගහේ මල් අහුලන පරෙයියනේ
මගෙ මලියා දුටු දැයි සියලූ දෙවියනේ
(රත්නායක, 1992)

යථෝක්ත ගීතයට සමාන ප්‍රකට ජන කවිය මෙසේ ය.

ඔත්තු කියයි වැට අයිනේ සිට කැවා
**උලමා** අඬයි ගස උඩ සිට පැල ගාවා
ගල් කපුවෙක් ඇවිත් මොනවාදෝ කීවා
ඒ මදිවටද බල්ලන් උඩු බුරු ලෑවා
(ප්‍රඥාලෝක, 1952)

**උලලේනෝ**

ගීත රචකයන් ද යථෝක්ත විශ්වාසයෙන් විපුල ප්‍රයෝජන ගෙන ඇති බව පෙනේ. මහාචාර්ය සුනිල් ආරියරත්න ජන සාහිත්‍ය සේ ම ජන විශ්වාස ඇදහිලි ස්වකීය නිර්මාණ සඳහා නොමඳව යොදා ගත්තෙකි. වික්ටර් රත්නායක හා සනත් නන්දසිරි ගායක යුග්මය ගයන පහත ගීතය උලලේනා විශ්වාසය හා බැඳුණකි.

**උලලේනෝ උලලේනෝ**

මිලින මලක් මිස පිපුණ මලක් නැත
හේබාවෙන් මළ අතීතයේ
සැහැලි අඳෝනා යාදිනි අසමින්
ඉර හඳ නොරැඳෙයි අතීතයේ

මා හඬ මේ හිස් ගුවනේ පාවී
බොල් පොළවේ සිට ඉහළ නැගී
දෝංකාර දී කළු වැටි අතරේ
යළි මා දෙසවන් වැලඳ ගනී

එරබදු මල්වල බමරිඳු නොසිටි
සිවී රඟ සෙන් මට - නොමැති ලෙසින්
සෙවණැල්ලයි මා තනිකම මැකුවේ
නිහඬව නිරතුරු තුරුලු වෙමින්
(ආරියරත්න, 1996)

ජීවිතය පුරා වසා පැතිරී ගත් පාළු හුදකලා බව ගීතයට නඟන කවියා උචිතාර්ථ ප්‍රතිපාදනය සඳහා මධ්‍යම රාත්‍රියේ දඩි නිහඬතාව මැද වනය දෙවනත් කරමින් මූසල හඬක් නඟන උලමා ගැන සඳහන් කරයි (අල්විස්, 1997). ආසන්නයේ එන විපතක පෙර නිමිත්තක් සේ

ම වැසි සමය ආසන්න බව දැක්වීම ද උලලේනා විලාපයේ පූර්ව නිමිත්තක් ලෙස සමහරු සලකති (චන්දන හිමි, 1992).

යථෝක්ත විශ්වාසය හා බැඳී පවත්නා ගීතයක් ලෙස මර්වින් පෙරේරා ගයන සුනිල් සරත් පෙරේරාගේ මතු දැක්වෙන ගීතය ද හඳුන්වා දීමට පුළුවන.

ගඟ දිය රැළි නළවා - පාරුව පැද යනවා
තොටමුණ දැලේ පළගැටියන්නේ
මළ පොත කියැවෙනවා
නාඩන් **උල ලේනි** නුඹ නාඩන්
දුක බිය වැඩි වෙනවා

උණ වැටි හෙවණේ
ලිය ගොමු අතරේ
ගඟ දිය බැස යනවා
සඳ අඩ නින්දෙන්
අවදිව රහසේ
ගණදුර බිඳලනවා

නින්දේ මුදුනට ඔබ දිව ඇවිදින් සිහින සිනා දෙනවා
ඇල් ගෙවිලිය ගී සීපද රාවය ඈතින් මතු වෙනවා
මිටියාවතකින් මිටියාවතකට - සතුට සොයා එනවා
මේ යන ගමනේ බාධක ගල් පර - කොතෙකුත් හමු වෙනවා
(පෙරේරා, 1985).

දුක් පිරිපතින් අඩුවක් නැති තොටියාගේ දුක්බිය වැඩිවන බැවින් උලලේනියගෙන් නාඩන් ලෙස කරනු ලබන ආයාචනයක් ඉහත ගී ප්‍රබන්ධය තුළින් ගම්‍ය වේ.

**පිලේ පහන නිව්වා මං**

විඳ දරාගත නොහැකි තනිකම ආත්මගත වූවක් සේ සුසුම්ලන කවියා පැලවියේ හීතල හඳට තනි රකින්න පැමිණෙන ලෙස ඉල්ලන අතර, සිත පුරා පිරී ඉතිරී යන දුක කියාගන්නට කිසිවෙකුත් නැති හෙයින් කාගෙත් දුකට හූමිටි තබන උලලේනාට හඬා වැටෙන්න යැයි ආරාධනා කරන මතු ගීතය කුමාරදාස සපුතන්ත්‍රි සාම්ප්‍රදායික

විශ්වාසය, කරුණා රස භාව පෝෂණයෙහි ලා මැනවින් යොදාගත් අවස්ථාවකි. සුනිල් එදිරිසිංහ ගයන යථෝක්ත ගීතය මෙ පරිදි ය.

පිලේ පහන නිව්වා මං ගොම්මං අඳුරේ
තනිකම වරෙන් ඉදිකඩ පැන මං නිදි පැදුරේ

පැල වියේ හීතල හඳ ඇවිත් මගේ තනි රකින්න
දොළේ හඬට උණ පඳුරේ වැනියන් මට බලා ඉන්න
කාගෙත් දුකට හූ මිටි ලන **උලලේනෝ** හඬා යන්න
මගේ තනිය ළඟට වරෙන් තුරුලු වෙලා නිදා ගන්න

කාටත් එකම උණුහුම දෙන ඉර පිපුණේ ඉරිමාවක
මගේ සතුට පැල දොරින් යන්න ගියේ හැන්දෑවක
බොල් ඉපනැලි පුසුඹ ඉහෙයි පිපී සුසුම් මල් යායක
හිතේ දුකට දෑස හඬයි කඳුළු හළා ගංගාවක

(සපුතන්ත්‍රී, 1999).

**කොවුලෙක් මොටද**

මෙම ගීතය 2023 වසරේ සංස්කෘතික අමාත්‍යාංශය මෙහෙය වූ රාජ්‍ය සංගීත සම්මාන උලෙළේ දී වසරේ විශිෂ්ට ගීත පද රචනය ලෙස ඇගයීමට ලක්විය. මෙම ගීතය තුළ ද උලලේනා ප්‍රතීයමාන ය. මෙහි ගායනය සමනලී ෆොන්සේකා, සංගීතය අරුණ ගුණවර්ධන වන අතර, මෙම විශිෂ්ට ප්‍රබන්ධයේ රචකයා වන්නේ සුජීව හෙට්ටිතන්ත්‍රී ය.

කොවුලෙක් මොටද මට මිහිරිම ගී ගයනා
**උලලේනෙක්** වෙයන් ඉඳහිට දුක අහනා

රුවලක් මොට ද සුළඟක් එන තුරු සිටිනා
හබලක් වෙයන් ඔරුවක් වෙරළට ගේනා

නටුවක් මොටද මට ළා සුළඟට සැලෙනා
කටුවක් වෙයන් මල් නටුවක් මුර කරනා

## සමාලෝචනය

අද්‍යතන ලාංකේය ගීතයේ පෝෂණය සඳහා විශ්වාස හා ඇදහිලි යන ජනශ්‍රැතිකාංග ද විවිධාකාරයෙන් සංකල්පගත ව ඇත. සිංහල ගීත සාහිත්‍යය සමස්තයක් ලෙස ගෙන බලන විට ගේය පද රචනයට පිළිපන් රචකයන් අතුරින් ජනශ්‍රැතියෙන් ආභාසය නොල ද එකඳු, ගීත රචකයෙකු හෝ නොමැති තරම් ය. සාහිත්‍යය නිර්මාණයන් විෂයයෙහි නිර්මාපකයාගේ සමාජ සංස්කෘතික පසුබිම බලපායි. නිර්මාණය සේවනය කරන්නවුන්ට එය සමීප අත්දැකීමක් කරගත හැකි වන්නේත් නිර්මාණකරුවාගේ සමාජ සංස්කෘතික පසුබිම හා සහසම්බන්ධතාවක් ඇතොත් පමණි. දීර්ඝ කාලයක් මුළුල්ලේ ජන සමාජයක් සතු සංස්කෘතිය වැඩෙමින්, සුරැකෙමින් පැවත එන්නේ ජනශ්‍රැතිය මගින් ය. ඒ අනුව සංස්කෘතිය ගැබ් වී ඇත්තේ ජනශ්‍රැතිකාංග තුළ ය. ජන සමාජයක සංස්කෘතික ගති ලක්ෂණ කවරේදැයි දැන හඳුනා ගැනීමට අධ්‍යයනය කළ යුත්තේ ජනශ්‍රැතිය යි. ජන කතාව, ජන කවිය, ජන විශ්වාස හා ඇදහිලි, අභිචාර විධි, අධි විශ්වාස, චාරිත්‍ර වාරිත්‍ර, යාතු කර්ම, වෘක්ෂශ්‍රැති, සත්ත්වශ්‍රැති, ප්‍රස්තාව පිරුළු, තේරවිලි, ජන වෙදකම, ජන ක්‍රීඩා, ජන බස හා ජන සන්නිවේදන ක්‍රම ආදී වූ විවිධාකාර අංග ජනශ්‍රැතිය හා බැඳී පවතී. ඒවා ජනශ්‍රැතියේ විවිධ අංගෝපාංග ය. මෙහිදී ගම්‍ය වන කරුණක් වනුයේ නිරායාසයෙන් ම ඔවුන්ගේ නිර්මාණ විෂයයෙහි ජන සාහිත්‍යයේ ආලෝකය වැටී ඇති බව යි. ඊට හේතුව කාලාන්තරයක් තිස්සේ ලාංකේය සංස්කෘතිය විසින් යථෝක්ත ජනශ්‍රැති දැනුම් සම්භාරය ඔවුන්ගේ උපවිඥානයේ තැන්පත් කොට තිබීම යි. ගීතය රසික ජන ප්‍රසාදයට පාත්‍රවීම කෙරෙහි ද ජනශ්‍රැතිය නිතැතින් ම බලපා තිබේ. ජන හදට වඩාත් සමීප ගීත නිර්මාණ බහුතරයක ශ්‍රැති සාහිත්‍යයේ ආභාසය පවතී. විවිධ අනුභූතීන් ස්පර්ශ කොට වින්දන මාධ්‍යයක් ලෙස ගීතය යොදාගනිමින් ඒ ඔස්සේ සහෘද ජන පර්ෂද කරා හෘදය සංවේදී වූත්, සුසියුම් වූත්, ආනන්දනීය වූත් ප්‍රඥා සංදේශයක් ප්‍රවාහනය කිරීම සඳහා ජනශ්‍රැතියේ මෙම අස්පර්ශනීය සංස්කෘතික උරුමයන්, සාම්ප්‍රදායික ප්‍රකාශන ලෙස අගය කළ යුතු සහ සංරක්ෂණය කළ යුතු සංස්කෘතික දේපළකි.

## ආශ්‍රේය මූලාශ්‍ර

අල්විස්, පී. (1997), ලක්බිමේ තවත් යුගයක්, කතෘ ප්‍රකාශන

අස්සජි හිමි (,(1998)) ජනකවිය දෙවියෝ සහ යක්ෂයෝ, එස් ගොඩගේ සහ සහෝදරයෝ

ආරියරත්න, එස්. (1997), අරුන්දතී ගී පද මාලා, එස්.ගොඩගේ සහ සහෝදරයෝ

ආරියරත්න, එස්. (1999), ලාහිරු දහසක්, එස්.ගොඩගේ සහ සහෝදරයෝ
ගමගේ, එන්, ජේ. (2002), ජනකවියේ සාහිත්‍යමය අගය, එස්.ගොඩගේ සහ සහෝදරයෝ

ගුණවර්ධන, ඩබ්ලිව්.එෆ්, (1996), වාක්‍ය සහිත මයූර සංදේශය, කතෘ ප්‍රකාශන

චන්දන හිමි, ඕ. (1990) නුවර කලාවියේ ජන කවි, ශිල්පානන්ද මුද්‍රණාලය

චන්දන හිමි, ඕ. (1992) නුවර කලාවියේ නිමිති, පෙතිකඩ ප්‍රකාශන භාරය

චන්දන හිමි, ඕ. (1994) වෙරළ ධීවර ජන කවි නිර්මාණ හා විමර්ශන, පෙතිකඩ ප්‍රකාශන භාරය

තිලකරත්න, එම්.පී, (1971), ජන කවිය හා සිංහල සංස්කෘතික ලක්ෂණ, කොහුවල, දීපානී ප්‍රකාශකයෝ

ප්‍රේමසිරි, එස්, (2019), ජනශ්‍රැති විද්‍යා පර්යේෂණ : න්‍යායික හා ප්‍රායෝගික, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ

පෙරේරා, එස්. එස්. (1985), පද්ම තටාකය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

පෙරේරා, එස්. එස්. (1995), මහ කන්ද, දයාවංශ ජයකොඩි සහ සමාගම

රත්නපාල (1995) , ජනශ්‍රැති විද්‍යාව , ගොඩගේ සහ සමාගම

විජේපාල, ජේ. (1967), සුදු වද්දා, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

සපුත්‍රන්ත්‍රි, කේ. (1999), මලින් මලට, කතෘ ප්‍රකාශන

සිල්වා, කේ.එච්. (1981), ගැමි ගී, කතෘ ප්‍රකාශන

සෙනෙවිරත්න, ආර්. (1998),හිතේ දුකට කියන කවි, නුගේගොඩ, සී/ස සරසවි ප්‍රකාශකයෝ

සිරිසේන, කොත්මලේ, (2011), සිංහල ජනකවි, නුගේගොඩ, සී/ස සරසවි ප්‍රකාශකයෝ.

බණ්ඩාර,(2022), ලබා ගත්තේ
https://youtu.be/WQtBH4BJDBQ?si=XHczGafrcKdP9Qo8

ඉංග්‍රීසි

Brunwandt, C. (1978), American folklore, Glone pequor

Bereans, D. (1937), The study of American folklore, www.norton.co.

Wilson, N.C. (1996), Theory and History of folklore, university of califonia

Tolken, B.K. (1979), Mexican Tales, CVLTVRA

Mathewson, R.H., (1962), Guidance Policy and Practice, Harper & Row, Publishers


**සම්මුඛ සාකච්ඡා**


මහින්ද කුමාර දළුපොත (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ), 2024.05.31, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී කරන ලද සම්මුඛ සාකච්ඡාව

සමන් කුමාරතුංග (මහාචාර්ය, පීඨාධිපති), 2024.05.31, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී කරන ලද සම්මුඛ සාකච්ඡාව

# මාධ්‍ය අවබෝධය පිළිබඳ පුරෝගාමී කෘතිය
# Understanding Media

**සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර**



හර්බට් මාර්ෂල් මැක්ලූහන් (Herbet Marshel Mcluhan) නම් වූ කැනේඩියානු විද්වතානන් (1911-1980) විසින් ලියන ලදුව ප්‍රථම වරට 1964දී එළි දක්වන ලද කෘතිය වන්නේ 'Understanding Media' යන්නයි. ඊටම ඇදුණු පරිවාර වැකියක් ද යොදා ඇත. එය The Extension of Man යන්නය. එය සරලාර්ථයෙන් මානව දැක්ම පුළුල් වීම යන්න යි.

මේ කෘතිය පුරෝගාමී සන්නිවේදන ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයක් ලෙස සලකනු ලැබුවද මුඛ්‍ය තේමාව ලෙස සලකන්නේ මානවයා මාධ්‍යය සැලසුම් කිරීමත් සමග ම ඔහුගේ ජීවන සංස්කෘතිය ද කෙමෙන් වෙනස් වූ බව විවරණය කර දැක්වීම යි. එබැවින් මෙහි එන ප්‍රධාන පෙළේ ලේඛන ලෙස සැලකිය හැක්කේ The Making of Typography හෙවත් 'අක්ෂර විද්‍යාවට ප්‍රවේශවීම' හා The Medium is the Message හෙවත් 'මාධ්‍යය ම සංදේශය' යන ලේඛන දෙක යි. කැනේඩියානු ජාතිකයකු ලෙස ප්‍රසිද්ධ වුව ද මැක්ලූහන් විද්වතා එංගලන්තයට පැමිණ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කටයුතුවලට සහභාගි වූයේ සාහිත්‍ය හා සංස්කෘතිය පිළිබඳව ය. එබැවින් මැක්ලූහන් ලැබූ ඒ අධ්‍යයන පරිචය මෙහි අන්තර්ගත සෑම සන්නිවේදන ලේඛනයක ම දිස්වනු පෙනේ. විශේෂයෙන් ඒ නිපුණත්වය ලේඛන දෙකකින් ප්‍රකට කෙරේ. එහිදී මුල් වන්නේ Mechanical Bride: Folklore & Industrial Man 'ජනශ්‍රැතිය සහ කාර්මික මිනිසා සහ මාධ්‍ය සංදේශය' යන ලේඛනයි. මැක්ලූහන්

මාධ්‍ය අධ්‍යයනය සහ අවබෝධය පිළිබඳ දැක්වීම සඳහා මධ්‍යකාලීන රංගධරයකු වූ විලියම් ශේක්ස්පියර් හා ග්‍රීක රංගධරයකු වූ ඊස්කිලස්ගේ කෘතිවල උද්ධෘත නිදර්ශන ලෙස සලකයි. එසේම ඇමරිකානු කවියකු වූ වෝල්ට් විට්මන්ගේ Leaves of Grass කෘතියේ කාව්‍ය ඛණ්ඩ ගෙනහැර දක්වයි. මෙලෙස 'මාධ්‍ය අවබෝධය' හා 'වෙනස්වන මානවයා' තම මුඛ්‍ය තේමාව ලෙස ගෙනහැර දක්වයි. මේ දැක්ම ඔහු හඳුන්වන්නේ 'Understanding Media and it's changing aspects of the human being' යනුවෙනි. මේ කෘතියේ අන්තර්ගත වන ප්‍රධාන පෙළේ ලේඛනය කෙතරම් සාකච්ඡාවට භාජනය වී ද යත් 1967 දී වෙන ම පුස්ථිකාවක් ලෙස ප්‍රකාශයට පත් විය. 'Inventory of Effects' යන උපමැය විය. Understanding Media (මාධ්‍ය අවබෝධය) නම් වූ කෘතිය ප්‍රථම වරට 1964 දී පළ වූ විට එහි එන සෑම ලේඛනයක් ම සම්මතවාදී විෂය ධාරා කෙරෙහි විධිමත් අභියෝගයක් වූ බව පෙන්නුම් කර දී ඇත. මාධ්‍ය මගින් මානව චින්තනය කෙමෙන් වෙනස් වීමට එහි එන සන්දේශය හේතුකාරක වන බව තත් විෂයයන් ඉගැන් වූ ගුරුවරුන්ට දැනෙන්නට විය. සමාජය හා සංස්කෘතිය (Society & Culture) උගන්වමින් සිටි ආචාර්යවරුන්ට දැනෙන්නට වූයේ මාර්ෂල් මැක්ලූහන්ගේ කෘතිය එම චින්තනය නව මඟකට හැරවීමට වෑයම් කරන බවකි. මානවයා එම මාධ්‍ය ගවේෂණයේ දී උපයෝගී කොට ගන්නා සන්නිවේදන තාක්ෂණය නොදැනුවත් ව සිදුවන එහෙත් කෙමෙන මානව පැවැත්ම (Human Existence) වෙනස් කිරීමට තුඩුදෙන ප්‍රධාන සාධකයකි.

මේ කෘතියේ දිස්වන ලේඛනවල විවිධත්වයක් ඇතත් එම විවිධත්වයට ඒකීයත්වයක් ඇති බව (A Unity of Diversity) පාඨක අපට පෙනී යයි. ඒ වග හඳුනා ගැනීමට මෙහි එන ප්‍රධාන ලේඛනය වන ''මාධ්‍යය සංදේශය' (The Medium is the Message) ප්‍රමාණවත් ය. මේ කෘතියේ එන වඩාත් ම අවධානය යොමු වූ ලේඛනය ලෙස හැඳින්වෙන්නේ මෙය යි. මැක්ලූහන්ගේ Understanding Media (මාධ්‍ය අවබෝධය) නමැති මේ කෘතිය විකල්ප සන්නිවේදන චින්තන හා නිරීක්ෂණ (Alternative Communication Thought and Observation) තිස්තුනකින් (33) සමන්විත හස්තසාර සංග්‍රහයකි. මේ ලිපි සංග්‍රහය කොටස් දෙකකට ප්‍රභේද කොට දැක්වේ. අතිශයින් දිගු ලේඛනය අයත් වන්නේ පළමු කොටසටයි. ඉන් අනතුරුව Media Hot and Cold යනුවෙන් ගෙනහැර දක්වන ලේඛනය ප්‍රථම වතාවට

Hot (උණුසුම්) සහ Cold (සීතල) යනුවෙන් හැඳින්වෙන්නේ ක්ෂණික, සමීපස්ථ හා දුරස්ථ යන අර්ථ දක්වමිනි. තරමක් පැටලිලි සහිත වුවද ඉන් ගම්‍ය කෙරෙන්නේ තාක්ෂණික විද්‍යාවට අනුකූලව මාධ්‍යය ක්‍රියාත්මක වීම හා සම්බන්ධ රීතීන් සමුදායකි. ඊටම බද්ධ වූ ලේඛනයක් වශයෙන් ගත හැක්කේ Reversal of the Overheated Medium යනුවෙන් සිරස්තලයෙන් යුක්ත වූ ලේඛනයයි. මේ ලේඛනයේ overheated යනුවෙන් හැඳින්වෙන්නේ කිසියම් මාධ්‍යයක් ප්‍රබල ලෙස හෙවත් උණුසුම් ලෙස සිය ග්‍රාහකයා කෙරෙහි ඇති කරන බලපෑමයි. එය විටෙක ස්වභාවිකත්වය ඉක්ම ව කෘතිම බලපෑමක් ලෙස මැක්ලූහන් හුවා දක්වයි. ග්‍රීක පුරාවෘත්තයක් වන නාසිසස් (Narcissus) කතාව ගෙන හැර දක්වමින් තම මුහුණ දකින නාසිසස් නමැති තරුණයා කෙතරම් උදම් වන්නේ ද කිවහොත් එමඟින් ම අසංවේදිතාවකට (Narcosis) පත්වන අයුරු මාධ්‍ය ලෝකයට ද පොදු වූ දැක්මක් ලෙස ගෙනහැර පෑම The Gadget Lover Narcissus as Narcosis යන ගවේෂණාත්මක ලේඛනයේ විෂය බවට පත්වෙයි. ඊට ම බද්ධ වූ ලේඛනයක් ඊළඟට හමුවෙයි. එය නම්කර ඇත්තේ *Hybrid Energy Les Liasons Dangereuses* යනුවෙනි. මේ ලේඛනයේ මුඛ්‍යාර්ථය වන්නේ කලවම් වූ හෙවත් දෙමුහුන් බවට පත් වූ (Hybrid) ශක්තීන් මාධ්‍යයකට අන්තර්ගත වුවහොත් විටෙක උද්ගත විය හැකි 'අනතුරුදායක' *Dangereuses* නමින් ප්‍රංශ බසින් පෙන්නුම් කරන ආකාරයයි. භාවිතයට අනුකූලව ඇතැම් විටෙක කිසියම් මාධ්‍යයක් සිය ග්‍රාහක ක්ෂේත්‍රය වෙත කිසියම් අනර්ථයක් ඇති කරවිය හැකි බවයි ඉන් ගම්‍ය කෙරෙන්නේ.

ප්‍රථම කොටසට අයත් වන ලේඛන හත අවසන් වන්නේ මෙකී ලේඛනයට ම සමීප සම්බන්ධයක් දක්වන පසුතල බලපෑම් (Effects) යනුවෙන් පුළුල් අර්ථකථනයක් දුන් විධිමත් ලෙස ලේඛනගත කරන ලද සටහන් දෙකකිනි. ඉන් හත්වෙනි ලේඛනය නම් කර ඇත්තේ මාධ්‍ය පලවිපාක දෙන නිර්මාණශීලීත්වයෙන් යුතු මාධ්‍ය භාවිතය යන අර්ථ සම්පාදනය කෙරෙහි Challenges and Collapses: The Nemesis of Creativity යනුවෙනි. මෙය සන්නිවේදන අධ්‍යයනයේ පුරෝගාමී ලේඛනයක් වශයෙන් සැලකිය හැකිය. එම අපූරු සටහන් පෙළ අනුව මානවයා තමන් විසින් ම උත්පාදනය කර ගනු ලැබූ මාධ්‍ය ලෝකයට තමන්ගේ නිර්මාණශීලීත්වය (Creativity) උපයෝගී කරගනිමින් අත්පත් කරගන්නා පලවිපාකවල ස්වභාවය පෙන්නුම් කරන පුරෝගාමී සටහන් ලෙස අවධානය යොමුවිය යුතුය. පසු කල

ජනප්‍රිය සංස්කෘතිකවේදියෙකු (Popular Culture) යනුවෙන් හඳුන්වා දෙන ලද සන්නිවේදන සංකල්පය ප්‍රභවය ලද්දේ මේ පුරෝගාමී සංකල්පයෙන් ම බව පාඨකයාට වටහාගත හැකිය. එහි පවතින අභියෝග (Challenges) හා අනතුරු ඇඟවීම් (Collapses) මැක්ලුහන්ගේ අධ්‍යයනයට ලක්වේ.

මානව සංස්කෘතිය සතු වාග් විලාසයන් කෙමෙන් මාධ්‍ය අන්තර්ගත සංදේශකයන් බවට පත්වීම හා එහි විධිමත් හා අවිධිමත් බව පෙන්නුම් කෙරෙන පුරෝගාමී ලිපි හතරක් දෙවැනි කොටසට අයත් වේ. එනම් 01. The Spoken Word: Lower of Evil 02. The Written Word n Eye or an Ear. 03. Roads and Paper Routes. 04. Number Profile of the Crowd.

කාලයාගේ ඇවෑමෙන් මාධ්‍ය ලෝකය තුළ වාග් සන්නිවේදනයන් අතර පැවැති විවිධ සංකලනයන් හා හේතුඵල අවබෝධ කරගැනීමට මේ ලේඛන ඵලදායක වන බව සමීප ලෙස වටහාගත හැකිය. පසුකාලීන ව සන්නිවේදන අධ්‍යයනය හා මාධ්‍ය අවබෝධය යන විෂය ධාරාවට වපසරිය වූ පර්යේෂණ රැසකට යට කී ලේඛන මගින් මතු කරන ලද දර්ශනය පසුබිම් වූ බව දැක ගත හැකි ය. මේ සම්බන්ධ ප්‍රධාන පෙළේ එක් කෘතියක් වශයෙන් සැලකිය හැක්කේ ලෙස්ටර් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජේම්ස් ඩී. හැලෝරා (James D. Halloran) විසින් සංගෘහිත රූපවාහිනියේ බලපෑම් (The Effects of Television) නමැති කෘතියයි. මේ කෘතිය මගින් විෂද කරන ලද්දේ විශේෂයෙන් දරුවන් කෙරෙහි රූපවාහිනී අන්තර්ගතය හා සන්නිවේදන විධික්‍රම විජ්ජාකාරී ලෙසත් මායාමය ලෙසත් (Magical & Fantastic Effect) බලපෑමයි. මැක්ලූහන් විසින් ලියන ලද Comics Mad Vestlute to TV නමින් හඳුන්වන ලද Vestlute නමින් සඳහන් කරන්නේ 'ද්වාරය' හෙවත් දොරටුව යන්නයි. කොමික්ස් (Comics) යනුවෙන් හඳුන්වනු ලැබුවේ පනස්ගණන් වන විට දී බාල මහලු වෙනසක් නොමැතිව පරිහරණය කරනු ලැබූ චිත්‍රකතාවලට අපර නාමයකි. ඇතැමුන් චිත්‍රකතා භාවිතයට ගත්තේ උන්මාදනීය (Mad) විලාසයකිනි. එහෙත් මේ උන්මාදනීය විලාසය කෙමෙන් විකල්ප භාවිතයක් බවට පත් වූයේ මැක්ලූහන්ගේ මතයට අනුව රූපවාහිනිය සිනමාට සමාන්තරව ඇරඹීමත් සමගය. ඒ හා සමග ම එහෙත් ප්‍රබල ව පැවති මුද්‍රිත අක්ෂරය (Printed Letter) මගින් පණ ගැන්වී තිබූ මුද්‍රිත වදන (Printed Word) කෙමෙන් ප්‍රබලත්වය

වෙනස් මඟකට යොමු කෙරිණි. මේ ක්‍රියාදාමය පිළිබඳ සෙවිල්ල මැනවින් දක්වන්නේ The Printed Word: Architect of Nationalism නමැති ලේඛනය මගිනි. මෙහිලා Nationalism යන්න ස්වදේශිකත්වය වශයෙන් සැලකිය හැකිය. මුද්‍රිත අක්ෂරය පණ ගන්වන ලද මුද්‍රිත වදන හේතුවෙන් බිහි වූ පුවත්පත් කලාව (Journalism) හා පොත් ප්‍රකාශනය (Book Production) හේතුවෙන් මානව සමාජයේ චින්තනය වෙනස් වූ අයුරු මැක්ලූහන් මැනවින් පෙන්නුම් කරයි.

එබැවින් මේ පොත් මෙතාක් සඳහන් කරන ලද මාතෘකාවලින් හඳුන්වා දෙන ලද ලේඛනවලින් ඉස්මතු වන්නේ මැක්ලූහන්වාදයක් (Mcluhanism) බව මහාචාර්ය හැලොරාන් බඳු ආචාර්යවරු පෙන්නුම් කරති. මේ කෘතියේ එන වඩාත් වැදගත් වූ ලේඛන වශයෙන් පෙන්නුම් කළ හැක්කේ විසිතුන්වන ලේඛනය වන දැන්වීම් කලාවෙන් (Advertising) වූ කැළඹිල්ල එකකි. තවෙකක් නම් විද්‍යුත් සංදේශ ක්‍රමය හෙවත් Telegraph මගින් සිදු වූ සමාජ විපර්යාසයයි. මේ විෂය පිළිබඳ ඉගැන් වූ මැක්ලූහන් නිරීක්ෂණය අන්තර්ගත මේ ලේඛනය හඳුන්වා ඇත්තේ Telegraph: The Social Homane (හෝමෝනය) යන ජීව විද්‍යාවේ හා සත්ව විද්‍යාවේ අන්තර්ගත ප්‍රාණය හා සම්බන්ධ ජීවානු හැඳින්වීමකි. ඒ හා සමග නව මාධ්‍ය දෙකක් වන ටයිප් රයිටරය හෙවත් යතුරු ලේඛනය (Typewriter) සහ දුරකථනය හෙවත් (Telephone) භාවිතයට ඒමෙන් පසුව පුළුල් වූ සංදේශ විකාශනය ගැන ද පුරෝගාමී අදහස් රැසක් ඉස්මතු කොට පෙන්නුම් කෙරේ. මෙහි ම දිගුවක් ලෙස පෙන්නුම් කරන්නේ ගුවන්විදුලි මාධ්‍ය කෙමෙන් පුළුල් වීම ය. මීට අන්තර්ගත විෂය ධාරාව ශබ්දයේ දිගු වීම (Extension of Sound) යනුවෙන් හඳුන්වාදීම හැරුණු කොට ඒ දිගුවට මානව ආදිකල්පිත බෙර වාදනයෙන් යම් යම් දේ ප්‍රකාශ කිරීම හඟවන භේරී නාදයන් (Drum Beat) යනුවෙන් පැහැදිලි කෙරේ. මෙය විකාශනය මානව අවබෝධය පුළුල් කිරීමට සමත් වූ අයුරු විවරණය කෙරෙන්නේ Radio the Tribal Drum (ගුවන් විදුලිය: ගෝත්‍රික බෙරේ) යනුවෙනි. ඉන් පසුව ආ රූපවාහිනිය (Television) තුලනාත්මක වශයෙන් බලන කල තිස්එක්වන ලේඛනයේ සඳහන් පරිදි මොළොක් යෝධයෙකි. (Television the Timid Giant) ලෙසින් පෙන්නුම් කෙරේ.

1960 ගණන්වල දී ලෝක සේවය මගින් බීබීසී ව්‍යාප්ත කිරීමට වෑයම් කිරීමේ දී මේ මැක්ලූහන්වාදී යෙදුම් දෙක වන Tribal Drum (ගෝත්‍රික බෙරය) සහ The Timid Giant (මොළොක් යෝධයා) යන යෙදුම් පරිහරණය කළ අයුරු මට මතකය. මේ යෙදුම් දෙක මෙන් ම අන්‍ය මැක්ලූහන්වාදී යෙදුම් රැසක් හමුවන්නේ මාධ්‍ය අවබෝධය (Understanding Media) නම් වූ කෘතියේ එන නිරීක්ෂණ හා සමීක්ෂණ සටහන් මගිනි. මෙලෙසින් ම තාක්ෂණවේදය (Technology) පිළිබඳ විධිමත් ලෙස සටහනක් දැකගත හැකි වන්නේ මේ කෘතිය මගිනි. මේ කෘතියේ අවසන් ලේඛනය වන 'Automation: Leaning a Living' මගිනි. මෙහිලා Technology යන්න වෙනුවට කලක් මුළුල්ලේ භාවිත වෙමින් පැවතියේ Automation යන යෙදුමයි. සමස්තයක් වශයෙන් ගත්විට මාධ්‍ය අවබෝධය සඳහා මේ කෘතියෙන් ලද හැකි දැනුම අපරිමිත යැයි කිව හැකිය. ඉංග්‍රීසි බසින් ලියැවී ඇති මේ පුරෝගාමී සන්නිවේදන හා මාධ්‍ය අවබෝධය, සංඥා දැක්වෙන මේ කෘතිය සම්පූර්ණ වශයෙන් භාෂා රැසකට පරිවර්තනය හා අනුවර්තන වශයෙන් ප්‍රතිරචනය වී පවතී.

## පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශය මගින් අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන **''සන්නිවේදන"** සමයුරු ප්‍රතිනිරීක්ෂණ ශාස්ත්‍රිය සංග්‍රහය සඳහා සන්නිවේදනය විෂය ක්ෂේත්‍රයට අදාළව ඔබගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට ආරාධනා.

**ආකෘතිය**

| | | | |
|---|---|---|---|
| 1 | **පර්යේෂණ පත්‍රිකාවේ මාතෘකාව** | පර්යේෂණ පත්‍රිකාවේ මාතෘකාව | 14-point, Bold |
| | | කර්තෘ /කතුවරුන්ගේ නම් | 12-point |
| | | ආයතනය | 11-point |
| | | ඊමේල් ලිපිනය | 11-point |
| | | දුරකථන අංකය | 11-point |
| | | (*FM Abhaya / Times new Roman/ පේලි අතර පරතරය 1.5)* | |
| 2 | **සංක්ෂේපය** | පර්යේෂණ සංක්ෂේපය තුළ පර්යේෂණ කාර්යයට අදාළ ප්‍රමාණවත් සංක්ෂිප්තයක් ඇතුළත් විය යුතුය.<br>උපරිම වචන සීමාව වචන 250 නොවැඩි සංක්ෂේපයක් ඉදිරිපත් කළ යුතු වේ.<br>එහිදී පර්යේෂණ කාර්යය පිළිබඳව හැඳින්වීම, ක්‍රමවේදය, පර්යේෂණ ප්‍රතිපල සහ සාකච්ඡාව යන කොටස් ඇතුළත් විය යුතුය. | 12-point |

| | | | |
|---|---|---|---|
| | | **මුඛ්‍ය පද** - මුඛ්‍ය පද 3-5 අතර සඳහන් විය යුතු අතර අකාරාදී පිළිවෙළට එය පෙළගැස්විය යුතුය. (සිංහල භාෂාවෙන් ඇතුළත් සංක්ෂේපයට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් රචිත සංක්ෂේපයක් ද ඇතුළත් කළ යුතුය) | |
| 3 | **පර්යේෂණ පත්‍රිකාව** | • පර්යේෂණ හැඳින්වීම<br>• සාහිත්‍ය විමර්ශනය<br>• පර්යේෂණ ක්‍රමවේදය<br>• දත්ත විශ්ලේෂණය සහ සාකච්ඡාව<br>• නිගමනය<br>යන ප්‍රධාන කොටස් මෙම පර්යේෂණ පත්‍රිකාවට ඇතුළත් විය යුතුය.<br>පර්යේෂණ පත්‍රයේ වචන සීමාව වචන 3000- 5000 අතර විය යුතුය. (සංක්ෂේපය ද මෙම වචන සීමාවට ඇතුළත් වේ.) | 12-point |
| 4 | **උපුටා දැක්වීම් සහ ආශ්‍රේය ග්‍රන්ථ නාමාවලිය** | APA ක්‍රමයට අදාළව සඳහන් කළ යුතුය. | |
| 5 | **වෙනත්** | පිටුවේ ප්‍රමාණය<br>පිටු ගණන | A4 paper<br>පිටු 10 |
| 6 | **පර්යේෂණ පත්‍රිකා භාරගැනීම සහ ඒ පිළිබඳව** | ඔබ විසින් ලබා දෙන පර්යේෂණ පත්‍රිකා ද්විත්ව සමාලෝචන ක්‍රියාවලියකට යොමුවන අතර එහිදී ලැබෙන ශ්‍රේණිගත කිරීමට අනුව ලිපිය භාරගන්නේද නැතිද යන වග පත්‍රිකාවේ මුල් කතුවරයාට දැනුම් දෙනු ලැබේ. | |

| | | |
|---|---|---|
| | **දැනුම් දීම** | |
| 7 | **ප්‍රකාශනය** | අධ්‍යයන අංශය මගින් අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ''**සන්නිවේදන**'' ශාස්ත්‍රිය සංග්‍රහයට තෝරාගත් ලිපි ඇතුළත් කරන අතර එය විද්‍යුත් සහ මුද්‍රිත ආකාරයෙන් ප්‍රකාශයට පත් කරනු ලබයි. |

පර්යේෂණ පත්‍රිකාවේ මෘදු පිටපතක් (word) පහත සඳහන් email ලිපිනය වෙත ලබා දිය යුතුය.

E mail- masscommunication@kln.ac.lk

# සන්නිවේදන

සමයුරු ප්‍රතිනිරීක්ෂණ ශාස්ත්‍රීය සංග්‍රහය

පළමු වෙළුම | පළමු ප්‍රකාශනය | 2024 ජූලි

## අන්තර්ගත ලිපි

1 - 26 හින්දු ධාර්මික ඉගැන්වීම් සන්නිවේදනයෙහි ලා රාම්ලීලා ජන නාටකයේ ශක්‍යතාව
ආචාර්ය අමිලා දමයන්ති

27 - 45 ශ්‍රී ලංකාවේ Z පරම්පරාවේ ඩිජිටල් කියවීමේ හැසිරීම : ජ්‍යෙෂ්ඨ ද්විතීය පාසල් සිසුන්ට විශේෂිතව
ආචාර්ය කුමේෂ් ප්‍රභාෂිණී ගමගේ

46 - 65 ශ්‍රී ලාංකේය පුවත්පත් කර්මාන්තය තුළ "දත්ත ජනමාධ්‍යවේදය" භාවිතයේ ගැටලු
එච්. එම්. ඩී. මලින්ද

66 - 88 ජනශ්‍රැතියෙන් ප්‍රභාවත් වූ නිර්මාණාත්මක සන්නිවේදන ශික්ෂානන්දය (උලලේනා කේන්ද්‍රීය නිමිති, ජනකවි හා ඒ ආශ්‍රිත ගීත නිර්මාණ ඇසුරෙන්)
ආචාර්ය විමල්සිරි මුණසිංහ

89 - 94 ග්‍රන්ථ විමර්ශනය
මාධ්‍ය අවබෝධය පිළිබඳ පුරෝගාමී කෘතිය ''Understanding Media''
සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

ISSN 3084-8253

9 773084 825005

**මිල රු : 750/=**

**ප්‍රකාශනය**

**ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**